

සිංහල සන්න සහිත

# සප්තසූර්යෝද්ගමන සූත්‍රය

සිංහල සන්න සහිත

# සප්ත සූර්‍ය්‍යොද්ගමන සූත්‍රය.

මීට අයිති

ලොක විනාසය.

සහ

# ලොකොත්පත්ති කථාව.

ආර් ඇස්. සිල්වා.

ඩී. සී. සිල්වා.

ඇම්. ඇස්. පෙරේරා.

යන අප විසින්.

ශාස්ත්‍රාධාර මුද්‍රායන්ත්‍රාලයෙහි මුද්‍රාඞ්කණය

කරවණ ලදී.

—00—

1885.

# නමොතස්ස භගවතො

අරහතො සම්මාසම්බුද්ධස්ස.

ඒවම්මෙසුතං එකංසමයං භගවා වෙසාලියං විහරති අම්බපාලිව
නෙ——තත්‍රඛොභගවාභික්ඛූ ආමන්තෙසිභික්ඛවොති භදන්තෙති
තෙභික්ඛූභගවතො පච්චස්සොසුංභගවා එතදවොච——අනිච්චාභි
ක්ඛවෙ සංඛාරා අද්ධුවාභික්ඛවෙසංඛාරාඅනස්සාසිකා භික්ඛවෙසංඛා
රායාවඤ්චිදංභික්ඛවෙ අලමෙවසබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලංවිරජ්ජි
තුං අලංවිමුච්චිතුං——සිනෙරුපබ්බතරාජා භික්ඛවෙ ආයාමෙන ච
තුරාසීති යොජනසහස්සානි විත්ථාරෙන චතුරාසීති යොජනසහස්සා
නිමහාසමුද්දෙ—අජ්ඣොගාල්හො චතුරාසීති යොජනසහස්සානි ම
හාසමුද්දෙ අච්චුග්ගතො චතුරාසීති යොජනසහස්සානි—හොතිඛො
සො භික්ඛවෙ සමයොයං කදාචිකරහචි බහූනිවස්සසතානි බහූනිව
ස්සසහස්සානි බහූනිවස්සසතසහස්සානි දෙවොනවස්සති දෙවෙඛො
පනභික්ඛවෙ අවස්සන්තෙනයෙකෙචි බීජගාමභූතගාමා ඔසධිවනස්
පතයොතෙඋස්සුස්සන්ති විස්සුස්සන්ති නභවන්ති එවං අනිච්චාභික්ඛ
වෙ සංඛාරා එවං අද්ධුවාභික්ඛවෙසංඛාරාඑවං අනස්සාසිකාභික්ඛවෙ
සංඛාරායාවඤ්චිදං භික්ඛවෙ අලමෙවසබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං
විරජ්ජිතුං අලංවිමුච්චිතුං—හොතිඛොසොභික්ඛවෙ සමයොයංකදාචි
කරහචි දීඝස්සඅද්ධුනො අච්චයෙන දුතියොසූරියො පාතුභවති දුති
යස්ස භික්ඛවෙ සූරියස්සපාතුභාවා යාතා කුන්නදියො කුසොබ්භාතා
උස්සුස්සන්ති විස්සුස්සන්ති නභවන්ති එවං අනිච්චාභික්ඛවෙ සංඛාරා
එවං අද්ධුවා භික්ඛවෙ සංඛාරා එවං අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා
යාවඤ්චිදං භික්ඛවෙ අලමෙවසබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලංවිර
ජ්ජිතුං අලංවිමුච්චිතුං——හොතිඛො සො භික්ඛවෙ සමයොයංකදා
චිකරහචි දීඝස්සඅද්ධුනො අච්චයෙන තතියොසූරියො පාතුභවති
තතියස්සභික්ඛවෙසූරියස්ස පාතුභාවා යාකාචිමහානදියො සෙය්‍යථී
දං ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී තා උස්සුස්සන්ති විස්සුස්සන්ති
නභවන්ති එවං අනිච්චාභික්ඛවෙසංඛාරා එවං අද්ධුවාභික්ඛවෙ සංඛා
රා එවං අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙ
වසබ්බසංඛාරෙසුනිබ්බින්දිතුං අලංවිරජ්ජිතුං අලංවිමුච්චිතුං——හො
තිඛො සො භික්ඛවෙ සමයොයං කදාචිකරහචි දීඝස්සඅද්ධුනො අ
ච්චයෙන චතුත්ථොසූරියො පාතුභවති චතුත්ථස්සභික්ඛවෙ සූරියස්ස
පාතුභාවායෙතෙමහාසරායතො ඉමා නිම්හානදියො සම්භවන්තිසෙ
ය්‍යථීදං ගඞ්ගා යමුනා අචිරවති සරභූමහීතා උස්සුස්සන්ති විස්සුස්ස
න්තිනභවන්ති එවං අනිච්චාභික්ඛවෙසංඛාරා එවං අද්ධුවාභික්ඛවෙ
සංඛාරා එවං අනස්සාසිකාභික්ඛවෙ සංඛාරායාවඤ්චිදං භික්ඛවෙ අල
මෙවසබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලංවිරජ්ජිතුං අලංවිමුච්චිතුං.

හොතිඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධු
නො අච්චයෙන පඤ්චමො සූරියො පාතුභවති පඤ්චමස්ස භික්ඛවෙ සූ
රියස්ස පාතුභාවා යොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡ
න්ති ද්වියොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති ති යො
ජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති චතුයොජනසති
කානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති පඤ්චයොජනසතිකානිපි
හාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති ඡයොජනසතිකානිපි මහාසමුද්දෙ
උදකානි ඔගච්ඡන්ති සත්තයොජනසතිකානිපි මහාසමුද්දෙ උදකා
නි ඔගච්ඡන්ති, අට්ඨයොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්
ඡන්ති නවයොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති ස
හස්සයොජනිකානිපි මහසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති දසසහස්ස
යොජනිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති වීසතිසහස්ස
යොජනිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති තිංසතිසහස්සයො
ජනිකානිපි චත්තාලීසසහස්ස යොජනිකානිපි පඤ්ඤාසසහස්ස යො
ජනිකානිපි සට්ඨිසහස්සයොජනිකානිපි සත්තතිසහස්සයොජනිකා
නිපි අසීතිසහස්සයොජනිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති
චතුසහස්සයොජනිකං මහාමුද්දෙ උදකං සංඨාති-සහස්සයොජනි
කම්පි විසහස්සයොජනිකම්පි තිසහස්සයොජනිකම්පි මහාසමුද්දෙ උ
දකං සංඨාති නවසතයොජනිකම්පි මහාසමුද්දෙ උදකං සංඨාති අට්ඨ
සතයොජනිකම්පි මහාසමුද්දෙ උදකං සංඨාති සත්තසතයොජනිකම්
පි ඡසතයොජනිකම්පි පඤ්චසතයොජනිකම්පි චතුසතයොජනිකම්
පි තිසතයොජනිකම්පි ද්විසතයොජනිකම්පි සතයොජනිකම්පි මහාස
මුද්දෙ උදකං සංඨාති පඤ්ඤාසයොජනිකම්පි සත්තතාලම්පි ඡතාලම්පි
පඤ්චතාලම්පි චතුතාලම්පි තිතාලම්පි ද්විතාලම්පි තාලමත්තම්පි ම
හාසමුද්දෙ උදකං සංඨාති සත්තපොරිසම්පි ඡපොරිසම්පි පඤ්චපො
රිසම්පි චතුපොරිසම්පි තිපොරිසම්පි ද්විපොරිසම්පි පොරිසම්පි අ
ඩ්ඪපොරිසම්පි කටිමත්තම්පි ජණ්ණුකමත්තම්පි ගොප්ඵකමත්තම්පි
මහාසමුද්දෙ උදකං සංඨාති-සෙය්‍යථාපි භික්ඛවෙ සරදසමයෙ ථුල්ල
ඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ තත්ථ තත්ථ ගොපදෙසු උදකානි ඨිතානි
හොන්ති එවමෙව ඛො භික්ඛවෙ තත්ථ තත්ථ ගොපදමත්තම්පි මහාස
මුද්දෙ උදකානි ඨිතානි හොන්ති පඤ්චමස්ස භික්ඛවෙ සූරියස්ස පාතු
භාවා අඞ්ගුලිපබ්බතෙමනමත්තම්පි මහාසමුද්දෙ උදකානි ඨිතානි
හොන්ති එවං අනිච්චා භික්ඛවෙ සංඛාරා එවං අද්ධුවා භික්ඛවෙ සංඛා
රා එවං අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙ
ව සබ්බසංඛාරෙසු. නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං.

හොතිඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධු
නො අච්චයෙන ඡට්ඨො සූරියො පාතුභවති ඡට්ඨස්ස භික්ඛවෙ සූරි

යස්ස පාතුභාවා අයඤ්චමහාපඨවි සිනෙරුචපබ්බතරාජා ධූපායන්ති සන්ධූපායන්ති සම්පධූපායන්ති සෙය්‍යථාපිභික්ඛවෙ කුම්භකාරපාකො ආලිම්පිතො පඨමං ධූපායති සන්ධූපෙති සම්පධූපෙති එවමෙව ඛො භික්ඛවෙ ඡට්ඨස්සසූරියස්ස පාතුභාවා අයඤ්චමහාපඨවි සිනෙරුචපබ්බතරාජාධූපායන්ති සන්ධූපායන්ති සම්පධූපායන්ති එවං අනිච්චාභික්ඛවෙ සංඛාරා එවං අද්ධුවා භික්ඛවෙ සංඛාරා එවං අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලංවිරජ්ජිතුං අලංවිමුච්චිතුං.

හොතිඛො සො භික්ඛවෙ සමයොයං කදාචිකරහචි දීඝස්සඅද්ධුනො අච්චයෙන සත්තමොසූරියො පාතුභවති සත්තමස්සභික්ඛවෙ සූරියස්ස පාතුභාවා අයඤ්චමහාපඨවි සිනෙරුචපබ්බතරාජා ආදිප්පන්ති පජ්ජලන්ති එකජාලීභවන්ති ඉමිස්සාච භික්ඛවෙ මහාපඨවියා සිනෙරුස්ස ච පබ්බතරාජස්ස ඣායමානානං ඩය්හමානානං විනස්සමානානං අග්ගි වාතෙන ඛිත්තායාව බ්‍රහ්මලොකාපි ගච්ඡන්ති සිනෙරුස්සච භික්ඛවෙ පබ්බතරාජස්ස ඣායමානස්ස ඩය්හමානස්ස විනස්සමානස්ස මහතාතෙජක්ඛන්ධෙන අභිභූතස්ස යොජනසතිකානිපි කූටානි පළුජ්ජන්ති ද්වියොජනසතිකානිපි කූටානි පළුජ්ජන්ති තියොජනසතිකානිපි කූටානිපළුජ්ජන්ති චතුයොජනසතිකානිපි කූටානිපළුජ්ජන්ති පඤ්චයොජනසතිකානිපි කූටානිපළුජ්ජන්ති ඉමිස්සාච භික්ඛවෙ මහාපඨවියා සිනෙරුස්සාච භික්ඛවෙ පබ්බතරාජස්ස ඣායමානානං ඩය්හමානානං විනස්සමානානං නෙවඡාරිකාපඤ්ඤායති නමසි—සෙය්‍යථාපි භික්ඛවෙ සප්පිස්සවා තෙලස්සවාඣායමානස්ස ඩය්හමානස්ස නෙවඡාරිකාපඤ්ඤායති නමසි එවමෙවඛො භික්ඛවෙ ඉමිස්සා ච මහාපඨවියා සිනෙරුස්ස ච පබ්බතරාජස්ස ඣායමානානං ඩය්හමානානං විනස්සමානානං නෙවඡාරිකාපඤ්ඤායති නමසි එවං අනිච්චාභික්ඛවෙ සංඛාරා එවං අද්ධුවාභික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙවසබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලංවිරජ්ජිතුං අලං විමුච්චිතුංති.

තත්‍ර භික්ඛවෙ කොමන්තා කොසද්ධා අයඤ්චමහාපඨවි සිනෙරුචපබ්බතරාජා උඩ්ඩය්හිස්සන්තිවිනස්සිස්සන්ති නභවිස්සන්ති අඤ්ඤත්‍රදිට්ඨ—භූතපුබ්බං භික්ඛවෙ සුනෙත්තොනාමසත්ථා අහොසි තිත්ථකරො කාමෙසුවීතරාගො සුනෙත්තස්සඛො පන භික්ඛවෙ සත්ථුනො අනෙකානි සාවකසතානි අහෙසුං සුනෙත්තොසත්ථා සාවකානං බ්‍රහ්මලොකසහව්‍යතාය ධම්මං දෙසෙසි—යෙඛොපන භික්ඛවෙ සුනෙත්තස්සසත්ථුනො බ්‍රහ්මලොකසහව්‍යතාය ධම්මං දෙසෙන්තස්ස සබ්බෙනසබ්බංසාසනං ආජානිංසු තෙකායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගංබ්‍රහ්මලොකං උපපජ්ජිංසු—යෙ න සබ්බෙන සබ්බංසාසනංඅජා

හිංසු තෙ කායස්ස භෙදා පරම්මරණා අප්පෙකච්චෙ පරනිම්මිත වසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජිංසු අප්පෙකච්චෙ නිම්මානරතීනං දෙවානං සහව්‍යතං උපපජ්ජිංසු අප්පෙකච්චෙ තුසිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජිංසු අප්පෙකච්චෙ යාමානං දෙවානං සහව්‍යතං උපපජ්ජිංසු අප්පෙකච්චෙ තාවතිංසානං දෙවානං සහව්‍යතං උපපජ්ජිංසු අප්පෙකච්චෙ චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජිංසු අප්පෙකච්චෙ ඛත්තියමහාසාලානං සහව්‍යතං උපපජ්ජිංසු අප්පෙකච්චෙ බ්‍රාහ්මනමහාසාලානං සහව්‍යතං උපපජ්ජිංසු අප්පෙකච්චෙ ගහපතිමහාසාලානං සහව්‍යතං උපපජ්ජිංසූති.

අථඛො භික්ඛවෙ සුනෙත්තස්ස සත්ථුනො එතදහොසි නඛො පනෙතං පතිරූපං යොහං සාවකානං සමසමගතියො අස්සං අභිසම්පරායං යන්නූනාහං උත්තරිංමගගං භාවෙය්‍යන්ති අථඛො භික්ඛවෙ සුනෙත්තො සත්ථා සත්තවස්සානි මෙත්තං චිත්තං භාවෙසි සත්තවස්සානි මෙත්තං චිත්තං භාවෙත්වා සත්තසංවට්ටවිවට්ට කප්පෙ නයිමං ලොකං පුනරාගමාසි—— සංවට්ටමානෙසුදං භික්ඛවෙ ලොකෙ ආභස්සරූපගො හොති විවට්ටමානෙ ලොකෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජති තත්‍රසුදං භික්ඛවෙ බ්‍රහ්මා හොති මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී ඡත්තිංසක්ඛත්තුං ඛො පනභික්ඛවෙ සක්කො අහොසි දෙවානමින්දො අනෙකසතක්ඛත්තුං රාජා අහොසි චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො සෙය්‍යථීදං චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ගහපතිරතනං ඉත්ථිරතනං පරිණායකරතනං පරොසහස්සං ඛො පනස්ස පුත්තා අහෙසුං සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනො සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසි—— සොහි නාම භික්ඛවෙ සුනෙත්තො සත්ථා එවං දීඝායුකො සමානො එවං චිරට්ඨිතිකො අපරිමුත්තො අහොසි ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි අපරිමුත්තො දුක්ඛස්මාති වදාමි.

තං කිස්ස හෙතු චතුන්නං ධම්මානං අනනුබොධා කතමෙසං චතුන්නං අරියස්ස සීලස්ස අනනුබොධා අප්පටිවෙධා අරියස්ස සමාධිස්ස අනනුබොධා අප්පටිවෙධා අරියාය පඤ්ඤාය අනනුබොධා අප්පටිවෙධා අරියාය විමුත්තියා අනනුබොධා අප්පටිවෙධා තයිදං භික්ඛවෙ අරියං සීලං අනුබුද්ධං පටිවිද්ධං අරියො සමාධි අනුබුද්ධො පටිවිද්ධො අරියා පඤ්ඤා අනුබුද්ධා පටිවිද්ධා අරියා විමුත්ති අනුබුද්ධා පටිවිද්ධා උච්ඡින්නා භවතණ්හා ඛීණා භවනෙත්ති නත්ථිදානි පුනබ්භවොති ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

සීලං සමාධිපඤ්ඤා ච විමුත්ති ච අනුත්තරා
අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා
ඉතිබුද්ධො අභිඤ්ඤාය ධම්මමක්ඛාසි භික්ඛුනං
දුක්ඛස්සන්ත කරො සත්ථා චක්ඛුමා පරිනිබ්බුතොති.

සත්තසූරියුග්ගමනසුත්තං නිට්ඨිතං.

# සප්තසූර්‍ය්‍යෝද්ගමණ සූත්‍රය.

සිංහල සන්න සහිතයි. R.D.M.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

ඒවං මෙසුතං මෙ, ඒම්බා ආයුෂ්මත්නු මහාකාශ්‍යපස්ථවිරයන් වහන්ස මාවිසින් දිව්‍යබ්‍රහ්මනරනාගෙන්ද්‍රාදී සමස්තජනකර්ණරසායන නවූ මෙසප්තසූර්‍ය්‍යොත්ගමන සූත්‍රාන්තධර්‍මදෙශනාව. ඒවං සුතං, මෙආකාරයෙන් අසනලද මෙසේ අසනලදී නොහොත් මෙ, මාගේ; සුතං, ශ්‍රැතිය; ඒවං, මෙසෙමැයි; ඒකංසමයං, සංවත්සරඍතුමාසාර්ධමාස පූර්‍වාණ්හ පරාණ්හාදිකාලයන් අතුරෙන්දෙහො නොහොත් ගර්‍භාවක්‍රාන්තිසමය, ජාතිසමය, සංවෙගසමය, අභිනිෂ්ක්‍රමණසමය, දුෂ්කරක්‍රියාසමය, මාරවිජයසමය, සම්‍යක්සම්බොධි සමධිගමකාලසමය, දෘෂ්ටධර්‍මසුඛවිහාරසමය, අත්තහිතපටිපත්තිසමය, පරහිතපටිපත්තිසමය, දෙසනාසමය, පරිනිර්‍වාණසමය, යනාදී දිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි විසෙෂයෙන් ප්‍රකාසිතවූ සමයන් අතුරෙන් කරුණාකෘත්‍යසමය සංඛ්‍යාතවූ ඒක්ධර්‍මදෙශනාසමයෙක්හි; භගවා,රාගද්වෙෂමොහාදී අකුශලධර්‍මයන් භග්නකලහෙයින්ද, අනල්පකල්පොපචිත දානශීලනෛෂ්ක්‍රම්‍ය ප්‍රඥාවීර්‍ය්‍යක්ෂාන්ති සත්‍යාධිෂ්ඨාන මෛත්‍රීඋපෙක්ෂාදී සමත්‍රිංසත් පාරමිතානුභාවයෙන් සංජාතවාත්‍රිංසත්වර මහාපුරුෂලක්ෂණ අසීත්‍යනුව්‍යංජන ඛ්‍යාමප්‍රභාකෙතුමාලාලඞ්කාරාදී සර්‍වඥරූපාතුලලක්ෂණයන් හෙතුකොටගෙණ භගවත්නම්වූ සර්‍වඥරාජොත්තමයාණන්වහන්සේ ----- වෙසාලියං, නානායක්ෂදෙවතාධිවාසභූතවූ කෛලාසකූට සිඛරප්‍රතිභාගවූසුවර්‍ණරජතෙන්ද්‍රනීලස්ඵටිකප්‍රවාල කම්බොජ්ජ්වලිත ප්‍රාසාදකූටාගාර සහස්‍රයෙන්හා මණ්ඩපාඩයොගසිංඝාටකවාටවංශ මණිකොෂ්ඨාගාරතොරණනානාතුංගයෂ්ටිසිඛරානුබද්ධ හෙමධ්වජනිංකිනී කරාවප්‍රතිරාවසමුපසොභිත මණ්ඩරාගණාවිච්ඡින්නස්ස සප්තශ්‍රෙනිහා රභාරාමනෛකජනානද [illegible] ද්‍රීඩවික්‍රමප්‍රබල පාබල චතුරඞ්ගසෙනාසමාකීර්ණවූ නානාවිරාග පචවර්ණවිචිත්‍රවස්ත්‍රාභරණ විභූසිතවූ තව්තිසාදිව්‍යසෙනාවක්සේ සකලජනරඤ්ජනයකෙරෙමින්වසන්නාවූ සත්දහස් සත්සිය සත්දෙනෙකුප්‍රමාණ ලිච්ඡවිරාජසමූහයන්ගෙන් සොභාමානවූ සුලභ අන්නපානව

සත්‍රාභරණයන්හා සකලනගරාගශ්‍රී සොභාසමෘද්ධිසම්පන්නවිශාලවූ ශාලාඇති විශාලාමහනුවර සමීපයෙහිවූ; අම්බාපාළිවනො, මනුෂ්‍යරූපයට නොපැමිණි දිව්‍යරූපයට ඇතුලත දිව්‍යඞ්ගනාවක්සෙ ඖපපාතිකව අඹරුකමුල පහලවූහෙයින් අම්බපාලිනම් ගණිකාව විසින් තමාගෙ උද්‍යානයෙහි පිළිගන්වනලද අඹපාලිවනාරාමයෙහි; විහරති, චතුර්විධාර්‍ය්‍ය බ්‍රහ්මවිහරණයෙන්යුක්තව වැඩවාසය කරණ සෙක— ඒ මෙදිව්‍යඞ්ගණාස්වරූපවූ අඹපාලිනම්ස්ත්‍රීරත්න " තමක් හෙයින් ගණිකානම් විදයත්—

ඇතොමෝ මේකල්පයට එක්තිස්වනකල්පයෙහි බුදුවූ
බුදුන්ට නැගනීව රාජවංශයෙහි ඉපිද රජසැපත්හැරමේ
නෙහි මහනව බොහො මෙහෙනිනනන්වහන්සේවරුන්ද
චෛත්‍යයක්වැඳ පැදකුනුකොට යන්නාහු පෙරටුවගිය
හෙනින්වහන්සේ කෙනෙක් තිබ්සිමින් කෙලපිඩක් මළුවෙ
දක්ගියාහා පසුවගියමෙහෙනින්දැ දක අහොමළුවේ කෙල
මාගියේ අනාචාරයෙක කවරවේසියෙක් දූයි තියාබිනුහ මේ
නිඇත් කවරකෙනෙකුනැයි නොදත්බැවින් ක්ෂමානොට
හුනුදූය බොහොකාලයක් උපසම්පදාශීලය නිර්මලවරක පි
මාතුකුච්ඡිප්‍රතිසන්ධ්‍ය මෙධ්‍යනරකයෙහිවිසීමක්හා ඉතාපිළිකුල්වූ නෙය එසේහෙයින් මා මිනිසත්ගී උපදනාකල දෙවියන්මෙන් ඖපාතිකව උපදිම්නියා ප්‍රාර්ථනාකොට පියාත් ආයෝපවාද අකුශලයනම් ඉතාබලවත්බැවින් ශීලයෙන්ලබන ස්වර්ගමොක්ෂ සම්පත් වැලකී නරකයෙහි ඉපිද අනන්තදීර්ඝකාලයක් මුළුලෙලහි අනන්ත නරකදුක්විඳ පියාම්නිස්පියටපැමිණ සියදහස්ගණන්ජාතියෙහි සිගනනියකමෙන් කෘපණව දිලිඳුව උපන්හ දසදහසක් ජාතියෙහි වෛශ්‍යාස්ත්‍රීව උපන්හ, නැවතලෝකාලොක දිවාකරවූ කාශ්‍යපබුදුරජනන්වහන්සේගේ ශස්නපවතිනාකාලයෙහි බ්‍රහ්මචරියාව නිර්මලව රක්ෂාකෙරෙමින් දෙව්ලොවඉපිද දිව්‍යසම්පත්වලඳ අපබුදුරජුන්ගෙදවස දෙව්ලොවින්චුතව විශාලාමහනුවර ලිච්ඡවිරජුන්ගෙ රාජෝද්‍යානයෙහි අඹතුරකමුල දෙවගණිකමෙන් ඖපපාතිකව පහලවූහ— උද්‍යානපාලයා ඇදක ලිච්ඡවිරජුන්කරාගොස් කීහ, ලිච්ඡවිහු එඅසා වහවහා උයනටගොස් ඔවුන්දක විස්මපත්ව සියදහස්ගණන් රාජකුමාරවරුඇයෙරූපශ්‍රීන්මත්ව තමතමහට සරණමගුල් කරණසේ මහත්කොට කලහවැඩුහ එකලවිවාදයෙහි කෙලවරක නොදක උපායෙහි දක්ෂවූ ප්‍රධානලිච්ඡවිහුමැ සර්වසාධාරණකොට වෛශ්‍යතනතුරෙහි තබමිහයි සම්මතකොට දවසමසුරන්දහසක් දෙනසේ වෛශ්‍යතනතුරෙහි තබා තමන්සතු රාජෝද්‍යානය ඇම නිලකොට දෙමින් ගුහමණ්ඩපාදිය නිර්මිතකොට දුන්හ—

ඒ අඹපාලිගණිකාවොද අප්‍රමාණවූ ඓශ්වර්‍ය්‍යවිදිමින් දෙවඟණ
කමෙන් කල්යවති, එකල සමස්ත ලොකාලොක දිවාකරවූ කරුණ
නිධානවූ සුගතතථාගතවූ සද්ධර්මචක්‍රවර්ති සර්වඥරාජොත්තමයාන
න්වහන්සේ බැළුබැළුවන් සිතුසිතුවන් ඇසුඇසුවන් ඇස්නිමවමින්
සිත්නිමවමින් හාත්පසින් එකපැහැරමල්පිපී සැදීගිය ශාලද්‍රුමරාජ
යක්හුගේ සමත්‍රිංසත් පාරමිතානැමති විචිත්‍රචිත්‍රාචාරීන්විසින්නිමී
ළඳවූ චාත්‍රින්සත්වර මහාපුරුෂලක්ෂණා සීතානුව්‍යඤ්ජන
කෙතු මාලාලඞ්කාරාදීන් කරණකොටගෙණ සඞ්ඛවලා
ද විද්‍යුල්ලතාශතසහශ්‍රයෙන් වැලඳගිය කනකගිරිසිඛර
සෙමින් හෙවත් බ්‍රහ්මසමූහයා පිරිවැරූහාරිතනම් බ්‍රහ්ම
වහන් බබලමින් සකලගුණගණාභරණවිභූසිත ශාරිපුත්‍රානන්ද
නාවූ නන්ද ගොපාලරාහුලාදී අෂ්ටාශීතිපුද්ගල මහාසඞ්ඝයාපිරිවරා
මෙද හනුවරාසනනයෙහිවූ ගොපිග්‍රාමයට වැඩවදාලසේක.~~
සූත න් අභාලිච්ඡවිරජදරුවො පඤ්චවර්ණප සොභිතවූ වස්ත්‍රාභ
ඛ යෙන් සැරසී විචිත්‍රභද්‍රාභිසඥනාරූඪව බුදුන්දක්නට නික්මු
නුය, එකල අම්බපාලිනම් ගණිකාවොද විසිතුරුවූ රථවාහනය
නැගී ලිච්ඡවින්ට පලමුකොට බුදුන්තරාගොස් වැඳවැටී දෙ
හාත්නාගාගෙණ එකත්පසව උන්හ, එකලසර්වඥරාජොත්තමයාන
වහන්සෙ අම්බපාලිගණිකාවට මෙලොවපරලොව වැඩදක්වදක්වා
එවැඩෙහි සමාදන්කරවා සමාදන්වූපිළිවෙත් සිතනියුක්තකරවා එපි
ළිවෙත යහපත යහපතැයි කියා ප්‍රසංසාකරවා ධර්මදෙසනාකර වදා
ළකල්හී අම්බපාලිගණිකාවො සතුටුසිත් ඇතිවස්වාමිනිදසියට සෙට
උදය අනුග්‍රහකරවදාලමැනවැයි කියාබුදුන්ප්‍රමුඛවූ මහාසඞ්ඝයාට බ
තින් නිමන්ත්‍රනයකොට සමුගෙණ වහවහා එමින් මාර්ගයෙහි රථ
නැගී තරුණලිච්ඡවිරජුන්ගෙ රථහිසින් රථචක්‍රයෙන් ඝට්ටණය
කොට ඉවත්කෙරෙමින් වහා ගෙට අවුත් අනෙකවිධ ප්‍රනීතාහාර
සූපව්‍යඤ්ජන පිළියෙලකොට තුබූහ.~~ ඒ ලිච්ඡවිරජදරුවො `රථ
වාහනයෙන්යා යුතුතැන්ගොස් දුරින්ම බුදුන්දක නැමිනැමියෙ
නි එකලසර්වඥයන්වහන්සේ නිලවර්ණවූ වස්ත්‍රාභරණයෙන් සැරසී
නිලවර්ණයෙන් එන්නාවූ සුවර්ණවර්ණවූ වස්ත්‍රාභරණයෙන් සැරසී
වර්ණවර්ණයෙන් එන්නාවූ රක්තවර්ණවූ මනොහර වස්ත්‍රාභරණ
යෙන් සැරසී රක්තවර්ණයෙන් එන්නාවූ සෙවතාස්ඵටිකමනොහර
ස්ත්‍රාභරණයෙන් සැරසී ශ්වෙතවර්ණයෙන් එන්නාවූ මංජෙෂ්ටික
ර්ණයෙන් දිලිහී එන්නාවූ සත්දහස් සත්සිය සදෙදනෙකුපමණ
ච්ඡවිරාජසමූහයා බලාවදාරමින්, ඔලොකෙථ භික්ඛවෙ ලිච්ඡවිපරි
උපසංහරථ භික්ඛවෙලිච්ඡවි පරිසෙපටිසංහරථ අදිට්ඨපුබ්බාතා
තිංසපරිසනති යනාදීන් මහනෙනි තව්තිසාවැසිදෙවියන් පෙරනු

දුටුවාහුතෙල ලිච්ඡවිරජ්ජුබලවූ මහණෙනි වස්ත්‍රාභරණරූපශ්‍රී ඓශ්ව
ර්‍ය්‍යසම්පත්තීන් බබලන ලිච්ඡවිරජපිරිස්බලා තව්තිසාවාසි දිවපිරිස්
දිනගණින්බසී වදාලසේක— එකල ලිච්ඡවිහු අවුත් බුදුන්වැඳ එ
කත්පසවසැදී උන්නාහ, බුදුරජානන්වහන්සේ ඔවුන්ට ධර්මදෙසනා
කොට සමුදෙමින් එයින්නික්ම නාදිකනම් නිජකාවාසයට වැඩිසේ
ක— අම්බපාලිගණිකාවොද දෙවෙනිදවස් බුදුන්ටකල්දන්වා බු
දුන් රහතුන් මහපෙරහරින් වඩාගෙණවුත් වඩාහිඳුවා සකස්කො
ට දන්වලදවා අනුමෙවෙනිබත අසා පැහැදතමාගේ උද්‍යානය බුද්ධප්‍ර
මුඛවූ මහසඞ්ඝයාවහන්සේට පුදකොට මැතභාගයෙහි එම උද්‍යාන
යෙහි සුයතානුරූපකොට විසිතුරුවිහාරයක්කරවා බුදුන්ටපූජාකර
තමාද සියළුසම්පත් හැර ගිහිගෙන්නික්ම පරිවාරස්ත්‍රීපුරුෂයන්
ගෙන් කොටියක් දෙනාගෙණ බුදුන්කරාගොස් සමුගෙණ භික්ෂුනි
ශාසනයෙහි මහනව රහත්වූහ— මෙසේ අම්බපාලිගණිකාවන්
අතීතයෙහි නොදුනම සිඩවූවාක් දුස්චරිතමය ආර්‍ය්‍යෝපවාද අකු
ශලයෙන් එක්තිස්කපක්මුළුල්ලෙහි අනන්තනරකදුක්විඳ දුකින්ම
සසරහැසිරෙමින් මෙමරහත්වනජාතියෙහිත් වෛශ්‍යස්ත්‍රිව උපන්
හයි දතයුතු— තත්‍රඛොභගවාභික්ඛු ආමන්තෙසි භික්ඛවොති භ
දන්තෙතිතෙභික්ඛූ භගවතො පච්චස්සොසුංභගවා එතදවොච.

තත්‍රඛො, එහිවනාහී; භගවා, නානාපරසමයවාදි හස්තිමතිභේ
දනිත කෙසරීන්ද්‍රායමානවූ ශ්‍රීමත් සුගතතථාගත භාග්‍යවත්සර්වඥ
රාජේන්ද්‍රමයානන්වහන්සේ;භික්ඛවොති, මහණෙනි; තියා,භික්ඛු,සං
සාරයෙහි; භයදක්නාජීයෙන් භික්ඛුනම්ලද භික්ෂූන්ට; ආමන්තෙ
සි, ආමන්ත්‍රනයකරවදළසේක; තෙභික්ඛු, ඒ භික්ෂූන්වහන්සේලා
භදන්තෙති, ස්වාමීන්වහන්සැයිකියා එකපැහැරදෙහොත්නගා; භ
ගවතො, විජ්ජතක්ෂණයෙහි කනකවර්ණසොභානුරඤ්ජිතශ්‍රීශරීර
යෙන් නික්මුනාවූ ස්වර්ණවර්ණාලෝකයෙන් දසසහස්‍රලෝකධාතුව
ස්වර්ණකල්කාලෙපකලාක්මෙන් රන්වන්කලාවූ භාග්‍යවතුන්වහන්
සේට; පච්චස්සොසුං, ප්‍රතිවචනදුන්සේක්ලාය; භගවා, සකලලෝක
වාසී අනන්තසත්වයන්විසින් සියක්සියක්වර කලකුසල් පමනකුසල්
එකලාවූ තමන්වහන්සේ කරවදාලබැවින් සියපින්ලකුනෙන්යුක්තවූ
ඒ භාග්‍යවතුන්වහන්සේ සර්වසුරාසුර මාරනරනාගාදීන්ගේ කර්ණර
සායනවූ මේසන්ත සුයෙසීද්ගමන සූත්‍රාන්තධර්මදෙසනාව; අවො
ච, වදාලසේක— මෙසෙ ශාන්තසුඛප්‍රනීත පරමාර්ථධර්මදෙසනා
ඇති මාගෙතිලෝගුරු සර්වඥරාජේන්ද්‍රමයානන්වහන්සේ අළුයම්හී
නැගිසිට මහාකරුණාසමාපත්තියට සමවැදී අදකෙසෙනම් ලොව
ඩක් කෙරෙම්දෛහොයී බුදුඇසින් මුළුලොව බලනසේක් අනිත්‍ය

කර්මස්ථානගෙණ වසනපන්සියයක් භික්ෂූන්දැක ඔවුන්ගෙ ශ්‍රද්ධාදිප
චෙන්ද්‍රියයො ඉතාමෘදුබැවින් අධිගමයපමාවෙයි කවරධර්මදෙසනාව
කිනම් මොවුන්ගෙ පංචෙන්ද්‍රියය තීක්ෂණවූ තත්වූපරිච්ඡෙදන් අනිත්‍ය
කර්මස්ථාන වූඩාමාර්ගඵලාධිගමයට පැමිනෙද්දැයිහොයි බලා ඉන්ද්‍රි
යානින්ද්‍රිය ප්‍රතිබද්ධ සර්වසංස්කාර ප්‍රවෘත්තිධර්මයන්ගේ අනිත්‍යතාව
ප්‍රකාසිතසප්තසූර්‍යයෙහිද් ගමණය ගෙණහැරදක්වාලිම්නම්මෙභික්ෂූහු
හුත්හුත්පලම්හිද සකලකෙලෂයන්නාසා අර්හත්ඵලයටපැමිනෙති
සෙසුත් සෙසුත් බොහොදෙනා මාර්ගඵලාධිගමයට පැමිනෙති සියළු
දිව්‍යබ්‍රහ්ම මනුෂ්‍යයන්ගේ ලොකසන්ධාන විනාසකාරණයෙහි
සංකාප්‍රහානයවෙයි මතුපන්දහසක්හවුරුදු මුළුලෙලෙහි මාකීබනැ
යී ලොවපවත්නේයයි දැනමහත්වූ කරුණාවෙන් එදවස්පහන්වූ
කල පෙරවරුකලමනා සියළුබුද්ධකෘත්‍යයන් කොට නිමවාපස්වරු
වෙලෙහි සංඝසන්නිපාතවූ දම්සභාමණ්ඩපයෙහි ප්‍රඥප්තවරබුද්ධාසන
මස්තකයෙහි යුගන්ධරොදිතබාලාර්කමණ්ඩලයමෙන් දිලිසෙමින් වැඩ
හිඳ මහනෙනිකියාබැනතැගී බසින්සියළුදම්සභාමණ්ඩපයසුවදකෙ
රෙමින් අනිච්චාභික්ඛවෙ සංඛාරායනා පාඨයවදාලසේක.

අනිච්චාභික්ඛවෙසංඛාරා අද්ධුවාභික්ඛවෙසංඛාරා අනස්සාසිකා
භික්ඛවෙසංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙවසබ්බසංඛාරෙසු නිබ්බි
න්දිතුං අලංවිරජ්ජිතුං අලංවිමුච්චිතුං——භික්ඛවෙ, මහනෙනි; සංඛා
රා, ඉන්ද්‍රියානින්ද්‍රියප්‍රතිබද්ධසර්වසංස්කාර ප්‍රවෘත්තිධර්මයෝ; අනිච්චා, ඉ
පදනස්නාහෙයින් අනිත්‍යයහ, භික්ඛවෙ, මහනෙනි; සංඛාරා, සර්
වසංස්කාරධර්මයෝ; අද්ධුවා, අස්ථිරහෙයින් අද්ධුවයහ; භික්ඛවෙ, ම
හනෙනි; සංඛාරා, පංචස්කන්ධාදිසර්වසංස්කාරධර්මයෝ; අනස්සාසිකා
අනස්ථිරබැවින් සුඛාස්වාදවිරහිතයහ; භික්ඛවෙ, මහනෙනි; යාවඤ්ච
ඉදං, යම්තාක් අනිත්‍යකෙලවරකොට ඇති මෙකාරණයද; සබ්බ
සංඛාරෙසු, භවත්‍රයෙහි උපන්නාවූ සියළුමසංස්කාරයන්කෙරෙහි;
නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලංඑව, යුත්තේමය; විරජ්ජිතුං,
නොඇලෙන්නට; අලං, යුත්තේමය; විමුච්චිතුං, මිදෙන්නට; අලං,
යුත්තේමය.

මෙසෙභූතභවිශ්‍යත් වර්තමානස්ථාවරජංගමනිත්‍යානිත්‍යාදි සර්වසං
ස්කාර ප්‍රවෘත්තිධර්මයන් කරතලාමලකක්‍රමයෙන්ස්වයම්භූඥානයෙන්
අවබොධකරවදාලාවූ සර්වඥරාජෝත්තමයානන්වහන්සේ සකලසත්ව
සත් අනාදිමත් සසරපිඹිටූවා අනන්තසංසාරදුකට භාජනකරවාළ
රූපස්කන්ධය, වෙදනාස්කන්ධය, සංඥාස්කන්ධය,සංඛාරාස්කන්ධය, විං
ඥාණස්කන්ධය,යි කියා දක්වාළමෙපංචස්කන්ධයන් අතුරෙන්,රූපස්ක

ඛය නම්— පඨවිධාතු ආපොධාතු තෙජෝධාතු වායොධාතු චක්ඛු සොත ඝානජිව්හා කායරූප සද්දගන්ධරස පොට්ඨබ්බං ඉත්ථත්ථං පුරිසත්තං හදයවත්ථු ජීවිතින්ද්‍රියං ආකාශධාතු කායවිඤ්ඤත්ති වචීවිං ඤත්ති ලහුතාමුදුතා කම්මඤ්ඤතා උපචයසන්තතිජරතා අනිච්චතායයි විසි අටවිධවේ.

ඒයින් හිසකේලොම්නියදත් සම්මස්නහර ඇටමිදුළුවකුගඩු හෘදයවසතු අක්මා දලබ්බඩදිව් පපුබඩවැල් අතුනුබහන් උදර අසූචි හිස්මුල් යන විසිකොට්ඨාසය පඨවිධාතු නම්වේ— පිත් සෙම් සැරව රුධිර ඩහදියමෙදතෙල් කඳුළුවුරුණුතෙල් කෙලසොටු සඳමිදුළු මුත්‍රයයි යන දොළොස්කොට්ඨාසය ආපොධාතු නම්වෙ— මාශයක් තුනුනොවෙන සේළනක්මෙන් මේශරීරයතුනුවියනොදී පවත්නා ඌෂ්ණගතියෙක් ඇද්ද හෙවත් යම්තෙජෝගතියකින් මෙශරීර සන්තානය සොකපරිදෙවාදිය ඇතිකලතැවෙද, යම් තෙජෝගුණයකින් ශරීරයදවාද,යම් තෙජෝගුණයකින්ශරීරයජරාවටපැමිනේද, යම් තෙජෝගුණයකින් අනුභවකල ෂට්විධවූ සියළුම ආහරජිණ්පැසෙද්ද,යන මෙසතරකොට්ඨාසගතවූ ඌෂ්ණගතියෙක් ඇද්ද ඒ තෙජෝධාතුනම්වෙ— මෙශරීරය දරදණ්ඩක්මෙන් සිටියනොදී එළුක්‍රියායෙහි පවතින්නාවූ යම් වායුගුණයෙක් ඇද්දහෙවත් දෙපත්ලපටන් සිරසදක්වා පවත්නා උඩගම නම් වාතයද, සිරසපටන් දෙපතුලදක්වා පවත්නා අධොගම නම් වාතයද කුක්ෂිගතබඩවැල පිට හැසිරෙණ කුක්ෂිනම්වාතයද බඩවැල ඇතුලත හැසිරෙණ කොෂ්ටසය නම් වාතයද දෙඅත්දෙපාආදිවූ අඟප්‍රත්‍යඟයන් හැසුරුකරණ අඟමඟානුශාරී නම් වාතයද ඉහලපහල නාගණපහණ ආස්වාසප්‍රාස්වාස නම් වාතයද යන මෙසට්විධවූවාතය ප්‍රධාණකොට ඇති මෙශරීරය ගමණසණ භොජනාදී සියළුක්‍රියාවෙහි පවත්වන චිත්තක්‍රියා වායොධාතුයෙක් ඇද්ද හෙවායුධාතුනම්වෙ— නීලපීතාදී රූපදර්ශනයට කාරණවූ චක්ෂුප්‍රසාදයද භෙරිවීනාමෙඝගර්ජනාදී ශබ්දශ්‍රවනයට කාරණවූ ශ්‍රොතප්‍රසාදයද, සුගන්ධදුර්ගන්ධාදිය ආඝ්‍රාණයට කාරණවූ ඝ්‍රානප්‍රසාදයද, ආහරපානාදී රසාස්වාදයට කාරණවූ ජිව්හාප්‍රසාදයද, වස්ත්‍රාභරණ ස්ත්‍රීපුරුෂාදී ස්පර්ශග්‍රහණයට කාරණවූ කායප්‍රසාදයද, යන ප්‍රසාද රූපපසද— චක්ෂුවට ගොචරවූ රූපාලම්බනයද, ශ්‍රොතයට ගොචරවූ ශ්‍රොතාලම්බනයද, ඝ්‍රාණයටවිශයවූ ගන්ධාලම්බනයද, දිවටවිශයවූ රසාලම්බනයද, කායෙන්ද්‍රියයටවිසයවූ ස්ප්‍රෂ්ටාලම්බනයද, යනවිසයරූපපසද— ස්ත්‍රීභාවය පුරුෂභාවය මනොවිඤ්ඤනධාතුන්ට ආධාරවූ හෘදයවස්තුවය දෙහඨයිතියටකාරණවූ රූපජීවිතෙන්ද්‍රියද— දෙකන්සිදුරුනාසා

කිලුඹුබණාර උගුරමලමුත්‍රමාර්ගයෝය යන අවසිදුරුහා කනබොන
දෙයපිහිටන උදරපටලය යන මෙනමය ආකාශධාතුනම්වෙ—
කායින් අභිප්‍රායගහවත්නාවූ කායවිඥප්තියද, වචනයෙන් ඒ අ
භිප්‍රායගගවත්නාවූ වාක්විඥප්තියද, දවසක්මුළුළෙලෙහි රත්වූය
කඩකඳක්මෙන් ශරීරයාගේ සැහැල්ලුබවයයි කියනලද කායලහු
තාවයද—සුමර්දිත චර්මයක්මෙන් නොදැඩිබවයයි කියනලද කාය
මෘදුතාවද—යහපත්කොට තැවූ සුවර්ණයක්මෙන් ශරීරයෙන්
කටයුතුක්‍රියාවට අනුකූලබවයයි කියනලද කායකර්මන්‍යතාවද—
ගඟබඩකැපූකූපයාගේ අපරිපූත්නොද කෝත්ගමනයමෙන් දුර
සනාතිකාදිවූ එකාදසරූපායතනයන්ගේ මතුමතෙහි උප්පත්ති
වසයෙන් අභිවෘද්ධියකැයි කියනලද උපචයද, පරිපූර්ණකූපයෙන්
ඉතිරිඋදකයාගේ පිටතඉතිරියාමක්මෙන් උක්තක්‍රමයෙන් උපචි
තරූපයන්ගේ නැවතනැවතත් ප්‍රබන්ධොත්පත්තිවසයෙන් ප්‍රවෘ
ත්තියැයිකියනලද සන්තතියද—රූපයන්ගේ උත්පාදවස්ථාන
යෙන් මතෙහි ජීර්ණවනභගාභිමුඛාස්ථාවයයි කියනලද ජරතා
වද—රූපයන්ගේ පරිභෙදස්වභාවවූ අනිත්‍යතාවදැයි යන මේ
අටවිසිරූපයෝ සිතුස්නාදීන්රුප්පනාර්ථයෙන් විකාරයටයනුයි රූප
නම් වෙයි, රාසිඅර්ථයෙන් රූපස්කන්ධනම්වෙ—ඉෂ්ටානිෂ්ටමධ්‍ය
ලම්බනයෙක්වීනම් සවැදෑරුම්හෝ,ත්‍රිවිධවෙදනා උපදනෙය නො
හොත් මනාරූපයන් දැක සැපවෙදනාව උපදනේය, අමනාපවූරූ
පයන් දැක දුක්ඛවෙදනාව උපදනේය, ප්‍රියමප්‍රියවිරහිතභූමිපර්වත
කැටකැබිලිති ආදීමධ්‍යස්ථරූපයන් දැකඋපෙක්ෂාවෙදනාවඋපදනේ
ය,මෙසෙයින්ම මනාපශබ්දයද අසා මනාපගන්ධාඝ්‍රාණයකොට ම
නාපරසවලඳා සවිඥානක අවිඥානකප්‍රියවස්තු ස්පර්ශකිරීමෙන් ම
නාප දෙයසිතීමෙන් සැපවේදනාව උපදී,අමනාපවිරහිතවූ චින්තා
වෙන් උපෙක්ෂාවඋපදී, මෙසෙනානාවස්ථාවට ගියාවූ චක්ෂුරාදී සද්වා
රින්උපදනාවෙදනාව වෙදනාස්කන්ධනම්වෙ—ඇසින්දුටු නිලපී
තාදිරූපයන් මෙඅසවල්රූපය යනාදිවසයෙන් හැඳිනීමය,එසෙම
කනින් ඇසූහෙරිවිනාමෘදඟාදී ශබ්දයන්වෙන්වෙන්කොට හැඳිනීම
ය,නාසෙන් ආඝ්‍රාණයකල සුගඳදුගඳ වෙන්කොට හැඳිනීමය, දිව
න් විඳිරසය එනුඇඹුල්පැනිතෙල් කිරිරසය යනාදිවසයෙන්,වෙන්
වෙන්කොට හැඳිනීමය, කායින්ප්‍රත්‍යවස්පර්ශකොට මේ සුඛස්පර්ශය
මේ දුක්ඛස්පර්ශය යනාදිවසයෙන්තෙරුම්කොට හැඳිනීමය,මනසින්
යමක් චින්තනයකොට මේ අසවල්දේ යයි යනාදිවසයෙන් වෙන්
කොට සිතිවිලිහැඳිනීමය, යන මේ සවිධවූ සංඥාව සංඥාස්කන්ධ
නම්වෙ.

සංඛාරා චෙතනාඵස්සො මනක්කාරො සුසණ්ඨිති තක්කොචාරො
ච වායාමො පීතිඡන්දාධිමොක්ඛතා—සද්ධාසතීහිරොත්තප්පං ච

ගො මෙත්තාමත්ථූනමජ්ඣත්තතාව පඤ්ඤාධිකාය චිත්තවත්ථාවෙදු—
මාණෙතා ඉස්සාච මච්ඡෙරො කුක්කුච්චං ථීනමිද්ධං ඉති එතානි පඤ්
ඤාසසංඛාරක්ඛන්ධසඞ්ඛිතානි—

යන්නුහෙයින් ප්‍රථමකොට උදෑසන්හි භිත්තිආදියෙහි පැතිරවැද
සන් ශිවන අච්රුස්මියක්සේ ප්‍රථමකොටම චක්ෂුශ්‍රොත්‍රාදීහුරූපශබ්දාදි
යදුක අසා එළු අරමුණු ස්පර්ශකරණ ඵස්සයද—සුභොජනරස අ
නුභවකරණ රජහුමෙන් ආලම්බනරසානුභවකරණ වෙදනාවද,
වඩුවනී ආදීන්ගේ දූවආදියෙහි සලකුනුකිරීමක්මෙන් නිලපීතාදි
භෙදවූ අරමුණුහඳුනන ආකාරයෙන් පවත්නාවූ සංඥාවද—
ගොවියෙකු තමන්පනස්පස්දෙනෙකුහා සමග සීසෑම් ගොයම්කැ
පීම් ආදියකට තමන්කුඹුරටගියෙය සෙසුපස්දෙනාටවඩා ඕනෑක
මින් මහත්උත්සාහයෙන්යෙදී ඒ ඒ කටයුතුකෙරේද එපරිද්දෙන්
සෙසුපනස්පස්ධර්මයන්ටවඩා මහන්උත්සාහවත් ලක්ෂණයෙන් යුක්
තවසියළු ධර්මයන් ආරම්මනයෙහි හසුරුවන්නාවූ චෙතනාවද—
අජානීය අශ්වයන්මෙහෙයන්නාවූ සාරථියක්හුමෙන් සහජාත ධර්මය
න් ආලම්බනාභිමුඛකොට මෙහෙයන්නාවූ මනස්කාරයද—උත්
පලාදීන්ට ජලයක්මෙන් සහජාත අරූපපරිපාලනයෙහි ආධිපත්‍ය
කරණ ආයුසංඛ්‍යාත ජීවිතෙන්ද්‍රියයද—යුද්ධමඩලයට මහනරේන්ද්‍රය
කු පිරිවරාගණගිය සෙනගක් ඒ මහරජ්ජුරුවො වැඩියවැඩියතෘන
කටයෙද ඒ සියළුසෙනග එකරාසිකිරීමට ප්‍රධානවූනරෙන්ද්‍රයන්
සේ ඵස්සාදිසෙසු සියළුධර්මයන් විසිරයානොදී එක්ආරම්මණයෙක
සම්පිණ්ඩනයකරණ චිත්තෙකාග්‍රතාවද—ගණ්ඩාරයෙහි ප්‍රථමකො
ටවදිනපහරක්මෙන්අරමුනටප්‍රථමකොටම චිත්තයනැගීමලක්ෂණ
කොට ඇති විතර්කයද—ඒ පහරින්නැගාවූ රාවයගණ්ඩාරයෙහි
පවත්නාසේ විතර්කයෙන් අරමුනටනැගුණ චිත්තයාගේ නැවතනැ
වත පවත්නාලක්ෂණස්වභාවවූ විචාරයද—සියළු කටයුතුකෘත්‍ය
යෙහි පසුබටනොවන යෝධයකුසේ හැමක්‍රියායෙහි උත්සහවත්
ලක්ෂණවූවීර්‍ය්‍යයද—පැන්නැතිග්‍රීෂ්මකාලයෙහි කාන්තාරමාර්ගයෙ
හිපිපාසයෙන් මිරිකීයන පුරුෂයක්හට පස්පියුමෙන් ගැවසුනු සිහිල්
පැන් පොකුනක්දුක උපදනා චිත්ත ප්‍රීතියක්සේ ඉෂ්ටාරම්මනයෙහි
උපදනා චිත්තප්‍රීතියද—ආරම්මනග්‍රහණයෙහි සිතින් අතදිගු
කරන්නාක්මෙන් කර්තුකම්‍යතාලක්ෂණවූ ඡන්දයද—නිශ්චලවූ ඉ
න්ද්‍රඛීලයක්මෙන් අරමුනේ සන්නිෂ්ඨානලක්ෂණවූ අධිමොක්ෂයද-
චක්‍රවර්ති චතුරඞ්ගිනිසේනාගමනින් කැලඹීගිය මඩදියක්ප්‍රසන්න
කරණ උදකප්‍රසාද මාණික්‍යරත්නයක්සේ ලොභාදිකෙලෂයන් ප
හදවනලක්ෂණවූශ්‍රද්ධාවද—මහරජක්හටකලමනානොකලමනා
සියළුකටයුතු සඳහන්කරවන විශ්වාස අමාත්‍යයකුසේ අකුසලධර්
යන්හරිනසේ කුසලධර්මයන්කරණසේ සිහිකරවණලක්ෂණවූ ස්මෘති

යද—අකුසලක්‍රියාවෙහි ලජ්ජාස්වභාවවූ හිරියද—අකුසලක්‍රියා වෙහි භයස්වභාවවූ ඔත්තප්පයද—පියුම්පත්‍රයෙහිහී පතිත ජලබි න්දුවක්සේදුටු ඇසූ කිසිඅරමුණෙක ඇලීමනොකරණ්ණාවූ අලොභ යද—අනුකූලමිත්‍රයකුසේ අවිරුඬස්වභාවවූ අවෙෂයද—අන්ධකාර යෙහි රූපයන්ගේ ප්‍රකාශකරණප්‍රදීපයක්සේ අවිද්‍යාන්ධකාරය විධ මනයකොට සියළු හොඳ නොහොඳ ප්‍රකාශකරණ ලක්‍ෂණවූ ප්‍රඥා වද—සම්ප්‍රයුක්ත චෛතසිකධර්මයන් ස්වකීයකෘත්‍යයෙහි සම්ප්‍රවෘ ත්තියටහෙතුවූ තත්‍රමධ්‍යස්ථතාවද-වෙදනාදිස්කන්ධත්‍රයාගේදරථයසී තියනලද උද්ධච්චාදිකෙලෙසයන් සංසිඳුවන කායප්‍රශ්‍රබ්ධියද—විඥා නස්කන්ධයාගේද රථයසීතියනලද උද්ධතාදිකෙලෙසයන් සංසිඳුවන චිත්තප්‍රශ්‍රබ්ධියද—එසේම කාමච්ඡන්දාදී කෙලෙසයන් සන්සිඳුවන කායකර්මන්‍යතාවද—කාමච්ඡන්දාදීන් සන්සිඳුවන චිත්තකර්මන්‍ය තාවද—අශ්‍රද්ධාදීන් සංසිඳුවන කායප්‍රාගුණ්‍යතාවද—අශ්‍රද්ධාදීන් සංසිඳුවනචිත්තප්‍රාගුණ්‍යතාවද—කායසංඛ්‍යාතවූ වෙදනාසඥාසංස්කා රස්කන්ධත්‍රයාගේ කුටිලභාවකරවූ මායාසාඨෙය්‍යාදී අකුසලයන් සංසි ඳුවන කායඍජුකයද-මායාසාඨෙය්‍යාදී අකුසලයන් සංසිඳුවන චිත් තඍජුකයද—දුඃඛිතයන්ගේ දුක්පහකරණුකැමැත්තාවූ කරුණා වද—පරලාභසත්කාර කීර්තිප්‍රසංසායෙහි මොදනා*ලක්‍ෂණවූ මුදි තාවද-බොල්සුලගෙඇර වියක්රුස්කරණ ගොවියකුසේ මුසාවාද දිය දුරුකොට වාක්සත්‍යාදිය පැවැත්වීම ලක්‍ෂණවූ සම්‍යක්වචනය ද—අසූචිමලමූත්‍රාදිය අතගානා ලදරුවෙකුසේ නොකොට කලම නාසාරවත්කටයුතුම කරණප්‍රඥවන්තයෙකුසේ යහපත් කර්මස්ව භාවවූ සම්‍යක්ස්වභාව සම්‍යක්කර්මාන්තයද—රත්‍රංදවාසුධකරණ ස්වර්ණකාරයකුසේ ජීවිකාවපිරිසිදුකරණ ලක්‍ෂණවූසම්‍යක් අජීවය ද—රූපශබ්දාදියෙහි පඤ්චෙන්ද්‍රියයන්ගේ ඇලීමලක්‍ෂණකොට ඇ තිලොභයද—දණ්ඩන්ගැසූ නයෙකුකිපෙන්නාසේ කිපීමලක්‍ෂණ කොට ඇතිවෙෂයද—චතුස්සත්‍යයනොදන්නාමෝහයද—මෙලො ව පරලොව නැතයනාදින්ගන්නාමිථ්‍යාදෘෂ්ටියද—ශීතනොසන්සුන් බව ලක්‍ෂණවූ උද්ධච්චයද—ග්‍රාමසූකරයා අසූචියට කැතනැත්තාසේ පාපයට ලජ්ජානැති ලක්‍ෂණවූ අහිරිකයද—ප්‍රදීපයට සලභයානො බවපතින්නාසේ පාපයටභයනැති ලක්‍ෂණවූ අනොත්තප්පයද— බුද්ධ ධර්ම සංඝසික්‍ෂාපූර්වාන්ත අපරාන්ත පූර්වාපරාන්ත ඉදප්පච්චයතා ප්‍රතීත්‍යසමුත්පන්නධර්මය යන අටතැනසැකසිතන්නාවූ විචිකිච්ඡා වද—මම සියලලන්ට වැඩිනරමැයිසිතන්නාවූ මානනායද—අනුන්

* සතුටු වීම.

කෙරෙහි කරණ ඊර්ෂ්‍යාවද—තමාගේ සියළුඓශ්වර්‍ය්‍ය වෙනකෙනෙකුටනොවේවයි සිතනනාවූ මාත්සර්‍ය්‍යයද–කලනොකළදුසන්තාපලක්ෂණවූ කුක්කුච්චයද—චිත්තයගැකිලීම ලක්ෂණවූ කායකර්මන්‍යලක්ෂණවූ ථීනයද–අකර්මන්‍යලක්ෂණවූ මිද්ධයද–යන මේ පනස් ධර්මයන්හා වෙදනා සංඥාදී පනස්පස්ධර්මයො සංස්කාරස්කන්ධය නම් වේ—විඥ්ඤානස්කන්ධය නම්—

ඇසෙහි උකුණුහිසක්ප්‍රමාණවූ අභිමුඛගතරූපයන්දක්නා චක්ෂුප්‍රසාදයෙන් දුටු නීලස්වර්ණාදි වර්ණයන් දැනගන්නාවූ චක්ෂුර්විඥානයද ශ්‍රෝත්‍රයෙහි සිහින් තඹවුදැක්ප්‍රමාණවූ රෝමයෙන් නොයෙක්ශබ්දඅසා දැනගන්නා ශ්‍රෝත්‍රවිඥානයද–නාසිකාවෙහිඑළුවන්ගේපියවර ශටහන්බඳුවූ සුගඳ දුගඳ අසා දැනගන්නාවූ ඝ්‍රාණවිඥානයද—දිවෙහිමහනෙල්පෙත්තකටදුවූ සටහන් ඇති නොයෙක්රසවිඳින්නාවූ ජිව්හාප්‍රසාදයෙන් රසයන්විඳදැනගන්නාවූ ජිව්හාවිඥානයද, කයින්ලැබූස්පර්ශයන්දැනගන්නාවූ කායවිඥානයද, සිතින්සිතූ නොයෙක් සිතිවිලි දැනගන්නාවූ මනොවිඥානයද, යන මේ සව්විධවිඥානයද—

සතර අපායෙහි පිළිසිඳදැනගන්නා අකුසලවිපාක අහෙතුක මනොවිඥානධාතුචිත්තයද, දෙවියන්ගාමිනිස්ලොව ජාත්‍යන්ධ බධිර උම්මත්ත ගොළු ආදිසත්වයන්ගේ පිළිසිඳගන්නාවූකුසලවිපාක අහේතුක මනොවිඥාන ධාතුචිත්තයද, දෙවියන්හා මිනිස්ලොව පිංවත්සත්වයගේ පිළිසිඳගැනීමට හේතුවූ හෙතුකකාමාවචරවිපාකසිත් අටද, රූපීබ්‍රහ්මලෝකයෙහි උපදවන රූපාවචරවිපාක අහේතුක මනොවිඥානධාතුචිත්තයද, දෙවියන්හාමිනිස්ලොව පිංවත්සත්වයන්ගේ පිළිසිඳගැනීමට හේතුවූ හෙතුකකාමාවචරවිපාකසිත් අටද, රූපීබ්‍රහ්මලෝකයෙහි උපදවනරූපාවචරවිපාකසිත්පසද, අරූපීබ්‍රහ්මලෝකයෙහි උපදවන අරූපාවචරවිපාකසිත්සතරද, "සෝමනස්සසහගතං" යනාදීඉෂ්ටානුභවලක්ෂණකොට අතිසෞමනස්සසහගියාවූ අනිත්‍යාදිධර්මස්වභාවහැර නිත්‍ය සුඛ සුභාදී වශයෙන්විපරීතවූ මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූ තමාවිසින්හෝ අන්‍යයන්විසින්හෝ කරණලද ප්‍රයෝගවිරහිතහෙයින් අසංඛාරිකවූ එක්අකුසලචිත්තයක, තමාවිසින්හෝ අන්‍යයන්විසින්හෝ කරණලද පූර්වප්‍රයෝගසහිතවූහෙයින් සසංඛාරික එක්අකුසලචිත්තයෙක—සොම්නස්සහගතවූකාමයෙහි ආදිනවයෙක්නැතැයි යනාදීන්ගත්මිථ්‍යාදෘෂ්ටියෙහා අමිස්‍රවූඅනික්කෙනෙකුන්විසින්උත්සාහයක්නැතිවස්වභාවතීක්ෂණවූ සිතින්මකාමසේවනාදියකරණකල උපදනාඅසංඛාරිකවූඑක්අකුසලචිත්තයෙක-එසේම සොම්නස්සහගියාවූ මිථ්‍යාදෘෂ්ටියෙහා අනොත්සාහ සහිතවූ සිතින් කාමසේවනාදියහෝ දෘෂ්ටමංගලාදියහෝ

සාරයකීගන්නාකල උපදනාසසංඛාරිකවූ එක්අකුසලචිත්තයෙක-
මධ්‍යස්ථානුභාවලක්‍ෂණවූ උපෙක්‍ෂාවේදනාවහා එකොත්පාදපිභාව
යටගියාවූ විපරීතමිථ්‍යාදෘෂ්ටියෙන් සම්ප්‍රයුක්තවූ එක්අසංඛාරික අකු
සලචිත්තයෙක-එසේම සසංඛාරිකවූ අකුසලචිත්තයෙක-උපෙක්‍ෂා
සහගතවූ විපරීතමිථ්‍යාදෘෂ්ටියහා මිශ්‍රනොවූ අසංඛාරිකවූ එක්අකුස
ලචිත්තයෙක-ප්‍රතිඝයෙන් සම්ප්‍රයුක්තවූ චෙසසහගතවූ අසංඛාරික
වූ අකුසලචිත්තයොදෙදෙනද-උපෙක්‍ෂාසහගියාවූ බුඩාද්අටතන්හි
ඇදනැදෙහොයි උපදනාසංසයලක්‍ෂණවූ විචිකිච්ඡාවෙන් සම්ප්‍ර
යුක්තවූ එක්අකුසලචිත්තයෙක යන මෝහචිත්තයෝදෙදෙනද—
රූපශබ්දාදියෙහි සිතනොසන්සුංබවයයි කියනලද උඩච්චයහා එ
කොත්පාදද් ප්‍රකාරයෙන්යුක්තවූ එක්අකුසලචිත්තයෙක—මෙකී
දොලොස් අකුසලචිත්තයොද—

උපෙක්‍ෂාවෙදනාවහා එකොත්පාදපිභාවයටගියාවූ රූපදර්ශණයට
කාරණවූ චක්‍ෂුප්‍රසාදය ආශ්‍රයකොටපවත්නාවූ චක්‍ෂුවිඥානයද—
එසෙමශ්‍රොත්‍රවිඥානයද, ජිව්හාවිඥාණයද, කායවිඥාණයද-
උපෙක්‍ෂාසහගතවූරූපාදීන් උපදනාසන්තීරණචිත්තයද යන මෙ අ
කුසලවිපාක චිත්තයොසතදෙනද--උපෙක්‍ෂාසහගතවූ රූපසන්දර්ශ
ණයටහේතුවූ චක්‍ෂුප්‍රසාදය ආශ්‍රයකොට පවත්නාවූ චක්‍ෂුවිඥාන
යද--එසේමශ්‍රොත්‍රවිඥාණයද, ඝ්‍රාණවිඥාණයද, කායවිඥා
ණයද—උපෙක්‍ෂාසහගතවූ රූපාදිඅරමුනුපිළිගන්නා සම්පටිච්ඡන
චිත්තයද---එසේමපිළිගත් රූපශබ්දාදි අරමුනුවිමසන්නාවූ සන්තීර
ණචිත්තයයි කියනලද කුසලවිපාක අහෙතුක මනොවිඥාණධා
තුවද—සෞමනශ්‍යසහගතවූ සැපවෙදනාඇති සන්තීරණචිත්තය
ද—යන මෙසත්විධවූකුසලවිපාකඅහෙතුකචිත්තයොද-උපෙක්‍ෂාස
හගතවූ මනොද්වාරයටහමුවූ රූපාදී අරමුනටචිත්තසන්තතිය යො
මුකරණමනොද්වාරා වර්ජනචිත්තයද--සොම්නස්සහගියාවූ මනො
වාරික ආලම්බනයෙහි රහතුන්ට සිනාඋපදවන හසිතොත්පාදචි
ත්තයද—යන මෙ අහෙතුකක්‍රියාසිත්තුනද, යන මෙසම්තිස්චිත්ත
යෝද—නෙම්ලානිසංසදක්‍ෂනබැවින්හා සංඥාතමානසිකසුඛවෙද
නාවෙන් යුක්තහෙයින් සොමනස්සසහගතබැවින් විසුඩසද්ධාදිපඤ්
චෙන්ද්‍රියයන්ගේ මුහුනිරීමෙන් ඥාණයහා සම්ප්‍රයුක්තවූ අන්‍යයන්
ගේ උත්සාහයක්නැතිස්වකීයස්වභාවවූ සිතින්මදානසීලාදී පින්ක
රණකල උපදනා අසන්ඛාරිකවූ එක්කුසලචිත්තයෙක—සොමන
ස්සසහගතවූ ඥාණසම්ප්‍රයුක්තවූ දන්දෙවපින්කරවයනාදී අන්‍යය
න්ගේ උත්සාහයක්ඇති ස්වකීයවූ ස්වභාවවූ සිතින්ම දානසීලාදී
පින්කරණකල සසංඛාරිකවූ එක්කුසලචිත්තයෙක—දෙමව්පියන්
ගේ සුත්‍යක්‍රියාදර්ශණයෙහි සන්ජාතදර්ශණ පරිචය ඇති බාලදරුවා

යෝ සතුන්දැක සොම්නස්උපදවා චාගාදිවශයෙන් අනතුබුතිසිවත්
දන්දෙද්ද එකලඹවුන්ට සොම්නස්සහගතවූ ඤාණවිප්‍රයුක්තවූ අසං
ඛාරිකවූ එක්කුසලචිත්තයෙක් උපදනේය.

විසුද්ධිසද්ධාබුද්ධිසම්පන්න සත්පුරුෂජනයෝ තමන්දරුවන්ලන්කොට
ජාත්‍යන්ධ අපබුදුන් සගුරුවවඳුව පූදව යනාදීන් උත්සාහිතවවඳිද්ද
සතුටුවවඳිද්ද එකලඹවුන්ට සොම්නස්සහගතවූ ඤාණවිප්‍රයුක්ත ස
සංඛාරිකවූ එක්කුසලචිත්තයෙක් උපදනෙය, උපෙක්ෂාසහගතවූ
ඤාණසම්ප්‍රයුක්තවූ අසංඛාරිකසසංඛාරිකකුසලචිත්තයෝදෙදෙනෙ
ක—උපෙක්ෂාසහගතවූ ඤාණවිප්‍රයුක්තවූ අසංඛාරිකචිත්තයෝදෙ
දෙනෙක—බලවත්සද්ධාවය විසුද්ධිත්‍රියයදෘෂ්ටියය ආනිසංසදර්ශණය ප්‍ර
ත්‍යය ප්‍රතිග්‍රාහකය යන සොම්නස්ඉපදවීමටහෙතුවූ මේසතර අඞ්
විකලපයෙහි සොම්නස්සහිතවූ සිත්ඇතිවෙද්ද එකලමෙසතරසිත
උපෙක්ෂාසහගතව උපදනෙය යන මෙ කාමාවචරකුසල්සිත් අටද
"සොමනස්සසහගතං"යනාදීන් දක්වූකාමාවචර සහෙතුකකුසල් වි
පාකසිත් අටෙක කාමාවචරසහෙතුකක්‍රියාසිත් අටෙකැයිකියා කා
මාවචරකුසල් සුවිසෙසක—විතක්කවිචාරප්‍රීතිසුඛෙකාග්‍රතාසහිත
ප්‍රථමධ්‍යානකුසලචිත්තයද—විචාරප්‍රීතිසුඛෙකාග්‍රතාසහිතවූ පඤ්චම
ධ්‍යානකුසලචිත්තයද—මෙශේයථොක්තක්‍රමයෙන්ම විපාකසිත්පස
ලොසෙක—අරූපාවචරකුසල්සිත් සතලොසෙක්වෙයි-"සොතාපත්
තිමග්ගචිත්තං" යනාදිදෙසනාක්‍රමයෙන් මාර්ගසිත්සතරෙක ඵල
සිත්සතරෙකැයි ලොකොත්තරසිත් අටෙක්වේ.

මෙකී එකුන්අනූවක් පමනචිත්තයො විඤ්ඤාණස්කන්ධනම්වෙ—මෙ
කී පඤ්චස්කන්ධාදී සත්වයොධර්මයො සියළුම සත්වයන් සංසාරයෙහිලා
අනන්තසංසාරදුකට භාජනකරවාළු බවවිසදවූ සර්වඥතාඥාණයෙ
න්දැන ආදිත්‍යබන්ධු*ගොත්‍රවූ සර්වඥයන්වහන්සේ රූපස්කන්ධයක්‍රම
යෙන් නැගීනැතිවන පෙනපිඬකටබඳුවූ උපමාඇත්තේය වෙදනා
ස්කන්ධය දියබුබුලකටබඳුවූ උපමාඇත්තේය, සඤ්ඤාස්කන්ධය අවු
ව්වෙහිපෙනෙනමිරිඟුජලයකටබඳුවූ උපමාඇත්තේය, සංස්කාරස්
කන්ධයකෙසෙල්ස්කන්ධයකටබඳුවූ උපමාඇත්තේය, විඤ්ඤාණස්කන්
ධ මායාරූපයක්වැන්නේයයි කියාපඤ්චස්කන්ධයාගේ අනිත්‍යතාව
ප්‍රකාසකරණලද්දෙය—එසින් වදාලාහ.

ඵේනපිණ්ඩූපමං රූපං වෙදනාබුබ්බුළූපමං
මරීචිකූපමා සඤ්ඤා සංඛාරා කදලූපමා
මායූපමාච විඤ්ඤාණං දෙසිතාදිච්චබන්ධුනා සි.

මෙසෙ පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාතජීවිතෙන්ද්‍රිය ප්‍රතිබද්ධසංස්කාරධර්
යන්ගේ අනිත්‍යතාව ප්‍රකාශකරවදාරමින්අනින්ද්‍රිය ප්‍රතිබද්ධසංස්කා
රධර්මයන් ප්‍රකාසකොටවදාරණසේක් "සිනෙරුසික්ඛවෙ" යනාදිපා
ය වදාළසේක.

භික්ඛවෙ, මහනෙනි; සිනෙරුපබ්බතරාජ, මහාමෙරුපර්වතරාජ තෙම; ආයාමෙන, දිගින්; චතුරාසීති යොජනසහස්සානි, සුවාසූදහස්යොදුන; විත්ථාරෙණ, පළලින්; චතුරාසීතියොජනසහස්සානි, සුවාසූදහසක්යොදුන; චතුරාසීතියොජනසහස්සානි, සුවාසූදහසක් යොදුන්; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; අජ්ඣොගාල්හො, ගැලීසිටියෙය; චතුරාසීතියෝජනසහස්සානි, සුවාසූදහසක්යොදුන්; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි පටන්; අතිඋග්ගතො,(ශක්‍රභවනයදක්වා); ඉතා උස්වපිහිටියේයි.

ඒ මහමෙර කොතනකපිහිටියේදයත් යට අජටාකාසයෙහි නවලක්ෂසැටදහසක්යොදුන් ඝණයඇතිවාපොලව පිහිටියෙය, ඊමත්තෙහි සාරලක්ෂ අසූදහසක්යොදුන් ජලපොළවපිහිටියෙය, ඊමත්තෙහි දියපිට තිබූ මහාවිසාලමූඛඇති මහසැලක්සෙයින් සනිස්ලක්ෂදසදහස් තුන්සියපනස්යොදුන් වටඇති චක්‍රවාටපර්වතය හාත්පසින් දෙයාසූදහසක්යොදුන් උස්වපිහිටියෙය, එහි ඇතුලත දෙලක්ෂසතලිස්දහසක්යොදුන් ඝණමහපොලව පිහිටියෙය, එහි එක්සියසතිස්මහනරකහා නාලොවපිහිටියෙය, මහසමුද්‍රහා ත්‍රිකූටපර්වත පිහිටියෙය, ඊපිටමධ්‍යයෙහි මහත්වූමිහිභුබෙරයක්මෙන් එක්ලක්ෂ අටසැටදහසක්යොදුන් උස ඇති මහමෙරුපර්වතය පිහිටියෙය, ඒ මහමෙරමුදුනේ දසදහසක්යොදුන් ශක්‍රභවනපිහිටියෙය, මෙරයට දසදහසක්යොදුන් අසුරභවනපිහිටියෙය, ඒ මහමෙරවටා යුගන්ධරපර්වතය දෙසාලිස්දහසක්යොදුන් මුහුදගැලී ඒතාක්උස්ව චාතුර්මහාරාජිකයදක්වා පිහිටියෙය, ඊසධර කරවීක සුදස්සන නෙමින්ධර විනතක අස්වකර්ණ යන සප්තවිධ පර්වතයො අඩ්ඪ් ප්‍රමානයෙන් එකිනෙකට මිටි මිටිව පිහිටියෙය, ඒ පර්වතවලඑ අනන්තරනන්තරයෙහි සප්තමහාසීදන්තසාගර පිහිටියේය.

මහමෙරට ඒ නාබඩව පතුහසක් පතුහසක්යොදුන් පලලහා ඝණය ඇතිනාග ගරුඩ කුම්භාණ්ඩ යක්ෂයන්ටසැදි සක්දෙව්දුහට අරග් ගෙණසිටින එනම් ආලින්දසතරෙක් ඒ මතුමතෙහි මහමෙරවටා පිහිටියෙය-මහමෙර 'පූර්වදික්පාර්ශවය රජතවර්ණය, දකුණුදික්පාර්ශවය ඉන්ද්‍රනීලමනිවර්ණය, පැලදික්පාර්ශවය ඵලිකවර්ණය, උතුරුදික්පාර්ශවය ස්වර්ණමය, එසීන්තීහ.

පාචීනපස්සං රජතං දක්ඛිණං ඉන්දනීලකං
පච්ඡිමං ඵලිකංඑස්සං උත්තරං කචනාමයං හි.

මෙසෙමහමෙරපිහිටි ත්‍රිකූටපර්වතයපටන් යටමහපෘථුවිය ක්‍රමක්‍ර

මයෙන් උස්වෙමින් අවුත් හිමාලප්‍රදෙශයටත් සතරමහදිවයිනට කාඩ්‍රඳුක්ඛා උසව නැගී දෙදහසක්කොදෙව්තලසලකුහුදක්ඛා නැගී සක්වලගලදිසාවට ක්‍රමක්‍රමයෙන් මිටිවෙමින්ගොස් සමුද්‍රය අසූහාර දහසක්යොදුන් ගැඹුරුවිය, පුළුලින් අසංඛ්‍යෙයපටන් සක්වලගල ට තුන්ලක්ෂ එකොලොස්දහස් පන්සියසැත්තෑයොදුන් ත්‍රියාවුත ප්‍රමාණවෙ—ඒ සත්මුහුදු වටකෙරෙමින් සිටිපර්වතමස්තකයෙහි ධෘත රාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණය, යන සිව්වරන් රජුන්ගේ උද්‍යානවිමාන කල්පවෘක්ෂ පුෂ්කරණීද්‍රව්‍යසභාමන්දිර මණ්ඩපාදින්හා අනන්තසුරසුන්දර කනකරජත මාණික්‍යප්‍රවාලාදී අනෙකරත්න විමානපන්තීන් සමාකීර්ණවිය, යුගන්ධරපර්වතයපටන් සක්වලගල දක්වා යාත්පසින් මුළු අහසපිහිටි අනන්තරීක්ෂවිමනින් ගහනවිය—

මහමෙරපටන් දෙලක්ෂසතලිස් අටදහස් එක්සියපනස්යොදුන් ගාවුතප්‍රමානතැන්ගෙවා අශවකර්ණයෙන් මෙපිටත කරදියමුහුද පිහිටියෙය, එහිජලය අවිචිමහනරකාග්නියෙන් දූවිදූවි කරපාක යටගොස් ලවනයහා ජලයසමභාගවූ බැවින් සමුද්‍රනම්විය——මහබොමැඩ පිහිටිතැන හැමටයටපිහිටි සියක්යොදුන් අවිචිනම්මහ නරකයෙහි ගිනිගෙණදිලියෙනනවයොදුන්බොලය භිත්තිංවහනී ජල නෙඟීතව ඇතුළුනිරිසතුන්දවා පිටතසියක්යොදුන් තැන්පැතිර දිවෙයි එ අවීචිමහනරකයට පිරිවරසතරදෙසින් සතරසතර බැගින් පිහිටිඔසුපත්නරකසොලසහා අවිචිමහනරකයදසදහසක් යොදුනැයි කියත්—ඒ අවිචිමහනරකය මධ්‍යපටන් දසනවදහස් සාරසියයක්ගොගෙවා හැමටකෙලවරපිහිටියෙය, ඒ ඔසුපත්නරකයෙහි මහදුක් අනුභවකරණ අනන්තනිරිසතුන්ගේ කර්මබලයෙන් අවීචිනම් ඔසුපත්නරකයෙහි දෑරනිරන්තර නිරන්තරයෙන්හැරෙසි වැහෙසි හැරුනුදෑරින් මහනිරාගිනිකදෙක් නෙඟීතවවාරාභිමුඛයෙහි නොයෙක්යොදුන් ගනන්යට මහසමුද්‍රජලයදක්වා තුහර කෙරෙයි, එකලමතෙහි සමුද්‍රජලය ආවෘතාකාරයෙන් භ්‍රමනයවෙමින් අසනිපාතසහශ්‍ර ගර්ජනාසෙයින් භීතිජනකශබ්දයෙන් වාරාභිමුඛව වැටෙයි, මතෙහි ගව්ගනන් මුහුදුජලය යාත්පසින් ඒ වලහාමුඛයකරා ඇදිඇදී දිවෙයි ඒ ජලයට පැමිනි නැව්විනාසවෙයි—සුප්පාරකනම් ශ්‍රීමහබොධිසත්වයන්වහන්සේසත්සියයක් වෙළඳුන්හා සමග නැව්නැගිගොස් පන්සියයක්කොදෙව් ඉක්ම දුක්මුලාව සාරමාසයක්මුළුලෙලෙහි පරතෙරක්නැතිව මහමුහුදමුලාවහැසිරෙමින් සත්රුවන්මුහුදදක සත්රුවනින්නැව්පුරාගෙණ වලහාමුඛප්‍රාප්ත වූ ජලයටපැමිනි සත්සියයක්වෙළඳහු අවීචිමහනරකභයින් හඬනකල්හී.

"යතොසරාමි අත්තානං යතොපත්තොසමිවිඤ්ඤුතං
නාභිජානාමි සංචිච්ච එකපාණම්පි හිංසිතං
එතෙන සච්චවජ්ජේන බිපපං නාවානිවත්තතු".

යනාදිසත්‍යක්‍රියාකලකල්හි සාරමසක්දුක්මුලාවූ ඒසත්රුවන්නැ
ව දඹදිවටහැරී ඉසිමසමහකෙලගෙන මුහුදුපිටදිවන්නාසේ එක
දවසින් මහාභාරුකච්ඡපි නම් පටුනටපැමිනගොඩින් අටදුස්බක්
ගොස් මහබොධිසත්‍වයන්ගේ සරචාරයෙහි පිහිටියේයි.......තවද
ඒ මහාසමුද්‍රයෙහි දහසක්යොදුන් පන්සියයක්යොදුන් තැන්ජලය
කැලඹී මහාරළකඳුදිවෙයි.......

මහිඳකනම් රළලෙක්සැටයොදුනක් තැන්නැගී වැටෙයි, ගඟානම්
රළලෙක්පනස්යොදුනක්තැන්නැගීවැටෙයි,රොහනනම්රළලෙක් ස
තලිස්යොදුනක්තැන්නැගී වැටෙයි,තවද වාතවේගයෙන්ජලයසව්
භාගයෙන් මහාප්‍රපාතකෙරෙමින් ජලයඅහසටනැගී මහහඬින් වැ
ටෙයි—ඒයින්ජලය උසසිනවෙමින් දිවගොස් චක්‍රවාටයෙහිවැද දස
යොදුනක් අහසට නැගී වැටෙයි——එසෙම අසවකර්ණපර්වතයෙහිද
වැදී දසයොදුනක්තැන් අහසටනැගී මහහඬින් වැටෙයි, එකල මු
හුදුගිගුම්දෙමින් සැටදහස් පන්සිය තුන්යොදුනකින් මොබපිහිටි
දඹදිවහා කොදෙව්වටකෙරෙමින් නොයෙක්සියගනන්ගවු ජලය
ගිල්මනැගී දිවෙයි හේවරගිළුම්ජලයයි කියත්.

තවද ඒ සමුද්‍රයෙහි අනගිව්දුරුබහුලවූ ප්‍රදෙසයෙහි මනුෂ්‍යදෙ
හවැනිශරීරඇති තියුනුකරමුවහත්වැනිනාසාකුර ඇතිමත්ස්‍යයන්
ගේගැලීම් ඉපිලිම්ඇතිසමුද්‍රය ඛුරමාලිනම්වෙයි-සවර්ණරාසීන්ගෙන්
බහුලබැවින් ජ්වලිතගිණිකඳක්මෙනුමඬනන්හහිරුමඬලමෙනු සව
ර්ණාභාසපැතිරෙණසමුද්‍රය අග්නිමාලිනම් වෙයි—රජතරාසීන්ගේ
බහුලබැවින්ක්ෂීරයමෙන් දධිමෙන්සෙවතොභාසපැතිරෙණ සමුද්‍ර
ය දධිමාලිම් වෙයි—නිලමානික්‍යරාසීන්ගෙන් බහුලබැවින් කුසත
නමෙනු නිලසස්‍යයන්මෙනු බබලන මුහුද කුසමාලිනම් වෙයි—
වංශරාගවෛඩූර්‍ය්‍යී බහුලබැවින් හුනවනය බටවනයමෙන් නිලො
භාෂපැතිරෙණ සමුද්‍රය නලමාලිනම් වෙයි—ප්‍රවාලරාසීන්ගේ බහු
ලබැවින් රක්තාභාෂපැතිරෙණ ප්‍රවාලසාගරයප්‍රවාලනලමාලිනම්
වෙයි.......තවද මරකත කර්ජූරවෛරං ඉන්ද්‍රනීල මහනීල ජෝති
රඝස්ඵටික පද්මරාග මුක්තාදී අනෙකවිධ රක්තනීලාදී රත්නාකුත
යෙන් අලඞ්කෘතවූ මුහුදුවැද චක්‍රවර්තිනරදෙවේන්ද්‍රයොතමන්ගේ
චක්‍රරත්නානුභාවයෙන් මුහුදුජලය සතරගවුතැන් ඉවත්කොට ජ
ල ඉව්රුකෙරෙමින් සපිරිවරින් මුහුදුබැස සිත්සේසත්රුවන්හැර
ගෙණ පෙරකලකුශලඵලගෙණයන්නාසේ අහසින්යෙත්—මෙසෙ

නරේන්ද්‍ර නාගේන්ද්‍ර දෙවේන්ද්‍රාදී ජීවිතේන්ද්‍රිය ප්‍රතිබද්ධවූ සත්වලොකයා
ගට ප්‍රතිෂ්ඨාධාරවූ මහාමෙරු යුගන්ධර චක්‍රවාට හිමවත් පෘථුවි සමු
ද්‍රාදී විශාලවූසංස්කාර වස්තූන්දක්වා වදුරම්න්වෂීාවෙන්රුකී ජීවත්
වන සත්වලෝකයන්ගේහා වෘක්ෂලතාදීන්ගේ අනිත්‍යබව ප්‍රකාශක
රවදූරණසෙක් “හොතිඛොසොභික්ඛවෙ” යනාදිපාඨය වදාලසේක.

භික්ඛවෙ, මහනෙනි; බහූනිවස්සසතානි, බොහෝහවුරුදු සිය
ගණනක් මුළුල්ලෙහිදු; බහූනිවස්සසහස්සානි, බොහෝවර්ෂදහස්ගු
ණනක් මුළුල්ලෙහිදු; බහූනිවස්සසතසහස්සානි, බොහොවූවර්ෂශත
සහස්‍රයක් මුළුල්ලෙහිදු; දෙවොනවස්සති, වැසිනොවසිද; අයං, මේ;
උක්තප්‍රකාරවූ; සොසමයො, එබඳුවිනාසකාලයෙක්; හොතිඛො, වන්
නේමය; භික්ඛවෙ, මහනෙනි; දෙවොඛොපන, වර්ෂාවවනාහි; අවස්
සනෙන, නොවස්නාකල්හි; ඔසධි, (කසා ඉඟුරු මිරිස් හරීටකාදී)
ඖෂධජාතිහුද; වන, ආරණ්‍යයද; තිණ, තාල කුනතාල හිනතාල ත
ල් පොල් ප්‍රමුඛ සැවැන්ද්‍රාදී තෘණද; වනස්පතයො, නිග්‍රොධා ස්වත්ථාදී
වනස්පතිහුද යන; යෙකෙචි, යම්කිසිබීජ ගාමාමූලබීජය ඛන්ධබීජය
එළුබීජය අග්ගබීජය බීජ,බීජයයිතියනාලද පඤ්චබීජසඞ්ඛ්‍යාතවූ; භූ
තගාමා, තෘනවෘක්ෂලතාදියෙක් ඇද්ද; තෙ, එවෘක්ෂලතාදීහු; උස්සුස්
සන්ති, මූලස්කන්ධවිටපාදිය සුස්කාවව්යලෙන්නාහුය; නභවන්ති, නැ
වත උත්පත්තිනොවන්නාහුය; භික්ඛවෙ, මහනෙනි; සංඛාරා, සංස්
කාරයො; එවං, මෙපරිද්දෙන්; අනිච්චා, අනිත්‍යයහ; භික්ඛවෙ, මහ
නෙනි; සංඛාරා, සියළුසංස්කාරයො; එවං, මෙපරිද්දෙන්; අද්ධුවා,
අස්ථිරබැවින් අද්ධුවයහ; භික්ඛවෙ, මහනෙනි; සංඛාරා, රූපස්කන්
ධය, වෙදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්
කන්ධය, යන පඤ්චස්කන්ධාදී සර්වසංස්කාරධර්මයො; එවං, මෙපරි
ද්දෙන්; අනස්සාසිකා, අස්සාසවතබැවින් සුඛාස්වාදවිරහිතය; භික්ඛ
වෙ, මහනෙනි; යාවඤ්චිදං, යම්තාක්; අනිත්‍ය, කෙලවරකොට ඇති
වෛකාරණයද; සබ්බසංඛාරෙසු, සියළුසංස්කාරයන්කෙරෙහි; නි
බ්බින්දිතුං, කලකිරෙන්නට; අලංඑව, යුක්තෙමය; විරජ්ජිතුං, නො
ඇලෙන්නට; අලං, යුක්තෙමය; විමුච්චිතුං, මිදෙන්නට; අලං, යුක්
තෙසි.

මෙසෙ ත්‍රිභුවනජනකර්ණාමෘත භවෞඝධාරධර්මදෙසනාවෙන් වි
පත්තිකර මහමෙඝයපටන් සකලසත්වවිනාසයදක්වා වදාලසෙක—ඒ
විපත්තිකරමෙඝයනම් කල්පවිනාසයට හවුරුදුලක්ෂයක් තිබියදී
දෙවසන්නිපාතයකරවණ ලොකබ්‍යූහනම් කාමාවචරදෙවතාවො
රතුපිළිහැඳ හිසඋනා හිසකෙවිදගෙණ හැඬුම්ගත්මුහුනු ඇතිව

දැනකඳුළුපිසිමින් ඉතාවිරූප අවමගුල්වෙස්ගෙණ මිනිස්ලොවක
රාඅවුත් අහසසිට එම්බාපින්වත්නි මෙයින්හවුරුදුලක්‍ෂයක්ගියතැ
න කල්පයනස්නේය,මහාසමුද්‍රය වියලෙන්නේය, මේමහපොළවද
මහමේරුද චක්‍රවාටයද ගින්නෙන්දවන්නේය, දෙව්ලොවහා බඹ
ලොවත්නස්නේය, එහෙයින් පින්වත්නි මෛත්‍රීභාවනාකරව්, කරු
ණා මුදිතා උපෙක්‍ෂා භාවනාකරව්, මැනියන්ට උපස්ථානකරව්, පි
යානන්ට උපස්ථානකරව්, කුලදෙටු නැදිමෙලන්ට පුදවු, අප්‍රමාද
ව දනාදීකුසල්කරව්, කියකියාහැව්දිති ඒ අසාමනුෂ්‍යයො හයින්
තැතිගෙණ දෙවියන්ගේ ආසන්නයට රැස්වදෙහොත්නගාගෙණ
ස්වාමිනිකල්පවිනාසය කෙසේදත්තුද, තමන්ගේස්වයම්භූඥණයෙ
න් දුත තිවූද, ගුරූපදේසයක් අසා තියවූද, එකලදෙවතාවෝ පි
න්වත්නි බොහෝකල්පස්ථායී දීර්ඝායුස්කබ්‍රහ්මරාජයන්විසින් අපළුව
නලද්දීකියමින් කෙලලක්‍ෂයක්සක්වලමෙසේ ඇවිද්දිති.

ඒකල මනුෂ්‍යයොද භූමාටුදෙවතාවොද භයින්තැතිගෙණ ඔවු
නොවුන්කෙරෙහි මුදුසිත් ඇතිව මෛත්‍රීභාවනාදීකුසල්කොට ස
දෙව්ලොව ඉපිද වායොකශිත උපදවා ධ්‍යානලාභීව බඹලොව උප
දිත් දෙවියන්තීහවුරුදුලක්‍ෂය ඉකුත්විමෙන් විපත්තිකර මහාමෙ
ඝයනැගී කෙලලක්‍ෂයක්සඛ්ල එකපැහැරවෂීකෙරෙනිඑකලමනු
ෂ්‍යයොසතුටුවක්‍ෂෙත්‍රාදියෙහිනොයෙක්ධාන්‍යාදිය වපුරතිගවයන්
කාපි යන පමනගොයම්වුකල වැසිබින්දුවකුත් නොවැටී මෙසය
අනන්තර්ධානව නොයෙක්සියදහස්ලක්‍ෂගණින් හවුරුදුවැසිනොවසි
නේය සියළුවනාන්තරවියලී සුස්කවෙයි මනුෂ්‍යයො ආහරපැන්නො
ලැබ මහත්දුක්විඳ මියදෙව්ලොව උපදිති, පුෂ්ඵඵලාදියෙන් ජීවත්
වන දෙවතාවොද යක්‍ෂයොද ගරුඩයොද නාගයොද නොයෙක්
වෙහෙසවිඳිමින් මියසදෙව්ලොව උපදිති, සතරඅපාගතසත්වයෝද
මිය*අපරාපරවෙදනිය කුසලකර්මයන් කරණකොටගෙණ දෙව්
ලොව ඉපිද සුධාභොජන අනුභවකොට සැපසේ වායොකසිනය ව
ඩාධ්‍යානඋපදවා බඹලොවඋපදිති, කිසිපිනක්නොකල උන්හා බ
ලවත්පවුකලාහු මිය පරසක්වලසතර අපායෙහි ඉපද අනන්තදුක්
විඳිත්......මෙසේ හරිහර හිරන්‍යගර්භප්‍රතිභූනිකර සර්වසුරාසුරවර
බ්‍රහ්මාලිසේවිත පාදූරවිඳුවනෙදූපසොභිතවූ භාග්‍යවත්සර්වඥරාජෝ
ත්තමයානන්වහන්සේ සකලසත්වවර්ගයාකෙරෙහිපතලමහාකරුණා
වෙන් කල්පාන්තයෙහි වනසත්වවිනාසයගෙණහැරදක්වා සර්වඥිස්
කාර ප්‍රවෘත්තිය අනිත්‍යයයි දක්වමින් සකලසත්වයන් කුසලධර්මයෙ
හි පිහිටුවා දෙවනසූයෝදාද්ගමන පාඨයවදාලසේක.

---

* ඉදිරිපසු ආත්මවලවිඳුයුතුවූ.

භික්ඛවෙ, මහණෙනි; දීඝස්සඅද්ධුනො අච්චයෙන; බොහෝදීඝකාලයක්හුගේ ඇවෑමෙන්; කදාචිකරහචි, කිසියම්දවසෙක; දුතියොසූරියො, දෙවනසූර්‍යයාතෙම; පාතුභවති, ප්‍රාතුර්භූතවේද; අයං, යථොක්තප්‍රකාරවූ; සොසමයො, එවිනාශකාලය; හොතිඛො,වන්නේමය; භික්ඛවෙ, මහණෙනි; දුතියස්සසූරියස්ස, දෙවනසූර්‍යයාගේ; පාතුභාවා, පහලවීමෙන්; යථා, යම්සේ; කුන්නදියො, එකොලොස්දහස් පන්සියපන්සත්‍යාවක් සුළුගඟාවොද; කුසුබ්භා, සුළුවූගෙප්විල් පුෂ්කරණීහු;තා,ඒ නදීපුෂ්කරණීහු; උස්සුස්සන්ති, ජලයසිඳීවියලෙන්නාහුය; විස්සුස්සන්ති, සුදුවැලිනැගී වියලෙන්නාහුය; නභවන්ති, නැවතනොවන්නාහුය; භික්ඛවෙ, මහණෙනි, එවං, මෙයාකාරයෙන්; සංඛාරා, සංස්කාරයො; අනිච්චා, අනිත්‍යයහ;භික්ඛවෙ, මහණෙනි; එවං, මේයාකාරයෙන්; සංඛාරා, සංස්කාරයො; අද්ධුවා, අද්ධුවයහ; භික්ඛවෙ,මහණෙනි; එවං,මෙයාකාරයෙන්;සංඛාරා, සංස්කාරයො; අනස්සාසිකා, සුඛාස්වාදවිරහිතයහ; භික්ඛවෙ, මහණෙනි; යාවඤ්චිදං, විනාශයකෙලවරකොට ඇති මේ කාරණයද; සබ්බසංඛාරෙසු, සියළුසංස්කාරයන්කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලංඑව, යුක්තේමැයි; විරජ්ජිතුං, නොඇලෙන්නට; අලං, යුක්තය; විමුච්චිතුං, මිදෙන්නට; අලං, යුක්තෙයි—මෙසේ සර්වානර්ථපරිහාර පූර්වාංගමනිරවශෙෂහිත සුඛප්‍රදානතත්පරනිරත්‍යාතිශය ප්‍රයෝගසම්පත්තියෙන් දෙව්මිනිසුන්සහිත සමස්තසත්වලොකයා සනහමින් "හොතිඛොසො භික්ඛවෙ" යනාදීපාඨයවදාලසේක.

භික්ඛවෙ, මහණෙනි; දීඝස්සඅද්ධුනො අච්චයෙන, දීඝකාලයක්හුගේ ඇවෑමෙන්; කදාචිකරහචි, කිසිකලෙක්හී; තතියොසූරියො, තෘතීයසූර්‍යයෙක්; පාතුභවති, පහලවේද; අයං, මේ යථොක්තප්‍රකාරවූ; සොසමයො, ඒවිනාශකාලය; හොතිඛො, වනෙනමය; භික්ඛවෙ, මහණෙනි, තතියස්සසූරියස්ස, තෘතීයසූර්‍යයාගේ; පාතුභාවා,ප්‍රාතුර්භූතවීමෙන්; යාකාචි, යම්කිසි; මහානදියොමහානදීහුකෙනෙක් ඇද්ද; සෙය්‍යථීදං, ඒකවරයහ; ගඞ්ගා, ගඞ්ගානම්ගඟය; යමුනා, යමුනාවය; අචිරවතී, අචිරවතීය; සරභූ, සරභූය; මහී, මහීය; යන මොහු; තා, එපඤ්චමහගඟාවො; උස්සුස්සන්ති, වියලෙන්නාහුය; විස්සුස්සන්ති, විශෙෂයෙන් වියලෙන්නාහුය; නභවන්ති, නැවතනොවන්නාහුය; ඒ පඤ්චමහානදීහු කෙසෙසම්භූතශුෂ්කයදාන වෙද්දයත්.

මහමෙරට දකුණුභාගයෙහි දසදහසක්යොදුන් දඹදිවපිහිටියේය, එයින්මනුෂ්‍යයන්ගේ අපුන්‍යතාවයෙන් සාරදහසක්යොදුන් සමුද්‍රග්නවිය, තුන්දහසක්යොදුන් හිමවත්පර්වතපිහිටියේය, තුන්දහසක්යොදුන් මනුෂ්‍යවාසවිය, එයින්මනුෂ්‍යවාසවූ දඹදිවහා ඒ කාබඹවූ හිමවත්පර්වතක්‍රමක්‍රමයෙන් උස්උස්ව උසින්පන්සියයක් යොදුන්විය, ගන්ධමාදනකෛලාස චිත්‍රකූටාදී අනන්තදෙවයක්ෂනිවාසභූතවූ සවාසූදහසක් පර්වතකූටයෙන්හා සිසිරණීරධාරාපූරිත පන්සියයක්ගංගාවෙන්හා අනොතප්තාදී සත්තමහසරින් සොභාමානවිය- ඒ අනොතප්තවිල දෙසියයක් දෙසියයක්ගව් දිගපුළුල ඇත්තේය, මානික්‍යමයමනොඥවූ පාගැටපතාති ඇත්තේය, සොභමානවූ එළිකමය නහණතොට ඇත්තේය, බුදුපසේබුදුරහතුන්වහන්සේ එතොටින්පැන්නාහනසේක, ඉර්ධිමත් සෘෂිහුදෙවියන්හා යක්ෂයොද පැන්නාහයෙති, ඒ විලසතරදේසින් පිහිටිපර්වතසතරින් දෙසියයක් යොදුන් උසඇති ස්වර්ණමයසුදර්ශණපර්වතය කාකමුඛතුඩාකාරයෙන් විලවසා සූර්යතාපයවලකමින් සිටියේය, සර්වරත්නමය චිත්‍රකූටපර්වතයද, අජනවර්ණවූ කාලකූටපර්වතයද, රක්තවර්ණවූ ගන්ධමාදනපර්වතයද, ඒ ඒ දෙසින් සොභාමත්ව සිටගත—මූලගන්ධාදී සර්වසුගන්ධයෙන් ගන්ධිතවූ ඒ ගන්ධමාදනපර්වතයෙහි බුද්ධප්‍රත්‍යෙකබුඬමහරහතන්වහන්සෙලා වැඩවසන නන්දමූලකනම්වූ ස්වර්ණගුහාවෙක, මැණික්ගුහාවෙක රජතගුහාවෙකැයි අසුන්පැනවූගුහාත්‍රයෙක්විය, ඒ මැනික්ගුහාවාරයෙහි යොදුනක්පමන උසඇති මඥ්ජුසාකනම් වෘක්ෂයෙක්විය, ඒ වෘක්ෂයෙහි දියගොඩ ඇතිනාක් සියළු මල්පිපෙයි, පසෙබුදුන්වඩනාදවස ඒ රුකඳදිරිපිට සර්වරත්නමය මණ්ඩපමාලයෙන්සැදියෙයි,එහිඑක්වාතයෙක්හ මදිමින්යෙයි, එක්වාතයෙක් සත්රුවන්වැලිසමකෙරෙයි, එක්වාතයෙක් අනොතප්තවිලින් පැන්ගෙණවුත් ඉසිමින්යෙයි, එක්වාතයෙක් සර්වසුගන්ධවෘක්ෂලතාදීන්ගේ මල්ගෙණවුත් රුස්කරමින් අතුරමින්සමකෙරෙයි, ප්‍රත්‍යෙකබුඬවරයො එහි ප්‍රඥප්ත ආසනයෙහිවැඩහිඳ ධ්‍යානසමවදිත්.

ඒ අනොතප්තවිලින් සතරදිගට සිංහමුඛය, අශ්වමුඛය, හස්තිමුඛය, වෘෂභමුඛයයි ගඞ්ගාජලයනික්මෙන මුහුනුසතරෙක්විය, පූර්වොත්තර පශ්චිමදිගටගීය ගඞ්ගාඑකිනෙකට නොපහැරතුන් යලක් අනොතප්තයපැදකුනුකොට පූර්වොත්තර පශ්චිමදික්බලාගොස් අමනුෂ්‍යපථයටවැදඑයින් සමුද්‍රගතවිය—මේ දකුනුදිගට නික්මුනුගඞ්ගාව අනොතප්තවිල තුන්යලක්ප්‍රදක්ෂිනාකොට දකුදිගටහැර මහගල්තලයක්මධ්‍යයෙන් සැටයොදුනක්තැන් සෘජුවගොස් පර්වතයකවැදී අහසටනැගී ගව්වටමැතික්කඳක්සේ සැටයොදුනක්

තැන් අහසින්ගොස් තියග්ගලානම් ගල්තලයෙහිවැදී සැරවේග යෙන් ගලබිඳගෙණ පනස්යොදුනක්තැන්ගොස් එගල්ඉවුරබිඳ ගෙණ මහගල්තලයක්පිටින් සැටයොදුනක්තැන්ගොසින් එයින් සතරපර්වතයකවැදී බිඳගෙණසැටයොදුනක්තැන්උමගින්ගොස් සරස්වසිටිවිස්කම්භනම්පර්වතය පැහැරහස්තාඞ්ගුලිපසක්මෙන් ජලධා රාපසක්බෙදී ගඞ්ගායමුනා අචිරවතී සරභූ මහී යන නම්න්ප්‍රසිද්ධවූ දඹදිවරාජධානිජනපද සරහාගණ සමුද්‍රගතවූහ.

ඒ අනොතප්තවිල තුන්යලක් ප්‍රදක්ෂිණකොට දකුනටහැරුනු තැන්දක්වා ආවෘතගඞ්ගානම්විය, සැටයොදුනක්ගල්තලය පිටින් ගොස් පර්වතයටවැද අහසට නික්මුනුතැන්දක්වා කන්හගඞ්ගානම් විය,අහසින්සැටයොදුනක්ගියතැන් ආකාශගඞ්ගානම්විය, තියග්ගා ලනම්ගල්තලයගැඹුරුකොට බිඳගෙණ පනස්යොදුනක්ගියතැන් තියග්ගලානම් පුෂ්කරණීවිය, පොකුනඉවුරබිඳගෙණ ගල්තලායෙ හි සැටයොදුනක් ගියතැන් බහලගඞ්ගානම්විය, ඝණබහලපෘථුවි යබිඳගෙණ උමගින්සැටයොදුනක්ගියතැන් උම්මග්ගගඞ්ගානම් විය, මෙසේ ආවෘත්නම්ගඞ්ගාව දකුනබලා ආතැන්පටන් එක්දහස් එක්සිය සැටගෞවක්හිමවතගෙවා සෘජුවඅවුත් විජ්ඣනම්පර්වතය පැහැර ජලධාරාපසකවගඞ්ගා යමුනා අචිරයතී සරභූ මහී යන න මින් ප්‍රසිද්ධවූහ, හිමවතපූර්වෝත්තර පශ්චිමමහගඞ්ගාත්‍රයහා මේපඤ්ච මහාගඞ්ගාවෝ වියලිසූස්කවන්නාහුය.

භික්ඛවෙ, මහනෙනි; සංඛාරා, සංස්කාරධර්මයෝ; එවං, මෙයා කාරයෙන්; අනිච්චා, අනිත්‍යයහ; භික්ඛවෙ, මහනෙනි; සංඛාරා,ස ංස්කාරයෝ; එවං, මෙයාකාරයෙන්; අද්ධුවා, අස්ථිරබැවින්; අද්ධුව හය, භික්ඛවෙ, මහනෙනි; සංඛාරා, සංස්කාරධර්මයෝ; එවං, මෙ යාකාරයෙන්; අනස්සාසිකා, ආස්වාදනැතිවනබැවින්; සැපාස්වාදවි රහිතයහ; භික්ඛවෙ, මහනෙනි; යාවඤ්චිදං, යම්තාක් අනිත්‍යකෙල වරකොට ඇති මේ කාරණයද; සබ්බසංඛාරෙසු, සියළුසංස්කාරය න්කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලංඑව, යුක්තේමය; විරජ්ජිතුං, නො ඇලෙන්නට; අලං, සුතුය; විමුච්චිතුං, මිදෙන්නට; අලං, යුක්තේමය ~~~ මෙසේ තෘතියසූර්‍ය්‍යා උදකල්හි, එක්සූර්‍ය්‍යයෙ ක් උදවෙයි,එක්සූර්‍ය්‍යයෙක්හස්තගතවෙයි, එක්සූර්‍ය්‍යයෙක්නභොම ධ්‍යගතවෙයි, සතරමහදිවයින අවිච්ඡින්න සූර්‍ය්‍යතාපවෙයි, පළමුසූර් ය්‍යවිමානයෙහි හුන්සූර්‍ය්‍යදිව්‍යපුත්‍රතෙම ග්‍රීෂ්මාභිතප්තවහයින් තැ තිගෙණ ධ්‍යානවඩා බ්‍රහ්මලොකූපගතවෙයි, සප්තසූන්‍යසූර්‍ය්‍යමණ්ඩ ලප්‍රභාස්වරතරව අහසසැසිරෙයි, ශක්‍රසුයාමාදී සියළුදෙවියො වා යො කසිණසමාපත්ති උපදවා ධ්‍යානයෙන්මිය බ්‍රහ්මලොකූපගත

වෙයි, පරිත්තාභාදී මතුමත්තෙහි බඹලොව උපදිත්, මෙසේවන සකලසත්ත්වවිනාසය බුදුඇසින් දක්නාත්‍රිභුවනෛක තිලකසකලඥෙය සාගරපාරගතාශේෂ ගුණරත්නමණ්ඩිරායමානවූ භාග්‍යවත්සර්වඥරාජොත්තමයානන්වහන්සේ තෘතීයසූර්‍ය්‍යොද්ගමනය වදාරණසේක්හොති ඛො සො භික්ඛවෙ යනාදී පාඨය වදාලසේක.

කදාචිකරහචි, කිසිකලෙක්හි; චතුත්ථොසූරියො, සතරවණසූර්‍ය්‍යයෙක්; පාතුභවති, පහලවේද: අයං, මේ යථොක්තවූ; සොසමයො, එවිනාසකාලය; හොතිඛො, වන්නේමය; භික්ඛවේ, මහණෙනි; චතුත්ථස්සසූරියස්ස, සතරවනසූර්‍ය්‍යයාගේ; පාතුභාවා, පහලවීමෙන්; යෙ ඉමෙමහාසරා,යම් ඒ මහවිල්නම්වේද; යතො, යම්හෙයකින්; ඉමා මහානදියො, මෙමහනදිහු; සම්භවන්ති,පහලවේද; සෙය්‍යථීදං, ඒ කවරේද; ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී යනමොහු; තා, එපඤ්චමහාසරින්වැටුනාවූ; ඒ සත්තමහාවිල්හු; උස්සුස්සන්ති, පනස් පනස්යොදුන් දිගපුළුල ගැඹුරඇති ජලයසිඳීවියලෙන්නාහුය; විස්සුස්සන්ති,ගින්නෙන්රත්කලබඳුන්සෙයින්උෂ්ණනැගී වියලෙන්නාහුය; නභවන්ති,නැවතප්‍රකෘතිනොවන්නාහුය:භික්ඛවෙ,මහණෙනි; සංඛාරා,සංස්කාරයො;යට අවිචියෙහිපටන් මහාබ්‍රහ්මනම් බඹලොවදක්වා ගැසීසිටි පඤ්චස්කන්ධනිශ්‍රිතවූ සියළුසත්වයො මරනින් මැකෙන්නාහ; එසේහෙයින්; එවං, මෙයාකාරයෙන්; අනිච්චා, අනිත්‍යයහ; භික්ඛවෙ, මහණෙනි; සංඛාරා, සංස්කාරයො; එවං, මෙයාකාරයෙන්; අද්ධුවා, අස්ථිරයහ; භික්ඛවෙ, මහණෙනි; සංඛාරා, සංස්කාරයො; එවං, මෙයාකාරයෙන්; අනස්සාසිකා, සාතස්වාදවිරහිතයහ; භික්ඛවෙ, මහණෙනි; යාවඤ්චිදං, විනාසකාලයකෙලවරකොට ඇති මෙකාරණයද; සබ්බසංඛාරෙසු, සියළුසංස්කාරයන් කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නාට; අලංඑව, යුක්තේමය; විමුච්චිතුං, මිදෙන්නාට; අලං, යුක්තේමය.

ඒ සප්තමහවිල්නම් අනොතප්තවිලය,කණ්ණමුණ්ඩවිලය,රථකාරවිලය,ඡද්දන්තවිලය,කුනාලවිලය;සිංහප්‍රපාතවිලය,මන්දාකිනිවිලය,එයින් අනොතප්තවිල ආවෘතගඞ්ගාදෙලොසවලලකින්හා පර්වතසතරකින් සොභමානවිය, ඡද්දන්තනම්විලමධ්‍යයෙහිදොළොස්යොදුනක්තැන් ආදර්ශතලයක්මෙන් ප්‍රසන්නොදකවිය, එදොළොස්යොදුන් ජලය සිසාරාසතරගවු පුළුලැති කල්හාරනම් සුපුෂ්පිතහෙල්මැලිවනයෙක්පිහිටීයේය, එසේමසතරගවු සතරගවු පුළුලැති නිලොත්පලවනය, රත්තොත්පලවනය, සෙවතොත්පලවනය, නෙළුම්වනය,සුදුනෙළුම්වනය,කුමුදුනාලවූ ඇඹුලවනය,මෙකීසියලෙලන්හිවූ

මිශ්‍රකවනයසිජලජපුෂ්ප අටවනයෙක්පිහිටියේය.—ඊට අනතුරුවඇතුන්වපස්නයාහැකිතරම් ජලයෙහි ඒ දෙතිස්ගව්පුළුලැති අටවනය සියාරාසතරගව්පුළුලැති රත්හැල්වනයෙක්පිහිටියෙය,මුළුම හත්දඹදිවවැසියො කරල්කපාඇද පියාත්නිමාලියනොහැකිවෙයි, ඒරත්හැල්වනය සියාරාජලයකෙළවරනීලවර්ණරක්තශ්වෙත සුරභි සුගන්ධ මකරන්ද පූරිතකුසුමසමාකීර්ණවූ, සතරගව්පුළුලැති ගොරහඵලාවදමරුත්මාලාදී කච්ඡුරකවත්ථුකත්තමාලාදී සුළුගස්වනයෙක් පිහිටියෙය.—ඉන්පිටත් සතරගාවු සතරගාවු පුළුලැති නානාකදලිවනයෙක් පිහිටියේය, ඊට අනතුරුවම සැලතාලිප්‍රමාන ඵලඇති පනසොරු මානාවනයපිහිටියෙය, මෙසෙඉන්පිටත නාරඟ එරඟ සනාතිරාම්බ්‍රපීළුකාදී නානාමධුරඵලහරිතවනයාදී සුවිසිවනයෙක්හා සවර්ණවර්ණපර්වතයද, ජම්බුල්වනයහා අඹමිශ්‍රකවනය පිහිටියෙය, මෙහැමවනයන්වටකෙරෙමින් හුනවනයක්පිහිටියෙය, මෙසෙයථොක්තප්‍රකාරවූ සුවිසිවනයෙක්හා සවර්ණවර්ණපර්වතාදී සප්තමහාපර්වතයෙකින් ජඅදනනවිලසොභාමානවිය.

මනදුකිනිනම්විල මධ්‍යයෙහි පස්විසියොදුනක් තැන්පමන ආදසතලයක්මෙන් ප්‍රසන්නොදකයවිය, ඉන්පිටත ඇතුන්පොවනතරම් ජලයෙහි දෙගවුපමනපුළුලැති සුදුනෙළුම්වනයෙක් එජලයසියාරාපිහිටියෙය, එසෙමදෙගවුපමනපුළුලැති රත්නෙළුම්වනයෙක් එජලයසියාරා පිහිටියෙය, එසෙමදෙගවුපමන රක්තකුමුදුවනය, සෙවතකුමුදුවනය, රත්තොළ්ලවනය, නිලොත්ඵලවනය සෙවතොත්ඵලවනයයි, සත්වනයෙක්පිහිටියෙය, එහිසරස දුවන නෙළුම්දලිනගුලිස්පුමානවෙයි පුරුක්ගැටමහහෙරිමුඛ ප්‍රමානවෙයි, මල්කැකුළුමහසටප්‍රමානවෙයි, පිපුනුමල්රථසක් ප්‍රමානවෙයි, වාතප්‍රහරණයෙන් සුවදමකරන්ද කෙසුරුනගා පියුම්පත්‍රයෙහි හෙලයී, එහිජලබිනුහිමෙත් කැටිවෙයි, සූය්‍යතාපයෙන් කැකැරී ගින්නෙන්ඉදුනුයකඩගුලිමෙන් සොභාමත්ව පොකුරුම්යයි දිව්‍යරසවත්වතිබෙයි, හිමවතවසන උපොසථජද්දන්තනාගේන්ද්‍රයො එපොකුරුම්ගෙණ පසෙබුදුන්ටපිළිගන්වත්, ඉර්ධිමත්හුගෙණවලදත් සිඛව්දන්දරයො අහසින්ගෙණයෙත්.—ඒ සතවනය සියාරාදෙගවුපුළුලැති උක්මල්සාකරල් ඇති සුවදරත්හැල්වනයෙක් පිහිටියෙය, ඊපිටතදෙගවුපුළුලැති, තිඹිරු, සකාවනය, කකාරිවනය, ලාබුවනය, කුම්බුවනය, ආදිවැල්වනයපිහිටියේය.

ඒ සුවිසිගවුපුළුලැති දෙලොස්වනය සියාරාදෙගවුපුළුලැති පූගවෘක්ෂප්‍රමාන මගඋක්වනයෙක් පිහිටියෙය, හිමවතවසන හස්තිනාගෙන්ද්‍රයො ඒ මගඋක්රුක්ඛද ගල්පිටහෙලා පසින්මඩිති එකල

උත්පැනි හුළුගල්පොකුණු පිහිටිගල්වෑසිලිපිරෙයි, හේන්ද්‍රයෂිතාප
යෙන් වියලිකිරපාසානපිඩුසෙයින්සුදුවණ්වදිව්‍යරසවත්හිබෙයි,හස්
තිනාගයො එම්ඛුරපිඩුගෙණ පඝෙබුදුවරයන්වහන්සේලාට පිළිගන්
වත්——ඒ උක්වනය සිසාරාදෙගවුපුළුලැති කදලිවනයෙක්පිහි
ටියෙය, ඒ කදලිවනය සිසාරාදෙගවුපුළුලැති ඌරුමානාම්බ්‍ර ජම්බු
ජඹීර රෙරගවරාඹලසන්නීර පූගමුද්‍රීකාදී තුනතාලනම් දෙතුලාදී
නානාමධුරඵලහරිත වෘක්ෂලතාවනයෙක් පිහිටියෙය, මෙසෙහෙ
යින් එම නඳුනිනිවිල සොභමානවිය——ඒ හිමාලවනයෙහි මේ
දඹදිවට සලකුනුවූ සියයක්යොදුන් උසඇති දඹරුකෙක්විය, සත
රදිගටගිය අතුසතරහා අතුසතරසාඛාමණ්ඩලයවට තුන්සියයක්
යොදුන්විය, අතුසතරින්හා රුකින්මහත්ගඞ්ගානිති වැසෙයි, ක
ලපස්ථායුකවූ ඒ දඹරුකමාදියකලසා නිත්‍යමෘතඵලහරිතවෙයි, ඒ
දඹරුකින්වැහුනු ගඞ්ගාවෙහි දෙගංඉවුරුගඟබඩවැටු ඵලබීජයෙ
න් සුවණ්ණාංකුරනැගෙයි,ගෙසුවණ්ණාංකුරක්‍රමයෙන් යහින්ගොස්මුහු
දුවෙරලටපැමිනා මාගැහිවූ ජම්බොනදසුවණ්ණයයි ලොකසම්මතවිය.

ඒ හිමවත්හි දෙලොස්ගවුතැන් සියළුසතුන්තැතිගන්වමින් සිං
හනාදකරණ සිංහයන්ගෙන්හා අහසින්යන ඡද්දන්ත උපොසථ ව
ලාහක අශ්වයන්ගෙන්හා මධුරනාදකරණකරවීක සතුන්ගිරාමයූ
ර තිඳුරුනාරිලාතාදීන් සොභාමත්විය, හැල්වනපියුම්වනාදියෙහි
හැසිරෙණසුවණ් හංසාදීන්ගෙන් සමාකීණ්විය, මෙසෙහිමාල විස්
තරයකියත්——බෙහෙවපොලොන්නරුපුර පරක්කමබාහුනම්රජ
හිමාලවිස්තරය අසාමරනාසන්නයෙහි බුදුහසුන්වැච්කුශලානුභා
වයෙන් හිමාලයෙහි කල්පස්ථායුකව නාරදේවනම් භූමාටුදේවතා
වෙසවඉපද එවුහුමෙත්‍රිබුදුන්දකිතෝමැයි.

මෙසේ සකලසත්වමනොහර දර්ශණශ්‍රිසොභාසමූප සොභිතවෘක්ෂ
පර්වතගඞ්ගාහැලිදෙලන් වැලිතලාගල්තලා ලියමඩුළුගල්ගුහා රු
ක්සෙවනම්ණ්ගුහා රංගුහාදියෙන්හා නිත්‍යමෘතඵලහරිත නො
යෙක්වනපන්තියෙන් සැදුම්ලත් අනොතත්ත ඡද්දන්ත මන්දකිනී
රථකාර කර්ණමුණ්ඩ සිංහප්‍රපාතය යන සප්තමහවිල්ම චතුර්ථ සූ
යෙෂිාත්ගමනයෙන් සුස්කවවියලෙන්නාහුය——මෙසෙ චතුර්ථ සූ
යෙෂිාත්ගමනය ගෙණහැරදක්වා සර්වසංස්කාරයන්ගේ අනිත්‍යතා
වප්‍රකාශකොට සියළුසත්වයන්දූනසීලාදී කුසලධර්මයෙහියොදා පඤ්ච
න සූයෙෂිාත්ගම්නයදක්වා වදාරණසේක්——"භොතිබො සො භික්
ඛවෙ" යනාදී පාඨය වදාලසේක.

භික්ඛවෙ, මහනෙති; දිඝස්සඅද්ධුනො අච්චයෙන,දීඝිකාලක්හුගේ
ඇවෑමෙන්; කදාචිත්රහච්, කිසිකලෙක්හී; පඤ්චමොසුරියො, පඤ්ච

නාසූයසීයෙක්; පාතුභවති, පහලවේද; අයං, මෙයපොක්තප්‍රකාරවූ;
සො සමයො,ඒවිනාසකාලයතෙමෙ;හොතිඛො, වන්නෙමය;හිසබ
වෙ, මහනෙති; පඤ්චමස්සසූරියස්ස, පස්වැනිසූයසීයාගේ; පාතුභා
වා, පහලවීමෙන්, යොජනසතිකානිපි, සියක්යොදුනුදු; මහාසමුද්
දේ, මහසමුද්‍රයෙහි; උදකානි, ජලස්ඛන්ධයො; ඔගච්ඡන්ති, ඌනභා
යටයෙති; ද්වියොජනසතිකානිපි, දෙසියයක්යොදුනුදු; මහාසමුද්දෙ,
මහසමුද්‍රයෙහි; උදකානි, ජලස්ඛන්ධයො; ඔගච්ඡන්ති, ඌනභාවයට
යෙති; තියොජනසතිකානිපි, තුන්සියයක්යොදුනුදු;මහාසමුද්දෙ,ම
හාසමුද්‍රයෙහි; උදකානි, ජලස්ඛන්ධයො; ඔගච්ඡන්ති, ඌනභාවයට
යෙති; චතුයොජනසතිකානිපි, සාරසියයක්යොදුනුදු; මහාසමුද්දෙ,
මහසමුද්‍රයෙහි; උදකානි, ජලස්ඛන්ධයො; ඔගච්ඡන්ති, ඌනභාවයට
යෙති; පඤ්චයොජනසතිකානිපි, පන්සියයක්යොදුනුදු; මහාසමුද්
දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්ඛන්ධයො; ඔගච්ඡන්ති, ඌන
භාවයටයෙති; ඡයොජනසතිකානිපි, සසියයක්යොදුනුදු; මහාමුද්දෙ,
මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්ඛන්ධයො; ඔගච්ඡන්ති, ඌනභාවය
ටයෙති; සත්තයොජනසතිකානිපි, සත්සියයක්යොදුන්; මහාසමුද්
දේ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්ඛන්ධයො; ඔගච්ඡන්ති, ඌන
භාවයටයෙති; අට්ඨයොජනසතිකානිපි, අටසියයක්යොදුනුදු; මහාස
මුද්දෙ, මහසමුද්‍රයෙහි; උදකානි, ජලස්ඛන්ධයො; ඔගච්ඡන්ති, ඌ
නභාවයටයෙති; නවයොජනසතිකානිපි, නවසියයක්යොදුනුදු; ම
හාසමුද්දෙ, මහසමුද්‍රයෙහි; උදකානි, ජලස්ඛන්ධයො; ඔගච්ඡන්
ති, ඌනභාවයටයෙති; සහස්සයොජනිකානිපි, දහසක්යොදුනුදු; ම
හාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්ඛන්ධයො; හෙවත්
ක්ෂීරසාගරය, නිලසාගරය, රක්තසාගරය, සවර්ණසාගරයයි කියා ම
හමෙර සතරදෙසින් ඒඒ වර්ණගෙණ සිටිසමුද්‍රජලයො; ඔගච්ඡන්
ති, ඌනභාවයටයනනාහුය; දසසහස්සයොජනිකානිපි, දසදහසක්
යොදුනුදු; මහාසමුද්දෙ, මහසමුද්‍රයෙහි; උදකානි, ජලය; ඔගච්ඡන්
ති, ඌනභාවයටයෙති; වීසතිසහස්සයොජනිකානිපි, විසිදහසක්යො
දුනුදු; තිංසතිසහස්සයොජනිකානිපි, තිස්දහසක්යොදුනුදු; චත්තා
ලිසසහස්සයොජනිකානිපි, සතලිස්දහසක්යොදුනුදු;පඤ්ඤාසසහස්ස
යොජනිකානිපි, පනස්දහසක්යොදුනුදු; සට්ඨිසහස්සයොජනිකානි
පි, සැටදහසක්යොදුනුදු; සත්තතිසහස්සයොජනිකානිපි, සතතදහ
සක්යොදුනුදු; අසීතිසහස්සයොජනිකානිපි, අසූදහසක්යොදුනුදු;ම
හාසමුද්දෙ, මහසමුද්‍රයෙහි; උදකානි, ජලස්ඛන්ධයො; ඔගච්ඡන්
ති, ඌනභාවයටයෙති; චතුසහස්සයොජනිකං, සාරදහස්ක්යොදුනුදු;
මහාසමුද්දෙ, මහසමුද්‍රයෙහි; උදකං, සිඳිඉතිරිවූජලය; සණ්ඨාති, සිටි
නෙය; තිසහස්සයොජනිකම්පි, තුන්දහසක්යොදුනුදු;වීසහස්සයො

ජනිකම්පි, දෙදහසක්යොදුනුදු; සහස්සයොජනිකම්පි, දහසක්යොදු
නුදු; මහාසමුද්දෙ; මහසමුද්‍රයෙහි; උදකං, රත්වූජලය; සණ්ඨාති, සි
ටින්නේය; නවශතයොජනිකම්පි, නවසියයක්යොදුනුදු; මහාසමුද්
දෙ, මහසමුද්‍රයෙහි; උදකං, උදකය; සණ්ඨාති, සිටින්නේය; පඤ්ඤාස
යොජනිකම්පි, පනස්යොදුනක්පමනද; සත්තතාලම්පි, සත්තලක්
පමනද; තලෙක්නම් අසූරියන්තල්රුකෙක්ප්‍රමාණය, කියත්; එසේ
ම ඡතාලම්පි, සතලයකුදු; පඤ්චතාලම්පි, පස්තලයකුදු; චතුතාලම්
පි, සතරතලයකුදු; තිතාලම්පි, තුන්තලයකුදු; ද්විතාලම්පි, දෙතල
ලයකුදු; තාලමත්තම්පි, එක්තලයක්ප්‍රමාණද; මහාසමුද්දෙ, මහසමු
ද්‍රයෙහි; උදකං, මහමෙරසිසාරාසිටිය සත්තමහාසාගරජලයහා අසව
කණ්පර්වතය, පටන් සතිස්ලක්‍ෂඅසදහස්තුන්සිය පනස්යොදුන් ච
ක්‍රවාටපර්වතය හාත්පසින් ඇතුලතපැහැර සුවාසුදහසක් යොදුන්
ගැඹුරුවසිටි අගෝමහසමුද්‍රජලය; ක්‍රමයෙන්සිඳී සප්තතාලවෘක්‍ෂ
ප්‍රමාවූ උදකය; සණ්ඨාති, සිටිනෙය; සත්තපොරිසම්පි, සප්තපොරිස
ප්‍රමාණවද; මහාසමුද්දෙ, මහසමුද්‍රයෙහි ජලය; සණ්ඨාති, සිටිනේ
ය; පොරිසයෙක්නම්, පස්රියනක්හොනැගී අතක්උසයයිකියත්; එ
සේම ඡපොරිසම්පි, සපොරිසයෙක්ද; පඤ්චපොරිසම්පි, පඤ්චපොරි
සයෙක්ද; චතුපොරිසම්පි, සතරපොරිසප්‍රමාණවද; තිපොරිසම්පි,
පොරිසත්‍රයෙක්ද; ද්විපොරිසම්පි, පොරිසවයෙක්ද; පොරිසම්පි, පූ
රුෂප්‍රමාණවද; අඩ්ඪපොරිසම්පි, අර්ධපුරුෂප්‍රමාණවද; කටිමත්තම්
පි, කටිප්‍රමාණවද; ජන්නුකමත්තම්පි, දනක්පමනද; ගොප්ඵකමත්
තම්පි, ගොප්මසමාත්‍රවද; මහාසමුද්දෙ, මහසමුද්‍රයෙහි; උදකං, ජල
ය, සණ්ඨාති, සිටිනෙය; භික්ඛවෙ, මහණෙනි; සෙය්‍යථාපි, යම්සේ
සරදසමයෙ; බිනරවජ්යන සරදසමයෙහි; ථූලඵුසිතකෙ, මහත්
මහත්වැසිපොදවැදගැනීම් ඇති; දෙවෙවස්සන්තෙ, වැසිවස්නාක
ල්හි; තත්ථතත්ථ, ඒ ඒ තන්හි; ගොපදෙසු, ගවකුරවල්හි; උදකානිසි
තානිහොන්ති, ජලයොපිරීසිටින්නාහුවෙද්ද; භික්ඛවෙ, මහණෙනි;
පඤ්චමස්සසූරියස්ස, පස්වනසූර්යයාගේ; පාතුභාවා, පහලවීමෙන්;
අඩගුලිපබ්බතෙමනමත්තම්පි, ඇඟිලිපුරුක්ගලාතෙමනමාත්‍රයකු
දු; මහාසමුද්දෙ, මහසමුද්‍රයෙහි; උදකංනහොති, ජලයනැතිවන්
නේය; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙසේ; සංඛාරා, ඉන්ද්‍රියානින්ද්‍රියප්‍ර
තිබද්ධසර්වසංස්කාරයො; අනිච්චා, අනිත්‍යයහ; භික්ඛවෙ, මහණෙ
නි; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, සර්වසංස්කාරයො; අද්ධුවා, අස්
ථිරබැවින් අචයහ; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙයාකාරයෙන්;
සංඛාරා, සර්වසංස්කාරයො; අනස්සාසිකා, ආශ්වාසතබැවින්; සුඛා
ස්වාදවිරහිතයහ; භික්ඛවෙ, මහණෙනි; යාවඤ්චිදං, යම්තාක් අනිත්‍ය

කෙලවරකොටඇති; මේ කාරණයෙද;සබ්බසංඛාරෙසු,සියළුසංඛිස්කාරයන්කෙරෙහි; නිබ්බින්දිතුන්, කලකිරෙන්නට; අලංඑව, යුක්තෙමය; විරජ්ජිතුං, නො ඇලෙන්නට; අලං, සුදුසුවන්නේමය; විමුච්චිතුං, වස්තුකාමක්ලේසකාමයෙන්මිදෙන්නට; අලං,සුදුසුවන්නේය.

මෙසේසර්වමාරවාරණ කෙසරිනාදායමානවූ සර්වඥරාජෝත්තමයානන්වහන්සේ පස්වැනිවූසූර්‍ය්‍යෝත්ගමනයෙන් ලොකවිනාසකාරණය ගෙණහැරදක්වා අසූසාරදහසක්යොදුන් ගැඹුරුවූමුහුදුතුහරය දක්වමින් අනිත්‍යප්‍රකාසකොට සවනසූර්‍ය්‍යෝත්ගමනය ගෙණහැරදක්වනසේක් "හොතිඛො සො භික්ඛවෙ" යනාදී පාඨයවදාළසේක.

භික්ඛවෙ, මහණෙනි, දීඝස්සඅද්ධුනොඅච්චයෙන, දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන්; කදාචිකරහචි, කිසිකලෙක්හි; ඡට්ඨොසූරියො, සවනසූර්‍ය්‍යයෙක්; පාතුභවති, පහලවෙද; අයං, මේයථොක්තප්‍රකාරවූ; සොසමයො, ඒවිනාසකාලයතෙම; හොතිඛො, වන්නෙමය; භික්ඛවෙ, මහණෙනි; ඡට්ඨස්සසූරියස්ස, සවනසූර්‍ය්‍යයාගේ; පාතුභාවා, පහලවීමෙන්; අයංමහාපඨවි, මේ මහාපෘථිවියද; සිනෙරුපබ්බතරාජා, සිනෙරුපර්වතරාජයාද; යනදෙදෙන; ධූපායන්ති, තෙමෙදුම්නැගෙයි; සන්ධූපායන්ති, හාත්පසින්දුම්නැගෙති; සම්පධූපායන්ති, එකමධූමස්කන්ධයක්මෙන් විසෙසයෙන්දුම්නැගෙති; භික්ඛවෙ, මහණෙනි, සෙය්‍යථාපි, යම්සෙ; ආලිම්පිතො, ගිණිදල්වනලද්දාවූ; කුම්භකාරපාකො, කුඹල්පාකයහෙවත් කුම්භකාරයන්ගේ වලන්පට්ටලය;පඨමපඨමං, ප්‍රථමප්‍රථමවධූපෙති, දුම්නැගෙද; සන්ධූපෙති, හාත්පසදුම්නැගේද; සම්පධූපෙති, එකමධූමජ්වාලයක්මෙන් විසෙසයෙන්දුම්නැගේද; භික්ඛවෙ, මහණෙනි, එවමෙවඛො, එපරිද්දෙන්ම, ඡට්ඨස්සසූරියස්ස,සවනසූර්‍ය්‍යයාගේ;පාතුභාවා, පහලවීමෙන්; අයංමහාපඨවි, යටින්සක්වලගලපටන් මේමහාපෘථිවියද; සිනෙරුපබ්බතරාජා, ශක්‍රභවනයදක්වාමහමෙරුපර්වතරාජයාද; ධූපායන්ති, උෂ්ණාභිතපනවසකියාදුම්නැගෙති; සන්ධූපායන්ති, හාත්පසින්දුම්නැගෙති; සම්පධූපායන්ති, එකමධූමජ්වාලාවක්මෙන් විසෙසයෙන්දුම්නැගෙති; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, සංඛිස්කාරයො; අද්ධුවා, අද්ධ්‍රුවයහ; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, සංඛිස්කාරයො; අනස්සාසිකා, ආනාස්වාදබැවින්; සුඛාස්වාදවිරහිතයහ; භික්ඛවෙ,මහණෙනි; යාවඤ්චිදං, යම්තාක් අනිත්‍යකෙලවරකොට ඇතිමේකාරණයෙද; සබ්බසංඛාරෙසු, සර්වසංඛිස්කාරයන්කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලංඑව, යුක්තෙමය; විරජ්ජිතුං, නොඇලෙන්නට; අලං, සුදුසුය; විමුච්චිතුං, සර්ව

සංස්කාරයන්කෙරෙන් මිදෙන්නට; අලං, යුක්තේමය ~~~ ශෙයේ
බුද්ධත්වාශ්‍රවක්ෂයකරාභිඥානාන්තරාය කරධර්මනෛර්‍යාණික ප්‍රති
පත්‍ය යනාවතුවෛශාරද්‍යඥානයෙහි විශාරදවපවත්නාවූඥානග ති
ඇති සර්වඥරාජෝත්තමයානන්වහන්සෙ සවනසූයෙහීත්ගමනය ගෙ
ණහැරදක්වා අනිත්‍යයප්‍රකාශකොට සත්වනසූයෙහීත්ගමනය දක්වා
වදාරණසේක්“හොතිඛො සො භික්ඛවෙ” යනාදීපාඨය වදාලසේක.

භික්ඛවෙ, මහණෙනි; දීඝස්සඅද්ධුනොඅච්චයෙන, දීර්ඝකාලයක්හු
ගේ ඇවෑමෙන්; කදාචිකරහචි, කිසිකලෙක්හි; සත්තමොසූරියො,
සත්වනසූයෙක්; පාතුභවති, පහලවේද; අයං, මේයථොක්තප්‍රකාර
වූ; සොසමයො, ඒවිනාසකාලයතෙම; හොතිඛො, වන්නේමය; භි
ක්ඛවෙ, මහණෙනි; සත්තමස්සසූරියස්ස, සත්වනසූයයාගේ; පාතු
භාවා, පහලවීමෙන්; අයංමහාපඨවි, මේමහාපෘථිවියද; සිනෙරු
පබ්බතරාජා, මහමේරුපර්වතරාජයාද; ආදිප්පන්ති, ගිණිවැදගෙණ
ඇවිලෙන්නාහුය; පජ්ජලන්ති, භාත්පසින්ගිණිගෙණ ඇවිලෙන්
නාහුය; එකජාලිභවන්ති, එකමවූ:නිජ්ජාලයක්හුමෙන් වන්නාහුය;
භික්ඛවෙ, මහණෙනි; ඩය්හමානානං, ගින්නෙන්දැවෙනලදාහු; ඩයි
හමානානං, ගිණිගෙණ ඇවිලෙනලදාවූ; විනස්සමානානං, එසෙ
මවිනාසවනලදාවූ; ඉමිස්සාචමහාපඨවියා, මේමහාපෘථිවියගේද; සි
නෙරුස්සචපබ්බතරාජස්ස, මහමෙරුපර්වතරාජයාගේද; වාතෙන
ඛිත්තො, හිතිජනකප්‍රචණ්ඩවාතයෙන්නගණලදාවූ; අග්ගි, ගිනී
හු; යාවබ්‍රහ්මලොකාපි, යම්තාක්බ්‍රහ්මලොකයද ඒතාක්දක්වාම; ග
ච්ඡන්ති,යන්නාහුය; භික්ඛවෙ,මහණෙනි; ඩය්හමානස්ස, ගින්නෙන්
දැවෙනලදාවූ; ඩය්හමානස්සවිනස්සමානස්ස, එසෙමවිනාසවන්නා
හුය; මහතාතෙජක්ඛන්ධෙන අභිභූතස්ස, මහත්වූවඃතිස්කන්ධයෙන්
මඩනාලදාවූ; සිනෙරුස්සපබ්බතරාජස්ස,මහමෙරුපර්වතරාජයාගේ;
යොජනසතිකානිපිකූටානි, ඉපිලවැටෙන්නැවූ සියයක්යොදුන්පම
නවූද; ගල්කුළු, පළුජ්ජන්ති, මහමෙරින් සිඳිසිඳිවැටෙමින්, අහස්හි
මගින්නෙන්ද සුනුවිසුනුවන්නාහුය; ද්වියොජනසතිකානිපි, දෙසිය
යක්යොදුන්පමනවූද; කූටානි, මෙරින් ඉපිලවැටෙනගල්කුළු සිඳි
වැටෙමින් අහස්හිමවිනාසවන්නාහු;තියොජනසතිකානිපි, තුන්සිය
යක්යොදුන් පමනවූද; කූටානි, ගල්කුළුසිඳිවැටෙමින් නස්නේය; ච
තුයොජනසතිකානිපි, සාරසියයක්යොදුන් පමනවූද; කූටානි, ගල්
කුළුසිඳිවැටෙමින් විනාසවන්නාහුය; පඤ්චයොජනසතිකානිපි, කූ
ටානි, පන්සියයක්යොදුන් පමනවූ ගල්කුළුහෙවත් ප්‍රජ්වලිතගින්
නෙන්දන මහමෙරපිපිරසරස්වදුවතපන්සියක්යොදුන් පමනවූ ග
ල්කුළු; පළුජ්ජන්ති, සිඳිවැටෙමින් අහස්හිම ගින්නෙන්ද සුනුවිසුනු

වන්නාහූ; භික්ඛවෙ,මහනෙනි; ඣායමානානං,ගින්නෙන්දැවෙනලද්දාවූ; ඩය්හමානානං, එසේමදනලද්දාවූ; විනස්සමානානං, විනාශවනලද්දාවූ; ඉමිස්සාච මහාපඨවියා, මේමහාපෘථිවියගේද; සිනෙරුස්සචපබ්බතරාජස්ස, මහමෙරුපර්වතරාජයාගේද; ඡාරිකා,හළු;නොවපඤ්ඤායති, නොමදක්නාලැබෙයි; නමසි, දැලිහො අඟුරුද දක්නානොලැබෙයි; භික්ඛවෙ, මහනෙනි; සෙය්‍යථාපි, යම්සේ; ඣායමානස්ස, ගින්නෙන්දැවෙනලද්දාවූ; ඩය්හමානස්ස, ගින්නෙන්දැවෙනලද්දාවූහෝ; සප්පිස්සවා, ගිතයාගේහෝ; තෙලස්සවා, තිලතෙලයාගේහෝ; නෙවඡාරිකාපඤ්ඤායති, හළුනොමදක්නාලැබෙද; නමසි, දැලිහො අඟුරුනොමදක්නාලැබෙද; භික්ඛවෙ, මහනෙනි; ඒවමෙවඛො, එපරිද්දෙන්ම; ඣායමානානං, ගින්නෙන්දවනලද්දාවූහො; ඩෙය්හමානානං, ගින්නෙන්දවනලද්දාවූ; විනස්සමානානං, විනාසවනලද්දාවූ; ඉමිස්සාචමහාපඨවියා, මේමහාපෘථිවියගේද; සිනෙරුස්සචපබ්බතරාජස්ස, මහමෙරුපර්වතරාජයාගේද; ඡාරිකා, හළු; නෙවපඤ්ඤායති, නොමදක්නාලැබෙයි; නමසි, දැලිහෝ අඟුරුදක්නානොලැබෙයි; භික්ඛවෙ, මහනෙනි; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, උපාද්නනකානුපාදිනනක සියළුසංස්කාරධර්මයෝ; අද්ධුවා, අස්ථිරබැවින් අධ්‍රැවයහ; භික්ඛවෙ, මහනෙනි; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, උපාදිනනකාදී සියළුසංස්කාරප්‍රවෘත්තිධර්මයෝ; අනස්සාසිකා, ආනාස්වාදබැවින් සුඛාස්වාදවිරහිතයහ; භික්ඛවෙ, මහනෙනි; යවඤ්චිදං, යම්තාක් අනිත්‍යකෙලවරකොට ඇති මේ කාරණයද; සබ්බසංඛාරෙසු, ඉන්ද්‍රියානින්ද්‍රියප්‍රතිබද්ධවූ සියළුසංස්කාරධර්මයන් කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලංඑව, යුක්තෙමය; විරජ්ජිතුං, නොඇලෙන්නට; අලං, යුතුය; විමුච්චිතුං, මිදෙන්නට; අලං, යුක්තේය.

මෙසේ චක්‍රවාටපර්වතයහා මහාපෘථිවියහා මහමේරු යුගන්ධර ඊෂධරාදීන්හා චාතුර්මහාරාජිකාදිසදෙව්ලොවහා බ්‍රහ්මපාරිසද්‍ය බ්‍රහ්මපුරොහිතය මහාබ්‍රහ්මය යන තුන්බඹතලයදක්වා චක්‍රවාටපර්වතපටන් මුළුසක්වළසත්ගිරුනැගී නොයෙක්වාදහස්ලක්ෂකෝටිගනන් හව්රුදුමුළුලෙළෙහි සප්තසූර්‍ය්‍යප්‍රභාවයෙන් වියලීධූමාකුලවෙමින් ගිණිගෙණ ඇවිලෙමින් දිලියෙමින් ගුගුරමින් පිපිරෙමින් අශනිපාතකොටි ශතසහශ්‍රගර්ජනාසෙයින් සමස්තලොකය භීතිජනක ශබ්දකෙරෙමින් විසිඅන්තඃකල්පයක් හව්රුදුගණන් අඩුනොකොට අනන්තාදීර්ඝකාලයක් මුළුලෙළෙහි තෙජෝසංවර්තයෙන් ලොකයනැසී බඹලොවදක්වා ගිගුන්දෙමින් හැවුළුනුගිණිනිවී ගිතෙල්දැගියතැන්හි හළුනැතුවාසේ එතාක්මුළුලොවක්දැගොස් දැහිලෙලෙන්ශසූනකොට ගන්නාතරම් හළුහෝ දැලිහෝ අඟුරුහෝ නැතිවයට අජ

වාකාශයෙහි පටන්මත්තෙන් පරිත්තාභනම්බඹලොවදක්වා එකාකු හරව ඝණාන්ධකාරදක්වා සිටින්නේය.

ඒකල යට අවීචියෙහිපටන් මහාබ්‍රහ්මනම්බඹලොව ඇතුලත් කොටහැසුරුනුසියළුදිව්‍යබ්‍රහ්මවසවර්තිමනුෂ්‍යතිරශ්චීනක්ෂුද්‍රසත්ත්වාදි හීනොත්කෘෂ්ටසකලසත්වයො මරනින්මැති අදර්ශනයටගොස් කෙලලක්ෂයක්සක්වල සත්වශූන්‍යවඝණාන්ධකාරය පැතිරපවත්නේය.

> "කොටිසත සහස්සානං චක්කවාලං විලීයති
> තෙජොධාතුප්පකොපෙන යදාලොකොවිනස්සති"

මෙසේම උදකයෙන් කල්පයක්නස්නාකල්හි යථාක්‍රමයෙන් කල්පවිනාසයට හව්රුදුලක්ෂයක්තිබියදී ලොකබ්‍යූහනම්කාමාවචරදේවතාවො කල්පවිනාසය කෙලලක්ෂයක්සක්වලට කියාහැවිති, එතැන්පටන් හව්රුදුලක්ෂයක්ගෙවීමෙන් කල්පවිනාසකර මහමෙඝයනැගී කෙලලක්ෂයක්සක්වල එකපැහැරවශී්‍රකෙරෙමින් අනතර්ධානවෙයි එතැන්පටන් වැසිනැතුවලොවනසිමින් ක්‍රමයෙන්අනන්තදීර්ඝකාලයක්හූගෙ ඇවෑමෙන් කල්පවිනාසකක්ෂාරෝදකනම් මහමෙඝයක්නැගී පලමුකොට සියුම්සියුම්ලෙස වසිමින්ක්‍රමයෙන් වැඩී ඇඹුලදඬුහිදඬු පූවක්තුරු තල්ගස්පමනධාරොදක වැසිපොදවසිමින් රාජධානිජපද සරසරිත් සාගරමෙරු යුගන්ධරහිමවත් පෘථුවිචක්‍රවාටපර්වත දෙව්ලොවබඹලොව දියවගොස් අදර්ශනයටයෙයි විනාසකෙරෙයි වැසිපොද වැතුනුවැතුනුවෘක්ෂපර්වත දියවයෙයි කෙලලක්ෂයක් සක්වලට මහවාතයෙක්රැක ජලයපැතිරයානොදෙයි දියෙහිබහාඇළුතුකැටසෙසින්ධාරොදකයෙන්යටවූ පෘථුවිපර්වතචක්‍රවාටදෙව්ලොවබඹලොව දියවගොස් අදර්ශනයටයෙයි, මිනිස්ලොවටසත්‍යඅවලක්ෂ අසූදහස්සසියයක්සොදුන් මත්තෙහිපිහිටිසවන ආභස්සරනම්බඹලොවදක්වා හැමවිනාසවූකල ධාරොදකයවහා අනතර්ධානවෙමින්යට අජටාකාසයෙහිපටන් මත්තෙන් පරිත්තසුභනම්බඹලොවදක්වා ඝණාන්ධකාරවසිටින්නේය, එකලයට අවීචියෙහිපටන් මත්තෙන්මහාබ්‍රහ්මනම් බඹලොව ඇතුලත්කොට හැසුරුනු සියළුදිව්‍යබ්‍රහ්මාදී සකලසත්වයෝම මරනින්මැති අදර්ශනයට ගොස් කෙලලක්ෂයක්සක්වල සත්වශූන්‍යවසිස්වඝණාන්ධකාරපැතිර පවත්නේය, මේ ආපොසම්වත්තනාම් [illegible] එයින්කීහ.

> "කොටිශතසහස්සානං චක්කවාලං විලීයති
> කුපිතෙනයදාලොකො සලිලේන විනස්සති"

වාතයෙන් කල්පයනස්නාකල්හි යථාක්‍රමයෙන් විජ්ජනීකර

මහමෙඝයපටන් අනෙකවර්ෂශතසහස්‍රයක්හුගේ ඇවෑමෙන්කල්ප විනාසකම්ගාවාතයෙක්නැගී පලමුපටන්ක්‍රමක්‍රමයෙන් සියුම්රජස් මහරජස් සියුම්වැලිමහවැලි බොරළුවැලිකැට ගල්මහගල්පර්වත වෘක්ෂාදීන්වා අහසනගාබිමනොහෙලා අඹරවමින් සමස්ත ලෝකය භීෂජනකශබ්දකෙරෙමින් සක්වළයෙන්සුනුවිසුනුකොට අදෘශ්‍යය ටපමුනුවයි, යටමහාපෘථිවියෙන් ප්‍රචණ්ඩවාතයනැගී සියයක්යොදුන් සාරසියයක්යොදුන් පමනමහපෘථුවිප්‍රදෙසයොබිද වාතවෙගයෙන් අහසටනගා සුනුවිසුනුකෙරෙයි, එසේමකෙලලක්ෂයක් සක්වල කල්පාන්තමහවාතයනැගී පෘථුවි හිමවත්පර්වත මහමෙරුචක්‍රවාට අහසටනගා එකපැහැරවිනාසකෙරෙයි, මහපොළවින් මහපොළවහිමවතින් හිමවතමහමෙරින් මහමෙරසක්වලගලින් සක්වලගලදෙව්විමනින් දෙව්විමනබඹවිමනින් බඹවිමනසඝට්ටනය වෙමින් ඇඹරෙමින් සුනුවිසුනුවෙමින් අදෘශ්‍යයටයෙත් මිනිස්ලොවපටන් එක්කෝටිසලක්ෂ විසිතුන්දහස්සාරසියයක්යොදුන් මත්තෙහිපිහිටි නවවනසුභකින්නානම් බඹලොවදක්වා මුළුලෝවිනාසවෙයි, ජල පොලව වාතවෙගයෙන් අහසටනැගී විසිර අන්තර්ධානවෙයි, මේ මිනිස්ලොවපටන් එක්කෝටිතිස්තුන්ලක්ෂ විසිදහස්සසියයක්යොදුන් මත්තෙහිපිහිටි දසවනවෙහප්ඵලනම් බඹලොවිය, අසඤ්ඤසත්තය යන බ්‍රහ්මලොකවය පැහැරයට අජටාකාසයෙහිපටන් මුළු ලොවසිඳුව සන්ධකාර පැතිරසිටිතේය—එකල අවීචියේපටන් නවවනසුභකීර්ණකය ඇතුලත්කොට හැසුරුනාවූ සකලසත්වයෝ මරතින්මැකී කෙලලක්ෂයක්සක්වල සන්ධකාරපැතිර පවත්නේය—එයින් කීහ.

කොටිශතසහස්සෙකං චක්කවාලං විලීයතී
වායොධාතුප්පකොපෙන යදාලොකොවිනස්සතී.

ඊත්සත්වරෙක ගින්නෙන්කපනැසීගියකල අටවෙනි අටවෙනි වර ජලයෙන්කපනැසී මෙමක්‍රමයෙන් සූසැටවරක් ජලයෙන්නැසී සම්පූර්ණවූකලවාතයෙන් එක්වරෙකකපනස්නේය—එයින්කීහ.

[illegible]වාරා අටඨමෙ අටඨමෙදකා
[illegible] එකොවායුවරොසියා.

[illegible]සේතෙජෝසංවර්තනය, ආපොසංවර්තනය, වායොසංවර්තනය, සි[illegible]යනස්තෙය, එයින්සත්හිරුනැගී[illegible]තය, එබවප්‍රකාසකරත්නාවූ සතරාම[illegible]ගුරුවූ සමන්තභද්‍රවූ පරදුක්ඛදුක්ඛිත කරුණානිධානවූ

සර්වධර්මයන් සර්වාකාරයෙන් ස්වසන්තානසම්භූතඥානයෙන් අවබොධක
ළාවූ සර්වඥරාජෝත්තමයානන්වහන්සේ සප්තසූර්‍ය්‍යෝද්ගමනය ගෙ
ණහැරදක්වා "එවං අනිච්චාභික්ඛවෙසංඛාරා" යනාදීන් මූළලෝවා
සීන්ට අනිත්‍යප්‍රකාශකොට තමන්වහන්සේ විදිතලොකවිදූහෙයින්
ලෝකමහන්තත්වයද්දක ඒලෝකවිනාසකාරණයෙහි ආර්‍ය්‍යමාර්ගඵල
ප්‍රතිලාභයෙන් තුවනමොරාසිටි දිව්‍යමනුෂ්‍යයන්හැර සංසාරයෙහි
වැදගෙව පඤ්චකෙලසතාපයෙන් තැවෙන්නාවූ නුමුහුකලනුවන
ඇති සත්වලෝකයා අතුරෙන් කවරෙක්නම් ඒ ලෝකවිනාසය මන්
ත්‍රනායකොට කියන්ටසමර්ථවේද, කවරෙක්නම් ඒ බවසැබෑකොට
අදහනෙනහිදයිනියා මහත්වූධර්මසංවෙගයට පැමිනිලෙස්දක්වමින්
තාත්‍රභික්ඛවෙ යනාදීන් පාඨයවදූලසේක.

භික්ඛවෙ, මහනෙනි; අයඤ්චමහාපඨවී, මේ මහාපෘථුවියද; සිනෙ
රුපබ්බතරාජා, මේ මහාමේරුපර්වතරාජයාද යන දෙදෙන; ඩය්හිස්
සන්ති, ගිණිගෙණ ඇවිලෙන්නාහුයි ගින්නෙන්දවිනාසවන්නාහු
යි; නභවිස්සන්ති, නැවතනොවන්නාහුයි; ඉති, මෙසේ; තත්‍ර, ඒ
ලෝකයගින්නෙන්දනැතිවනකාරණයෙහි; අඤ්ඤත්‍රදිට්ඨපදෙහි,
මාර්ගඵලප්‍රතිලාභයෙන් නිර්වානපදයද්දකසිටි ආර්‍ය්‍යපුත්ගලයන්හැර;
කොමනන්තා, අනික්කවරෙක් මනන්ත්‍රනායකොට කියන්ටසමර්ථවේ
ද; කොසද්ධාතා, කවරෙක්සත්‍යකොට අදහන්නෙහිද — මෙසේ
ආලපනනැමති මෙඝගර්ජනානාගමින් දසසහස්‍රලොකධාතුවෙහි ඒ
කපැහැරසද්ධර්මාමෘතවර්ෂාකරන්නාවූ සර්වඥරාජෝත්තමයානන්වහන්
සේ සප්තසූර්‍ය්‍යෝද්ගමනයගෙණහැරදක්වා මූළලෝවාසීන්ට අනි
ත්‍යය, දුක්ඛය, අනාත්මය, ප්‍රකාසකොට සභිස්කාරලොකානන්තඥාන
ය ත්‍රිවිධකාරණයෙන් තීරණයකොට විසිඅන්තඃකල්පයක් ආයුගෙ
වෙනතුරු ගින්නෙන්දදූ බඹලොවපැහැරසිටි වෘතිජ්වාලොපච්ඡෙ
දයදක්වා සංවර්තනාම් අසංඛ්‍යකල්පයහයි වදාළසේක.

ජ්වාලොපච්ඡෙදයෙහිපටන් සම්පත්කරමහමේඝයදක්වා ඒ අත
රවිසි අන්තඃකල්පයක්හුගේ ආයුමදකුත් අඩුනොකොට යටඅජටා
කාසයෙහිපටන් මතෙත්තන්සතරවනපරිත්තාභනාම් බඹලොවදක්වා
මූළලොවනැසී සිඝවණ්ණාන්ධකාරවසිටීම සංවර්තස්ථායි අසංඛ්‍යකල්
පයනම්වේ — ඒ සම්පත්කර මහමෙඝයනම් පින්කලසියළුසත්වය
න්ගේ කුසලානුභාවයෙන් ලොකනිර්මිතයපිණිස පහලවනමෙඝ
යයි— හේ පළමුකොට නවන්මැද්දෙමසඅතර අටදිනබාන පිණි
සෙයින් සියුම්සියුම්කොටවසිමින් ක්‍රමක්‍රමයෙන් මහත්වකුමුදුනලගී
දඬුමුහල පුවක්තුරු තල්රුක්පමනවැසිපොද වසිමින් කෙලලක්ෂ

යක්සඣලනැසීගියහාක් ලොවම්හිරිජලයෙන් පූරාලමින් වැසීඅන්
ධකාරවෙයි, එකලමහවාතයනැගී ජලයයටින් සරසින් අඹරවමින්
සිදුරුගෙණනැගෙමින් තරඟමින් කරකවමින් නෙළුම්පතද්‍යණසයි
න් වැරකෙරෙමින් කණයකොටවියලයි මෙසේ අනන්තදීඝකාලය
ක්හුගේ ඈවෑමෙන් ජලයවියලීක්ෂයවෙමින් ක්‍රමයෙන්පාත්බැස ප
ළමු ශක්‍රභවනපිහිටිතැනට ලන්වෙයි—එකලපළමු බඹලොව
පිහිටිතැන් බඹලොවපහලවෙයි, දෙව්ලොවසිහිටිතැන් දෙව්ලොව
පහලවෙයි, එකල ආභස්සරාදි මතුමතුබඹලොවවසන බ්‍රහ්මරාජ
යන් අතුරෙන් සමහරෙක් ආයුක්ෂයවිමෙන්හෝ පුන්‍යක්ෂයවිමෙන්
හෝ එයින්චුතව මහාබ්‍රහ්මය බ්‍රහ්මපුරොහිතය බ්‍රහ්මපාරිසද්‍යය ප්‍රථ
මධ්‍යානතුන්තලයෙහි උපදින්—සමහරෙක් පරනෙර්මිතවසවර්ති
ය, නෙර්මානරතීය, තුසිතය, යාමය, යන සතරදෙව්ලොව උපදින්.

ජලයක්‍රමයෙන් අඩුවෙ පළමුපෘථිවිස්ථානයට බටකල්හි මහාවාත
ය අතිසයින් බලවත්වෙමින්ද බරාවෙකපුරාවිසූ දියතනක්සෙයින්
හාත්පසින්නැගී දියවටකෙරෙමින් තරඟමින්මිරිකයි එකලක්‍ෂයව
න්නාවූ මධුරොදකයදියපිටදමු නෙළුම්පතක්සෙයින් හාත්පසින්
නැගීදියවටකෙරෙමින් තරඟමින්මිරිකයි.එකල අමාරසපෘථිවියන
ගයි දෙදහසක්යොදුන් පෘථිවිතලය කිනිහිරිමලක්මෙන් රංවංවර්ණ
යෙන් සොභාමානවෙයි, නිත්‍යසුරභිසුගන්ධපැතිරෙයි,දිව්‍යරස ඕජස්
ගෙණබහර්කලක්මෙන් අමාරසවෙයි, එහිමහබොධිපර්‍යංකය පිහි
ටන ජයභූමිස්ථානය හැමටපුර්මයෙන් පිහිටයි, ලොවනස්නාකල
හැමටමපසුවනැසෙයි, එහිපූර්විනිමිත්තදක්වන්නාක්මෙන් නෙළුම්
පැලයක් පැලවෙයි, ඉදින්බුදුකෙනෙකුන්වහන්සේ ඒ කපඋපදිනා
සෙක්වීනම් එහිමලෙක්පිපියෙයි, නැතහොත්නොපිනෙයි මේ කප
එකනවුවේ මල්පසෙක්කර්ණිකාබෙදිපිපින, එහි පිරිකරපසෙක්
විය—එකල දෙලොසවන අව්හනම් බඹලොව ඇතුළුවූ පඤ්චශු
ධාවාසබඹලොව අනාගාමි අරහන්තබ්‍රහ්මරාජයො තමන්බුඩොත්
පාදලකුනුදන්නාසෙයින් නිදුකානෙනි අපිපූර්විනිමිතිදක්නටයම්හ
යි සමතකොටක්ෂණයකින් මුළුලොවඅඳුරුබිඳ බෝමැඩකරාබැස
රංවංනෙළුම්මලහා එහිපිරිකරපසක්දැක පසැස්ඇති පස්බුදුකෙනෙ
කුන්වහන්සේ උපදනාසේකැයි උපන්ප්‍රීතිසොම්නසින් දෙයතින්සිව්
රුගෙණ අහසටනැගී පස්දෙනාවහන්සේගේම ගර්භාවක්‍රාන්තිය
අභිනිෂ්ක්‍රමණය, සර්වඥතාඥණ, ප්‍රතිවෙධය, ධර්මචක්‍රප්‍රවර්තන
ය, යමකප්‍රාතිහාර්‍යය, දෙවොරොහණය, ආයුසංස්කාරොත්සර්ජනය,
පරිනෙර්වාණමංගල්‍යය, යන අටතන්හි දසසහශ්‍රිලොකධාතුව ක
ම්පනාදී බුඩපෙරහැරදකුම්හයි ප්‍රතිවාක්‍යපවතමින් තමතමන්ගේ
පඤ්චශුධාවාසබඹලොවට ගියාහුය.

මෙසේ භූමියපටන් ත්‍රිකෝටි සත්විසිලක්‍ෂ සාරදහසක්යොදුන් මත්තෙහිපිහිටි අකනිෂ්ඨකනම් බ්‍රහ්මලොකවාසී අරහන්තනම් බ්‍රහ්මරාජයෝ සතසහශ්‍රිලොකධාතුව සැරීරප්‍රභාවයෙන් ඒකාලෝක කෙරෙමින් සිව්රුගෙණගොස් බඹලොවතුබූහ, එකලසභොතපත් තියපිණිස ආභස්සරනම්බඹලොවින් බ්‍රහ්මරාජයෝ ආයුඃක්‍ෂයවීමෙන් චූතවීඅවුත් මෙමිනිස්ලොව ඕපපාතිකව උපදිත්, එව්හූස්වකීයශරීරප්‍රභාවයෙන් අඳුරුබිඳදිලියෙන්නාහ, අහසින්යනගමන් ඇත්තාහ, ප්‍රීතිසැපම ආහරකොට ඇත්තාහ, ස්ත්‍රීපුරුෂයයි යන ව්‍යවහාරයෙක්නැතිව අසංඛ්‍යපුෂකව අනන්තදීර්ඝකාලයක් වසන්නාහු මධුරතරසුරභිසුගන්ධ සමාකීර්ණවූ පෘථුවියෙන් මදක් ඇඟිලෙලන්ගෙණ දිවගාලේහකොට ඉතාමධුරයයි පෘථුවිරසය අනුභවකරන්නාහු සිතලොබවැඩුත් වැඩූත් පෘථුවිරසය අන්තර්ධානව අහිකැතුල්වැනි අමාරසඇතිසතුවගීයෙක්පහලවියහෙද ලොභවැඩූත් වැඩූත්අන්තර්ධානව මධුරරසඇති භද්‍රලතාලිය පහලවිය,හෙද අන්තර්ධානව ඔවුන්ගේ කුසලබලයෙන් කුඩුහා දෘහියනැති මුතුසෙපිරිසිදු මිහිරිසුවඳ ඇති ස්වයංජාතිකහැල්පහලවිය, ඒසයංජාතකසහල්ගෙණ පහලවූ මැනික් බඳුන්හිලා මැනික්උදුනනගා පිළිසෙලවූදිවබොජුන්වැනි සුවඳබත් අනුභවකෙරෙමින් ජලමලඋපන ඒ ජලමලනික්මීමට කාලටහටගන්නාපල මුතුළුසෙයින් ජලමල මාගීබිදී ඒ ඒ ස්ත්‍රීපුරුෂලණවයහටගත්තේය එතැන්පටන් ස්ත්‍රීයහ පුරුෂයහයි ව්‍යවහාරයක්විය අහසින්යන ඉර්ධියනැතිවිය සඳමෙන්බැබළු ශරීරප්‍රභානැතිවිය මුළුලෝකන්ධකාරවිය එකල ඒ අන්ධකාරයට පැමිනි ප්‍රථමකල්පික මහාබ්‍රහ්මයෝ අහොඅපිඅනන්තාසංඛ්‍යයු වලදමින් ශරීරප්‍රභාවයෙන් මුළුලොව අඳුරුබිඳ අහසැරිසරාළුමග දූන්අපිකලකම් ඉතාබලවත්නියා යයි කියා හඬන්නාහා.

ඒකලඔවුන්ගේ පුණ්‍යානුභාවයෙන් ඒ අන්ධකාරය විධ්වංසනයකෙරෙමින් දෙසාලිස්දහසක්යොදුන් මත්තෙහි අහසපනස්යොදුන් හිරුවිමනෙක්පහලව්ය ඒදැකමහත්වූ සූරභාවයදක්‍ෂමින් අන්ධකාරය දුරුකෙලේය එහෙයින් මොහු සූර්‍යහයි නම්තැබූහ——ඒ හිරුවිම්න ඉතාවුරුවගියකල පෙරසෙයින් අඳුරටපැමිනි හිරුසෙයින් තවත් ආලෝකයෙක්පහලවීනම් යහපතැයිසිතූහ ඔවුන්ගේ සිතහාසමගසඳවිමනපහලවිය ඒ දැක අපගේඡන්දයලෙසට පහලවූයේ සඳහුයයි නම් තුබූහ——මෙසේ හිරසඳපහලවූදවස්හීම ඉදිරිපසුනොවී එකවිටම මහමෙරු චක්‍රවාට හිමවත්පර්වත දිවයින් කොදෙව් සමුද්‍ර දෙදෙව්ලොවයන සියලලම මැදිනිනපසලොස්වක්පොහොදවස්හිමඑකවිටමපහලවියකෙසේපහලවීදයත්යම්සේතනබත්

ඳුදෙනකල්හී එකවරමබුබුළුනැගීමෙන් එක්පියසෙක්හි ථූපථූපායෙ හි එක්පියසෙක්මිටිමිටිවෙයි එක්පියසෙක්හි සමසමවෙයි ථූපථූපස්ථා නයෙනායෙක් පර්වතකඳුවෙයි නින්නනින්නස්ථාන නොයෙක්ඝුරභ රිත්සාගරවෙයි, සමසමස්ථානදිවයින් දඹදිව දෙදහසක් කොදෙව් වෙයි–––මෙසේසම්පත්තිකර මහමෙඝයපටන් විසිඅන්තඃකල්පයක් හුගේ ආයුඅඩුනොකොට ක්‍රමයෙන්ලොවතැනෙමින් ප්‍රථමකල්පික මානුසික මහාබ්‍රහ්මයො ඝණඬකාරයටපැමින හඬමින් හිරසඳමහ මෙර සක්වලගල්පහලවනතැන්දක්වාවිවර්ත අසංඛ්‍යකල්පයනම්වේ.

එතැන්පටන් හිරසඳමහමෙරඇතිව දෙව්ලොව ඇතිව බඹලොව ඇතිව දිවයින් ඇතිව හිමවත්සක්වලගල් ඇතිව තුන්දහසක්යො දුන් දඹදිව සුවාසූදහසක්රාජධානි ඇතිව නොයෙක්සත්වසමාකීර්ණ අසංඛ්‍ය ආයුෂකවසිටි මිනිසුන්ගේ ක්‍රමයෙන් ආයුපිරිහී, දසවර්ෂගත වරොග දුර්භික්ෂශස්ත්‍ර අන්තඃකල්පය යන එකකින් අතුරුකපතුන තුන්නැසී ඉතිරිමිනිසුන් ආයුවැඩී අසංඛ්‍යයටගොස්නැවත ආයුපිරි හී දසවර්ෂගතවෙමින් මෙසේ විසිඅතුරුකපක්මුළුලෙළහිගෙවා මහ කල්පයනස්නට හව්රුදුලක්ෂයක්තිබියදී වස්නාවිපත්තිකර මහමෙ ඝයදක්වා විවර්තස්ථායික අසංඛ්‍යකල්පයනම්වේ.

මෙසේ සංවර්තය සංවර්තස්ථායිකය විවර්තය විවර්තස්ථායික යයි කියා මහාකල්පය අසංඛ්‍යකල්පසතරෙක්වේ–––එයින්වදාලහ.

චත්තාරො මෙභික්ඛවෙ මහාකප්පාකතමෙ චත්තාරොසංවට්ටො සංවට්ටට්ඨායි විවට්ටො විවට්ටට්ඨායීති මෙඛොභික්ඛවෙචත්තාරොම හාකප්පාසී–මේ සතර අසංඛ්‍යකල්පයෝඑක්මහාකල්පයෙක්නම්වේ, හෙපර්වතොපමාදින්හා සඳිසවනබැවින් කල්පනම්වේ––– මෙසේදි ගින්යොදුනැති පලලින්යොදුනැතිඋසින්යොදුනැතිඅච්ඡිද්‍රවූ අසුසි රවූ එකඝණවූ මහපර්වතයෙක්වේද ඒපර්වතයයම්පුෂ්පයෙක්තෙමවර්ෂ සියයක්හුගේහෝ වර්ෂසහශ්‍රයක්හුගේහෝ ඇවෑමෙන් ඉතාසියුම්වූ කාසිකාවස්ත්‍රයකින් වරක්වරක්බැගින් පිරිමදින්නෙවීනම් මේඋපක්‍ර මයෙන් නොබෝකලකින්ම ඒ මහපර්වතයක්ෂයභාවයටයන්නේමය මහාකල්පයනොගෙවෙන්නෙයි.

එයින්වදාලහ සුපිළිපන් භික්ෂූහට.

සෙය්‍යථාපිභික්ඛු මහාසෙලො පබ්බතො ආයාමෙනයොජනං විත් ථාරෙණයොජනං උබ්බෙධෙනයොජනං අච්ඡිද්දො අසුසිරො එකඝ නොතමෙනං පුරිසොවස්සසතං වස්සසහස්සං අච්චයෙන කාසිකෙ න වත්ථෙනසකිං සකිං පරිමජ්ජෙය්‍යඛිප්පතරංඛො සො භික්ඛුමහා සෙලොපබ්බතො ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදනං

ගවෙජයන්තො භවකාරකං ——— මෙසේ සතරගව්දිග පුළුලැතිඝණය
ඇති සෙලමයපර්වතය අහසින්යන සිද්ධපුරුෂයෙකුහැඳි කාසිකවස්ත්‍ර
යෙන් සියක්හවුරුද්දෙන් දහසක්හවුරුද්දෙන් වරක්පිරිමැදීමෙන්
ගෙවී වහානැත්වෙයි මහාකල්පසඑයට අනන්තදීර්ඝකාලයක් වන
බව විසඳවූසර්වඥතාඥාණයෙන් දැක එබඳුවූ සත්කපක්මුළුල්ලෙහි ත
මන්වහන්සේ මිනිස්ලොවටලන්නොවී බඹසුරඉසුරුවිඳිමින් හැසුරු
නුබවදක්වමින් "භූතපුබ්බං භික්ඛවෙ" යනාදිපාඨය වදාලසේක.

භික්ඛවෙ, මහණෙනි; භූතපුබ්බං, පෙරවූදෙයක්කියමි; එකවරහ
තිත්ථකරො, තමාද්‍රෂ්ටියගත්වා සියල්ලන්ටගුරුවූ ශාස්තෘකරන්නා
වූ; කාමෙසුවීතරාගො; ධ්‍යානමහතාවිසයෙන් කාමරාගයප්‍රහානයක
ලබැවින් විතරාගිවූ; සුනෙත්තොසත්ථානාම අහොසි, දිව්‍යමනුෂ්‍යය
න්ට අනුශාසනාකරණි සුනෙත්‍රනම්ශාස්තෘකෙනෙක්වූයේය; භික්ඛ
වෙ, මහණෙනි; සුනෙත්තස්සසත්ථුනොඛොපන,සුනෙත්‍රනම්ශාස්තෘ
හුගේවනාහි; අනෙකානිසාවකසතානි අහෙසුං, නොයෙක්සියග
නන්ශ්‍රාවකයොවූහ; සුනෙත්තොසත්ථා, සුනෙත්‍රනම් ශාස්තෘතෙමෙ;
සාවකානං, තමාගේශ්‍රාවකයන්ට; බ්‍රහ්මලොකසහව්‍යතාය, බ්‍රහ්ම
ලොකවාසීන්හා එකීභාවසපිණිස හෙවත් බ්‍රහ්මලොකොත්පත්තිය
පිණිස; ධම්මංදෙසෙසි, ධර්මදෙසනාකරණ්ණය.

භික්ඛවෙ, මහණෙනි; බ්‍රහ්මලොකසහව්‍යතාය, බ්‍රහ්මලොකවාසීන්
හා එකීභාවයපිණිස හෙවත් බ්‍රහ්මලොකයෙහි උපදනාපිණිස; ධ
ම්මං දෙසෙන්තස්ස, ධර්මදෙසනාකරණාවූ; සුනෙත්තස්සසත්ථු
නො, සුනෙත්‍රනම් ශාස්තෘහුගේ; සබ්බෙනසබ්බං සාසනං, සර්වප්‍රකාර
යෙන්ම සියළු අනුශාසනාව; යෙඛොපන, යම්කෙනෙක්වනාහි; අජා
නිංසු, අනුශාසනාව දැනගත්තාහුද හෙවත් බ්‍රහ්මලොකයට යන මා
ර්ගයටපිළිපන්නාහුද; තෙ, ධනයටපැමිනි ඒ ශ්‍රාවකයෝ; කායස්ස
භෙදා, කරජකායයාගෙ භෙදයෙන්; පරම්මරණා, මරනින්මත්තෙහි; සුග
තිං, සොභනගති ඇතිසුගතිනම්වූ; සග්ගං, අග්‍රවූ; ප්‍රීතිසැප ඇති
සෙයින්ස්වර්ගනම්වූ; බ්‍රහ්මලොකං, ප්‍රථමධ්‍යාන බ්‍රහ්මලොකයෙහි;
උප්පජ්ජිංසු,උපන්නාහුයි——යෙ,යම්කෙනෙක්; සබ්බෙනසබ්බං සා
සනං, සර්වප්‍රකාරයෙම්ම ඒ සියළුම අනුශාසනාව; න අජානිංසු, නො
මදනනාහුද; තෙ, ඒ මනුෂ්‍යයො; කායස්ස භෙදා, කරජකායයා
ගේ භෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; අප්පෙකච්චෙ,
සමහරසත්වකෙනෙක්; පරනිම්මිත වසවත්තීනං දේවානං, භූමිය
ටතිස් අටලක්‍ෂසැටදහස් දෙසියයක්යොදුන් මත්තෙහිපිහිටි පර
නෙමිත වසවර්තිනම් දෙව්ලොවදෙවියන්හා සම්බන්ධව; සහව්‍යතං,
එකීභාවයටපැමින; උප්පජ්ජිංසු, උපන්නාහුය; අප්පෙකච්චෙ, සමහ
රකෙණතක්; නිම්මානරතීනං දේවානං, භූමියටවිසිලක්‍ෂ තිස් අටද

හස් සසියයක්යොදුන්මහතෙහි පිහිටි නිම්මානරතීනම් දෙවියන්හා සම්බන්ධව; සහව්‍යතං, ඒකීභාවයටපැමිනා; උපපජ්ජිංසු, උපන්නාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; තුසිතානංදේවානං, භුම්යටතෙලෙස්ලක්‍ෂ තුන්දහස්සාරසියයක්යොදුන් මහතෙහිපිහිටිතුසිතදෙව්ලොවදෙවියන්හා සම්බන්ධව; සහව්‍යතං, ඒකීභාවයටපැමිනා; උපපජ්ජිංසු, උපන්නාහුයි; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; යාමානංදේවානං, පස්ලක්‍ෂදසඅටදහස්සාරසියයක්යොදුන් මහතෙහිපිහිටි යාමනම් දිව්‍යලොකයෙහි දෙවියන්හාසම්බන්ධව; සහව්‍යතං, ඒකීභාවයටපැමිනා; උපපජ්ජිංසු, උපන්නාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; තාවතිංසානංදේවානං, තව්තිසාදිව්‍යලෝකවාසීන්හා සම්බන්ධව; සහව්‍යතං, ඒකීභාවයටපැමිනා; උපපජ්ජිංසු, උපන්නාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; චාතුම්මහාරාජිකානංදේවානං, චාතුර්මහාරාජිකදෙවියන්හා සම්බන්ධව; සහව්‍යතං, ඒකීභාවයටපැමිනා; උප්පජ්ජිංසු, උපන්නාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; ඛත්තියමහාසාලානං, මිනිස්ලොවදවසසියක් කොටියක්කහවනුනිධානකොට තබමින් විසිඅමුනක්කහවනු දවසකටප්‍රයෝජනවිඳින්නාවූ ක්‍ෂත්‍රියමහාසාරකුලයන්හා සම්බන්ධව; සහව්‍යතං, ඒකීභාවයටපැමිනා; උපපජ්ජිංසු, උපන්නාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; බ්‍රාහ්මණමහාසාලානං, අසූකොටියක් කහවනුනිධානකෙරෙමින් දවසදසඅමුනක්කහවනුවලඳන්නාවූ බ්‍රාහ්මණමහාසාරකුලයන්හා සම්බන්ධව; සහව්‍යතං, ඒකීභාවයටපැමිනා; උපපජ්ජිංසු, උපන්නාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; ගහපතිමහාසාලානං, සතලිස්කොටියක් කහවනුනිධානකෙරෙමින් පසමුනක්කහවනු දවසවලඳන්නාවූ ගෘහපතිමහාසාරකුලයන් හා; සහව්‍යතං, ඒකීභාවයටපැමිනා; උපපජ්ජිංසු, උපන්නාහුයි.

මෙසේ සුනෙත්‍රශාස්තෘවූ ශ්‍රීමහබොධිසත්වයන්වහන්සේ සසර වැද බුද්ධකාරකධර්මයන් පූරණයකරණසෙක්කාලෙකම් නිස්ලොවමහධනසම්පත්ති ඇති ලොකප්‍රසිද්ධවූ මහාසාරකුලයෙකඉපිද වැඩිවියපැමින සියළුමසැපත්හැර මහභිනික්මන්කොට ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමවත්වැද කායචිත්තවිවෙකයෙන් අප්‍රමාදව සිතඑකඟකොටගෙණ වියඝීසමාතිසම්‍යක්මනස්කාරයෙන්යෙදී භාවනාකොට කසිනාලෝක උපදවා පඤ්චාභිඥා අෂ්ටසමාපත්තිලාභිව සුනෙත්‍රනම් ශාස්තෘහයි දෙව්මිනිසුන්කෙරෙහි ප්‍රසිද්ධවවසනුයේ මුළුමහත් දඹදිවවාසීන්ට මෙලොවපරලොව වැඩදක්වා ධර්මදේශනාකරණකල්හි ඒ ධර්මදේශනාවෙහි අතිප්‍රසන්නවතමනවහන්සේ කරාඅවුත් අඳුංදිවිසම්පෙරවාගණ ජටාමඩුළුදරා ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූ

සියදහස්ගණන් ඍෂීන්පිරිවරාබුද්ධොත්පාදකාලයක්මෙන් ලොව බබුළුවමින් වැඩවසනසේක් අව්‍යමනුෂ්‍යයන්ට බ්‍රහ්මසම්පත්ති ප්‍රතිලාභයපිණිස මාර්ගප්‍රතිපත්තියදක්වා ධර්මදේශනාකරණකල්හි ඒ ඍෂිසමූහයා අප්‍රමාදව ඒ මාර්ගප්‍රතිපත්තිය සර්වප්‍රකාරයෙන් අවබොධකොට ධ්‍යානඋපදවා ප්‍රථමධ්‍යානය හීන මධ්‍යම ප්‍රණීතවසයෙන් වඩමින් බ්‍රහ්මපාරිෂද්‍යය බ්‍රහ්මපුරොහිතය මහාබ්‍රහ්මය යනබ්‍රහ්මලෝකත්‍රයෙහි උපන්නාහ, ඒ බ්‍රහ්මලෝකයෙහි උපදනාමාර්ගප්‍රතිපත්තිය සර්වප්‍රකාරයෙන් අවබොධකොට ගතනුහුනුසමහර ඍෂිහුසදෙව්ලොව උපන්හ, ඍෂීන්ටවැඳපුද උපස්ථානකළමනුෂ්‍යයො බොහෝසෙයින් සදෙව්ලොව උපන්හ, සමහරෙක්මිනිස්ලොව ත්‍රිවිධමහාසාරකුලයෙහි උපන්හ, ඍෂීන්දක චිත්තප්‍රේමයකළ තිරිසන්ගතසත්වයො දෙදෙව්ලොව උපන්හ.

ඒකලසුනෙත්‍රනම් ශාස්තෲවහන්සේ එපවත්දිවසින්දක ඒ මාගේ ශ්‍රාවකයන්හා පරලොවසමසමගතිවීනම් හෝමටතරම්නොවෙයි එහෙයින්මම එයටඅධිකතරවූමාර්ගභාවනාවක්කලේවිනම්යෙහෙකැයිසිතා ප්‍රථමධ්‍යානයෙන් ද්විතීය තෘතීය චතුර්ථධ්‍යානයදක්වා ප්‍රණීතවසයෙන්ම උපදවා "සබ්බෙසත්තා අවෙරාහොන්තු අව්‍යාපජ්ඣාහොන්තු සුඛීඅත්තානං පරිහරන්තු" යනාදින් සියළුසත්වයන්කෙරෙහි කරුණාමෛත්‍රීපතුරුවා සත්හවුරුද්දක්මුළුල්ලෙහි මෛත්‍රීභාවනාකොටනොපිරිහුනාවූ ධ්‍යානචිත්තයෙන්ගොස් ආභස්සරාදිබ්‍රහ්මරාජයන් කෙරෙහිඋපන්සේක; ඒ භවප්‍රකාශකරවදාරණාවූ ත්‍රිභුවනජන නිඛිලරාජහංස නිසෙවිත සරොරුහාකාර පාදපතෙමාප සොභිත අභීත්සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන්වහන්සේ "අථඛොභික්ඛවෙ" යනාදීපාඨය වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; අථඛො, ඉක්බිත්තෙන්; සුනෙත්තස්සසත්ථුනො, සුනෙත්‍රනම් ශාස්තෲන්හට; යොහං, සියලුන්ටගුරුස්ථානයෙහි පිහිටියාවූ ඒ මම; සාවකානං, මාගේශ්‍රාවකයන්හා; අභිසම්පරායං, පරලොව්හි; සමසම්ගතිකො අස්ස, සමසමගතිවීනම්; එතම්පන, මේකාරණයවනාහි; නබොපතිරූපං, සුදුසුනොවන්නෙය එහෙයින්; අහං, මම; උත්තරිංමග්ගංභාවෙය්‍යං, ප්‍රථමධ්‍යානයෙන් මතු අධිකතරමාර්ගභාවනාවක්කලෙවීනම්; යන්නුනාඉති, ඉතාමැනවැයි කියා; එතං, මෙබඳුවූසිතෙක්; අහොසිං, වූයේය; භික්ඛවෙ, මහණෙනි; අථඛො, ඉක්බිත්තෙන්; සුනෙත්තොසත්ථා, සුනෙත්‍රනම් ශාස්තෲතෙම පැමිනිසිටිප්‍රථමධ්‍යානයෙන් මතු ද්විතීය තෘතීය චතුර්ථධ්‍යාන දක්වා ප්‍රණීතවසයෙන් උපදවා; සත්තවස්සානි, සත්හවුරුද්දක්මුළුල්ලෙහි; මෙත්තාචිත්තංභාවෙසි, මෛත්‍රීචිත්තය වැඩූයේය හෙවත්

මෛත්‍රීභාවනාකළේය: සත්තවස්සානි මෙත්තචිත්තංභාවෙත්වා, සත් හවුරුද්දක් මෛත්‍රීභාවනාකොට නොපිරිහුණුධ්‍යානයෙන්ගොස් රන්වන්වලාපටලයෙන් නික්මුනාවූ විජ්ජුලතාසෙයින්ද දසදිසාන්තරයෙහි දුවනශරීරප්‍රභාස්වර ඇතිවනබැවින් ආභස්සරනම්වූ බඹලොවඉපද; සත්තසංවට්ටවිවට්ටකප්පෙ, සත්තසංවත්තවිවත්තකල්පයක් හෙවත් සප්තසූර්‍ය්‍යෝද්ගමණයෙන් ගින්නෙන්දූනසිමින් සඬපන්තිකර මහමෙඝපටන් ලොවහටගනිමින් සිටිකල්පසතෙක් ගෙවෙනතුරු; ඉමංලොකං, මෙමමනුෂ්‍යලෝකයට; නපුනරාගමාසි, ප්‍රතිසන්ධිග්‍රහණයට නො ආයේය—— භික්ඛවෙ, මහණෙනි; සංවට්ටමානෙලොකෙ, ලෝකයගින්නෙන්දූනස්නාකල්හි; ආභස්සරූපගොහොති, ආභස්සරලොකූපගතවන්නෙය; විවට්ටමානෙලොකෙ, ලොකයක්‍රමයෙන් හටගන්නාකල්හි; සුඤ්ඤංබ්‍රහ්මවිමානං, පාතපහලවූ ශූන්‍යබ්‍රහ්මවිමන්හි; උපපජ්ජාමි, උපදනෙය; භික්ඛවෙ, මහණෙනි; තත්‍ර, ඒ බ්‍රහ්මලෝකයෙහි; බ්‍රහ්මාහොමි, බ්‍රහ්මරාජයෙක්වන්නෙය; මහාබ්‍රහ්මා, ප්‍රථමයෙන් උපන්බැවින් මහාබ්‍රහ්මවන්නේය; අභිභූ, සියල්ලවුන් මැඩපවත්නාසුළුය; අනභිභූතො, අන්‍යයන්විසින් මැඩපැවැත්වියනොහැක්කෙය; අඤ්ඤදත්ථුදසො, ඒකාන්තයෙන් සියල්ලදක්නාසුළුය; වසවත්තී, සියල්ලන්තමාගේ වසඟයෙහි පවත්වාලන්නේය; සුදන්, යනු නිපාතයි.

මෙසේ අනන්තදීර්ඝකාලයක් බ්‍රහ්මසම්පත් වළඳනැවත භික්ඛවෙ, මහණෙනි; ඡත්තිංසක්ඛත්තුංඛොපන, සත්තිස්වරක්වනාහි; දෙවානමින්දො, දෙදෙව්ලොවදෙවියන්ට අධිපතිශක්‍රදෙවෙන්ද්‍රවූයේය; මෙසේ සත්හවුරුද්දක්මෛත්‍රීභාවනාකොට එමකුසලානුභාවයෙන් මිනිස්ලොවඉක්ම බඹලොවඉපද සත්තසංවට්ටවිවට්ටකල්පයක්ගෙවනතුරු අනන්තයසශ්‍රීධනප්‍රීතිසැප ඇතිව දසහශ්‍රීලෝකධාතුවෙහි රූසවඋන්සියල්ලන්ගේසිත් චෙතොඵරණයෙන් සිහින්සිතප්රිසිඳ දක්නාචෙතොඵරණය,ඒ තාක්ලෝකධාතුවෙහි කසිනාලෝකවඩනනටසමත්වූකසිනඵරණය, දිවසපතුරුවා ඒතාක්ලොවසූද්‍රස්ථූලවස්තූදක්නටසමත්වූ ආලෝකපඵරණය යන මේ ඵරණයෙන්සමන්විතව බ්‍රහ්මසම්පත්විඳ එසින්චුතව දෙව්ලොවඉපද සතිස්වරෙකශක්‍රදේවෙන්ද්‍රව දිව්‍යරාජශ්‍රීවිඳ වදාළසෙස-එකම මහකල්පයක ආයුබොහොවනපරිදි වදාරණාවූ ලොවුතුරා බුදුරජානන්වහන්සේ විසින් සතරගව්දිගපුළුල උස ඇති මහකොට්ටුවක සම්පූර්ණකොට පුරවාඇහබ සියක්හවුරුද්දෙන් දහසක්හවුරුද්දෙන් එක් ඇටයක් බැගින් බැහැරදැමීමෙන් සියළුසඤ්පරාසිය නිමවායෙයි කල්පයෙක ආයුසනොගෙවෙයි කියාවදාල උපමාවයෙන් කල්පයෙක්නම් ඉතා බොහෝ දීර්ඝකාලයෙක්වෙයි එබඳුවූ මහාකල්පසතක් මුළුල්ලෙහි

සුතඥනාම් ශාස්ත්‍රඥ බ්‍රහ්මසම්පත් ශක්‍රසම්පත්විඳිමින් එයින්මිනිස් ලොව මහාසම්මතරජවංශයෙහි ඉපද නොයෙක්සියගණන්වාරයෙ හි චක්‍රවර්තිරාජ්‍යශ්‍රීලද්දෙයි මේ මහාසම්මතරාජවංශය නම් වේ. ප්‍රථමයෙන් පෘථුවියතැනුනුකලමෙයටසත්‍ය අටලක්ෂඅසූදහස් සහිය යක්යොදුන් මනෙත්හිපිහිටි ආභස්සරනම් බඹලොවින්චුතව බ්‍රහ්ම යොමිනිස්ලොව නැගුපහන්සිඛාසෙයින් ඕපපාතිකවඋපන්හ ඔවු න්ගේ ශරීරප්‍රභාවයෙන් මුළුලොවඝණාන්ධකාරය විධ්වංසනයවිය අහසින් යනගමන් ඇතිවිය ප්‍රීතිසැප ආහාරවිය අනාදිමත්සසරදික් කරණ ස්ත්‍රීන්නැති බඹලොවක්මෙන්විය බඹසිරිලෙසින් අනන්ත දීර්ඝකාලයක් ප්‍රීතිසැපයෙන් කල්යවනානුක්‍රමයෙන් පෘථුවි අමාර සවලදමින් භූමිපපීටකවලදමින් භද්‍රලතාවලදමින් සවයඤ්ජාතවල දමින් ලොභවඩුත්වඩුත්හැම අනන්‍යාධීනවිය මහී අමාරසාදි සියුම් ආහරවැලදුකල ජඨරාග්ණ්යඉපද දවාරසනහරගතව අතුරුදන්වි යකුඹුමිශ්‍ර ඕලාරිකසාලෙ භොජනවැලදීමෙන් මලහා මූත්‍රඋපන ඒ මලමූත්‍රනෙගීමනයට ස්ත්‍රීපුංෂී අභාවකවූ බ්‍රහ්මරාජයන්වැනි මෑදු මොලොක් ශරීරයෙහි කලටහටගන්නා එලමුකුළුසෙයින් මලමූත්‍ර මාගීබිදිමහා ස්ත්‍රීපුරුෂලක්ෂණවයපහලවිය එයින්බොහෝකාලාන් තරයක් ඔවුනොවුන්ගේ දර්ශණසංසර්ගයෙන් ආසිවිෂයෙක් කිපීනැ ගිකලක්මෙන් අනාදිමත්සසරභාවිතවූ කාමරාගොත් සතනාවදෙ දෙනෙක් කාමසෙවනයෙහි හැසුරුණහා එදුටුවො අහොමොවුන් නුසුදුසුනොකලමනාදෙයක් කරන්නාහයි කියාකැටපහරදෙමින් සාඛාදඬුමුගුරුගෙණ එහුබැඳගත්හ එකලඔවුන්දණ්ඩනිග්‍රහවෙමි න්වෙහෙසවිඳ වනවැදඑහිවිසියනොහී සරසින් උඩින්වසාග්‍රහයක් කොට අපනොකලමනාව සිත්සේකෙරෙමින් සියලුන්සමගවසම් හයිකියා ගෘහයක්කොටගෙණ විසූහ එතැන්පටන්කාමරාගයහාග්‍ර හකර්මාන්තපහලවිය.

ඒ ප්‍රථමකල්පිකමනුෂ්‍යයො බ්‍රහ්මරාජයන්වැනි සීලාචාරරූපශ්‍රී ශරීරප්‍රභා ඇතිහෙයින් ප්‍රථමකල්පික බ්‍රහ්මයොයයිකියත් ඔවුහුබඹ ලොවින් අවුත් උපන්හෙයින් ජම්මභාෂානු පාලිභාෂාවෙන්ම කථාව උපදවාඇහ, රවි චන්ද්‍ර කුජ බුධ ගුරු ශුක්‍ර ශනිය යන සප්තග්‍රහමඬුළු ඇතිවරාත්‍රි දින මාස ඍතු සංවත්සර ඇතිව බොහෝකලක්සයංජ තකහැල් අනුභවකරමින් වසන්නාහු ලොභවඩුත්වඩුත් මුතුවංස හල්කුඩු හටගත්හ දහයියාහටගත්හ නැවතනොවපුලබිජුනොනැ ගෙයි එකලකෙත්වත්කොට දියබැඳගොවිකම්කෙරෙමින් හැල්වී බෙදගෙණ මටමටයයි ආරක්ෂාතබාගත්හ එකක්හුගේ හැල්නැමී කල අනිකක්හුගේ හැල්දෙවරකසොරාගත්තේය ඒ දැකමෙවක් පටන් මෙසේනොකරවයිකියා නිග්‍රහකොට හැරියොය තුන්වරහ

සූතොටගෙණ අතින් පයින් කැටින් ඉපලින් තලාතෙරපූහ එනැත් පටන් අදින්නාදානය උපන ගර්හාවඋපන වදදණ්ඩනායඋපන එක ල ඒ හැමදෙන එකවගෙණ දුන්මෙබඳුනොකලමනා පාපකර්මඋපන එහෙයින් අපහැමදෙනාම සම්මතකොට නොපවැනිදෙයකකාලවුන් ට නිග්ගහානුග්ගහපබ්බාජනීයකරණසේ එකෙකනෙකු තිලකොට තබම් හයි ඕහට අපිහැල් අමුනුබැගින්දෙමහයිනියා සම්මතකොට සූර්‍ය්‍ය පුත්‍රනම්වූ මහබොධිසත්ත්වයන්වහන්සේතෝරාගෙණ ත්‍රිවිධසංඛයෙන් පැන්වඩාරාජාභිෂේකයෙහි තැබූහ හේරජක්ෂෙත්‍රාධිපති හෙයින් ඛත්තියනම්විය දැහැමින්සෙමෙන් ජනයන්රංජනයකරණහෙයින් රාජනම්විය සියළුජනයාගේ සම්මැතයෙන් රජවූහෙයින්මහාසම්ම තනම්විය—ඔහුගේ වංසයමහසම්මතරාජවංසයනම්විය—මේ මහාසම්මතවූ රාජවංසයෙහි සූනෙත්‍රනම්වූ මහබොධිසත්ත්වයන්වහන් සේ ඉපද නොයෙක්සියගණන්වාරයෙහි චක්‍රවර්ත්තිරාජ්‍යශ්‍රීකරවදාළ සේක, ඒ බවදක්වාවදාරණ්නාවූ ත්‍රිභුවනභවනෛක තිලකසකල ඥෙය්‍ය සාගරපාරගතානෙස ගුණරත්නමන්දිරායමානවූ සර්වඥරා ජෝත්තමයානන්වහන්සේ "අනෙකසතක්ඛත්තුං රාජා අහොසි යන පාඨය වදාලසේක.

චක්‍රවත්ති, දිව්‍යමයචක්‍රරත්නයහා සමගපවත්නාවූ; ධම්මිකො, දසවිධචක්‍රවර්තිවත්පුරා දැහැමින්මප්‍රතිලබ්දහෙයින් ධාර්මිකවූ; ධම්මරාජා, දසරාජධර්මයෙන් රාජ්‍යශ්‍රීකරණහෙයින් ධර්මරාජන්වූ; චාතුරන්තො, මහමෙරසතරදෙසින් චක්‍රවාටයකෙලවරකොට සතරමහදිවයින ඇතුලත්කොට ඇත්තාවූ; විජිතාවී, සකලපෘථුවිය ජයග්‍රහණයකලාවූ; ජනපදත්ථාවරියප්පත්තො, අනුපිතජන සමාකීර්ණතාවෙන්ස්ථිරව පිහිටියාවූ ජනපදත්වයටපැමිනියාවූ; සත්තරතනසමන්නාගතො, සප්තවිධරත්නයෙන් සමන්විතවූ, සෙය්‍යථිදං, ඒකවරයහ; චක්කරතනං, අහසින්යනදිව්‍යමයවූ චක්‍රරත්නය; හත්ථිරතනං, ආකාසචාරිවූ හස්තිරත්නය; අස්සරතනං, වලාහක අශ්වරත්නය;මනිරතනං සත්ගව්නැන්ඝණතරතිමිරාන්ධකාරවිධමනයකෙරෙමින්පවත්නා නිත්‍යභාසුරමානික්‍යරත්නය;ගහපතිරතනං,සතරගවුවෙක පෘථුවියගතනිධානදක්නාග්‍රහපතිරත්නය; පරිනායකරතනං, සතිස්යොත්නෙක පැතිරසිටින මහපිරිසෙහි චරිතවිසෙස දක්නටසමත්වූ පිරිස්නායකවූ පුත්‍රරත්නය යන මේ සප්තවිධරත්නයෙන්යුක්තවූ; අනෙකසතක්ඛත්තුං, නොයෙක්සියගණන් ජාතිවාරයෙහි; රාජාඅහොසි,සතරමහදිවයිනට ඒකච්ඡත්‍රනන්වාරජවූයේය; අස්ස, ඒ චක්‍රවර්තිරජහට; සූරා, අතිදක්ෂවූ; විරහරූපා,දෙවියන්හාසමානවූරූපශ්‍රීඇති; පරසෙනප්පමද්දනා, පරශත්‍රුසෙනාමඩන

වසමණිවූ; පරොසහස්සං ඛොපන, දහසකින්වැඩියක්: වනාහී පුත්තාඅහෙසුං, පුත්‍රයොවූහ; සො, ඒ සලවසුධාධිපති චක්‍රවර්තිනරදෙවෙන්ද්‍රතෙම; සාගරපරියන්තං, වටින්සාගරයකෙලවරකොට ඇති; ඉමංපඨවිං, මේසියළුමපෘථිවිය; අදණ්ඩෙන, සඬයත්වා නිසිදණ්ඩනයක්නැතිව; අසත්ථෙන, සත්‍වඝාතනයට නිසිශස්ත්‍රයක්නැතිව; ධම්මෙන, ධාර්මිකවූරාජනුශාසනාවෙන්ම; අභිවිජිය, ජයගෙණ; අජ්ඣාවසී, වාසයකළේය.

භික්ඛවෙ, මහණෙනි; එවං, මෙසේ; ධීඝායුකොසමානො, තෙජෝසංවට්ටවිවට්ටකල්පසතෙක්ගෙවෙනතුරු මිනිස්ලොවනොම අවුත්බඹසුරඉසුරුවිඳිමින් බොහෝදීර්ඝායුෂ්කවූයේද; එවංචිරට්ඨිතිකො, මෙසේ බොහෝකාලයක් සැපතින්මසිටියාවූ; සොභිනාමසුනෙත්තොසත්ථා, ඒ සුනෙත්‍රනම් ශාස්තෘහුවනාහී: ජාතියා, මනුෂ්‍යතිරශ්චිනාදී ජාතියෙන්; ජරාමරණෙන, ජරාමරණයෙන්; අපරිමුත්තො අහොසි, නොමිදුනලද්දේවිය; සොකෙහි, නැසූනදෙයටසෝකකොරීමෙන්; පරිදෙවෙහි, නැසූනුදෙයට නොලැබූනුදෙයට විලාපකියාහැඬීමෙන්; දුක්ඛෙහි, කායචිත්තදුක්ඛයෙන්; දෙමනස්සෙහි, සිතෙහි උපදනාදෞර්මනස්‍යයෙන්;උපායාසෙහි,නොලද්දේම්සිතෙහි උපදනාචිත්තතාපනයෙන්; අපරිමුත්තො,නොමිදුනෙය එහෙයින්; දුක්ඛස්මා, සියළුසංසාරදුක්ඛයෙන්; අපරිමුත්තො ඉතිවදාමි, නොමිදුනෙයයි කියමි.

මෙසේ සානන්තසුඛප්‍රනීතවිසදතරදිව්‍යචක්ෂුරභිඥාණය දිව්‍යශ්‍රොත්‍රඥාණය පූර්වේනිවාසානුස්මෘතිඥාණය පරචිත්තවිජානණයඍද්ධිප්‍රභෙදගතඥාණය ආශ්‍රවක්ෂයකරාභිඥාණය යන ෂඩ්අභිඥාණයකෝටිප්‍රාප්තවූ සර්වඥරාජොත්තමයානන්වහන්සේ පූර්වේනිවාසානුස්මෘතිඥාණය පතුරුවා සප්තසූර්යොද්ගමනයෙන් සත්ත්වසංවර්තනවිවර්තනකල්පයන්මුළුලෙලහිමිනිස්ලොවටලංනොවී කප්ගිණිගත්රුවන්මෙරක්සේබබලන්නාවූ දෙලොස්යොදුන් උසබ්‍රහ්මභාවයෙන්යුක්තවූ විජ්ජුලලතානෙක ශතසහශ්‍රප්‍රභරණාකාර දසනඛකිරණශ්‍රෙණින් නිස්ක්‍රාන්තවන කාන්තිප්‍රභාවයෙන් දසසහශ්‍රලෝකධාතුව ඒකාලෝකකොරමින් බ්‍රහ්මසම්පත්විඳපියාත් ඒඒභවයෙහි උපදවාඅනන්තදුක්දෙන්නාවූ අෂ්ටොත්‍රසතප්‍රභෙදගතවූ තෘෂ්ණාව ආයශ්මාගීඥාණයෙන් සිඳනොහලබැවින් නෛර්වාණධම්මය අවබොධප්‍රතිවෙධයනොකලබැවින් ජාතිජරාමරණදුඃඛින් නොමිදුනේය, සොකපරිදෙවදුක්ඛ දෞර්මනස්‍ය උපායාසයෙන් නොමිදුනේය සියළුසංස්කාරදුක්ඛප්‍රවෘත්ති

යෙන් නොමිදුනේය එසේහෙයින් සියළුමසංසාරදුක්ඛස්කන්ධය නෙ
ර්‍වාපනයකරවන්නාවූ සාන්තප්‍රනීතාර්‍ය්‍ය ප්‍රවරසීලයයොණහැරදක්වා
වදාරණසේක් "තංකිස්සහෙතු" යන පාඨය වදාළසේක.

තංකිස්සහෙතු, ඒසංසාරදුක්ඛයෙන් නොමිදුනුබවට හෙතුකවරේ
ද; චතුන්නංධම්මානං, ජලපොලවසෙයින් අතිගාම්භීරවූ සතරධර්‍ම
කොනෙකුගේ; අනනුබොධා, සියක්වරපැළු අස්ලොම්අගක්සෙයින්
අතිගාම්භීරතීක්‍ෂණභවය අවබොධයනොකලබැවිනු; අප්පටිවෙධා,
ප්‍රතිවෙධයනොකලබැවිනු; කතමෙසංචතුන්නං, කවරනම් සතර
ධර්‍මකොනෙකුන්ගේදයත්; අරියස්සසීලස්ස, ආර්‍ය්‍යවූසීලයාගේහෙව
ත් පඤ්චසීලය අෂ්ටාංගසීලය දසසීලය සංවරසීලයයිනියා කලහන
පෘථුජ්ජනයන්ගේ සීලයචතුර්විධවෙ—සොවාන් සකෘදගාමි අනා
ගාමි අර්හත්මාර්ගඵලාධිගමයටපැමිනිම උත්තමයො ආර්‍ය්‍යනම්වෙ
ති ඔවුන්ගේසීලය ආර්‍ය්‍යසීලයනම්වෙ ඒ මේ ආර්‍ය්‍යසීලයාගේ; අනනු
බොධා අවබොධයනොකලබැවිනු; අප්පටිවෙධා, ප්‍රතිවෙධයනොක
ලබැවිනු; අරියස්සසමාධිස්ස, ආර්‍ය්‍යවූසමාධියගේ; අනනුබොධා, අව
බොධයනොලබැවිනු; අප්පටිවෙධා, ප්‍රතිවෙධයනොකලබැවිනු; අරි
යායපඤ්ඤාය, ආර්‍ය්‍යවූතුදුස්බුධඥාණයාගේ; අනනුබොධා, අවබොධය
නොකලබැවිනු; අප්පටිවෙධා, ප්‍රතිවෙධයනොකලබැවිනු; අරියාය
විමුත්තියා, සමුච්ඡෙද පටිප්‍රශ්‍රබ්ධිනිස්සරණය යන ත්‍රිවිධාර්‍ය්‍යවූ විමුක්
තියගේ; අනනුබොධා, අවබොධයනොකලබැවිනු; අප්පටිවෙධා, ප්‍රති
වෙධයනොකලබැවිනු සියළුමසංසාරදුක්ඛයෙන් නොමිදෙනෙනාය.

ඉති ඛෝ, මහනෙනි; තයිදං අරියංසීලං, පරමාමෘතසාන්තසුඛ
ප්‍රතිතවිසුද්ධාර්‍ය්‍යමාර්ගඵලප්‍රතිබද්ධවූ ඒ මේ ආර්‍ය්‍යසීලයද; අනුබුද්ධං, සර්‍ව
ඥතාඥාණය ප්‍රතිලාභයහා සමගම අවබොධයකරණලදැයි; පටි
විද්ධං, ප්‍රතිවෙධයකරණලදැයි; අරියායසමාධි, දුර්‍දසකදුරනුබොධ
අතක්කාවචර නිපුනපණ්ඩිතවෙදනීයවූ ආර්‍ය්‍යසමාධිය; අනුවිද්ධො,
අවබොධයකරණලදැයි; පටිවිද්ධො, ප්‍රතිවෙධයකරණලදැයි; අරි
යායපඤ්ඤා, තුදුස්බුද්ධඥාණහා මහාපඤ්ඤා ප්‍රථුපඤ්ඤාහාසුපඤ්ඤා තික්
ඛපඤ්ඤා නිබ්බෙධිකපඤ්ඤාය යන සර්‍වඥත්වඅභිඥප්‍රඥාව; අනුබුද්ධා,
අවබොධයකරණලදැයි; පටිවිද්ධා, ප්‍රතිවෙධයකරණලදැයි; අරි
යාවිමුත්ති, ආර්‍ය්‍යවූඅර්හත්ඵලවිමුක්තිය හෙවත් සොවාන්සකෘදගාමි
අනාගාමිරහත් යන සතරමාර්ගයෙන්සිඳු මනාවූකෙලෙසුන්නසාස
තරමාර්ගයටපැමිනිමහා සමුච්ඡෙදවිමුක්තියනම්වෙ—තත්තත්මා
ර්ගයෙන් කෙලෙසුන්කඩාසන්හුන් සොවාන්ඵලසිතහා සතරඵලසිත්
මෙපටිප්පස්සද්ධිවිමුක්තිය නම්වෙ—අජරාමර සාන්තසුඛප්‍රනීතවූ

අමෘතමහානිර්වාණයතෙමේ නිස්සරණවිමුක්තියනම්වේ, මේ ආර්ය වූ අර්හත්ඵලවිමුක්තිය; අනුබුද්ධා, ශාස්ත්‍රාමලකක්‍රමයෙන් අවබෝධකරණලද්දෑම්; පටිවිද්ධා, සර්වඥතාඥානය ප්‍රතිලාභයහා සමග ප්‍රතිවෙධයකරණලද්දෙම්; භවතණ්හා, භවතෘෂ්ණාද අජෝත්‍රාසතාපුනෙද ගතවූ තෘෂ්ණාතොමෝ; උච්ඡින්නා, මූලොච්ඡින්නතාලවෘක්ෂයක් මෙන් අපුනරාවර්ත්තිකොට සිඳහරණලද්දෑය; භවනෙත්ති, භවයෙන් භවය උපදනාවූ භවප්‍රවෘත්තිය; ඛීනා, ක්ෂයකරණලද්දෙය එහෙයින්; ඉදානි, දැන්; පුනබ්භවෝ, නැවතඋපදනාපුනර්භවයෙක්; මෙ, මට; නත්ථි, නැත්තේමය; ඉති, මෙසේ; භගවා, සර්වලෞකික ලොකොත්තරගිත සුඛාභිනිර්වෘතකදනශීලාදී කොටිප්‍රාප්තවූ; භාග්‍යමස්තීතිභගවාන්, යනාදීඅර්ථයෙන් යුක්තහෙයිනු; රාගද්වේෂමෝහවිපරීත මනස්කාරාදි සර්වඅකුශලධර්මයන් නිරවශෙසකොටවිසුධාර්යමාර්ගඵලප්‍රතිලාභයෙන් බිඳහැර අජරාමරහෙයින්ද; දෙවපුත්‍රමාරක්ලෙශාභිසංස්කාරස්කන්ධ මෘත්‍යුසංඛ්‍යාතපඤ්චමාරයන් භග්නය කොටඒ ඓශ්වර්‍යශ්‍රීපුන්‍යයසශ්‍රීසංකල්පසිද්ධිප්‍රයත්නය යන සාත්ගුණ්‍යතායෙන් පරිපූර්ණහෙයිනු, සර්වකුසලධර්මපඤ්චස්කන්ධවාදසායතනාෂ්ටාදසවිස්තීන්ද්‍රියවාදසාංග ප්‍රතීත්‍යසමුත්පාදචතුස්මෘතිස්ථානසම්‍යක්ප්‍රධාන දිව්‍යබ්‍රහ්මාර්යවිහාරකායචිත්තාපධිවිවෙක සුන්‍යතාප්‍රනිහිත නිමිත්තවිමොක්ෂ පඤ්චාභිඥාදිවූ ලෞකික ලොකොත්තරවූ උත්තරීමනුෂ්‍යධර්මයන් භාවිතාකලහෙයිනු, කාමරූපාරූපසංඛ්‍යාත භවත්‍රයෙහි තෘෂ්ණාගමනය අර්හත්මාර්ගඥාණමුඛයෙන් වාන්තාකලහෙයින් දැයි යනාදී අනන්තගුණයෙන්යුක්තවූ භාග්‍යවත් සර්වඥරාජෝත්තමයානන්වහන්සේ ~~~ ඉදන්, සනරාමර සමස්ථජනකර්ණාමෘත ඉන්ද්‍රියානින්ද්‍රප්‍රතිබද්ධ සර්වඥසංස්කාරවිකාරලක්ෂණ ප්‍රකාශකරපරමගාම්භීරාර්ථධර්මදෙසනාවෙන්යුක්තවූ මේ සප්තසූර්යෝද්ගමනසූත්‍රධර්මදෙසනාව; අවොච, සකලසත්වවර්ගයාකෙරෙහි පතලකරුණාවෙන් දෙසනාකර වදාළසේක.

හෙවත් “අනිච්චාභික්ඛවෙසංඛාරා” යනාදීන්සප්තසූර්යෝද්ගමනසූත්‍රධර්මදෙසනාවෙන් පළමුකොටපෘථුවී මේරුචක්‍රවාටාදී අනින්ද්‍රියප්‍රතිබද්ධ සංස්කාරධර්මයන්ගේද දිව්‍යබ්‍රහ්මමාරනරනාගෙන්ද්‍රාදී සත්වකායපරියාපන්න ඉන්ද්‍රියප්‍රතිබද්ධවූ සංස්කාරධර්මයන්ගේද යන ඉන්ද්‍රියානින්ද්‍රිය ප්‍රතිබද්ධසර්වසංස්කාරධර්මයන්ගේ; අනස්සාසිකා, අස්ථිරාත්ත්‍යතාවගෙණහැරදක්වාචතුන්නංධම්මානං අනනුබොධා අප්පටිවෙධා යනාදීන් දුරානුබොධාතර්කාවචරනිපුනපණ්ඩිතවෙදනීය දුර්දර්ශක තීක්ෂණ ප්‍රතිවෙධගාම්භීරත්වයෙන්යුක්තවූ සොවාන්සකෘදාගාමි අනාගාමි අර්හත්මාර්ගඵලාමෘත මහනිර්වාණය යන නවලොකොත්තර ශ්‍රීසද්ධර්මයගෙණහැරදක්වා අර්හත්ඵලයකුළුගෙණ ධර්මදේශනාකරවදා

ලකල්හි අනිත්‍යකර්මස්ථානයෙහි පමාදවිහාරීවූ පන්සියයක්පමන
සුගතසුත්‍රභාවොපගතවූ භික්ෂූන්වහන්සේලා සවර්ණභාජනයෙහි
පරික්ෂිප්තසිංහතෛලයක්සෙයින් මේ සප්තසූර්‍ය්‍යොද්ගමනසූත්‍රය ආ
දිමධ්‍යපරියොසානය මනාකොටම ශ්‍රවනයප්‍රගුණධාරණකෙරෙමින්
දෙසනාක්‍රමනොහැරම සිටගෙණගොස් සර්වසංසාරදුක්ගෙවා සර්
වකෙලසයන්නසාරහත්වූහ, මේධර්මදෙසනාවසෙසුත් බොහෝදිව්‍යම
නුෂ්‍යාදීන්ට ප්‍රයොජනවිය; සුගතො, සොභනාගතිසංඛ්‍යාත විසුද්ධාර්‍ය්‍ය
මාර්ගගමනින් නෛර්‍ව්‍යානයක්ෂිප්‍රාභිශුවසයෙන් ගියහෙයින්ද, ද්වාත්‍රිංස
සත්වරමහාපුරුෂලක්ෂණසීතානු ව්‍යඤ්ජනව්‍යාමප්‍රභානුරඤ්ජිතරූපකායා
නුසම්පත්තියක් ඇතිබැවිනුද ධ්‍රුතවිලම්බිතස්ඛලිතානුකර්ෂණ නිෂ්පී
ඩොත්කුට්ටිතාකුලතාදි දෙසරහිතව අපහසිතරාජහංස වෘෂභවර
වාරණ මෘගරාජගමනවිලාස ඇති සොභනවූ කායගමනින්හා විප්‍ර
ලවිමලකරුණාසම්ප්‍රාප්ති විර්‍ය්‍යාදිගුණවිසෙසසහිතවූ ඥාණගමනින්යුක්
තහෙයින් සුගතනම්වූ අපභාග්‍යවත් සර්වඥරාජොත්තමයානවහන්
සේ; ඉදංවත්වා,මේ සප්තසූර්‍ය්‍යොද්ගමනසූත්‍රයදෙසනාකොට; අථ, නා
වන; සත්ථා, මාර්ගඵලාදිගම්යට උපනිශ්‍රය සම්පත්ඇති දිව්‍යබ්‍රහ්මයන්
හා මනුෂ්‍යාදීන්ට මාර්ගඵලාධිගමයට අභව්‍යවූ අහෙතුකවූ ප්‍රතිසන්
ධිගත නාගසුපර්ණ තිරශ්චීනාදීන්ට ආයති භවොපනිශ්‍රයසාද ලීම්
වසයෙන් මෙලොවපරලොව වැඩදත්වා අනුසාසනාකරණහෙයින්ද
සනරාමරසකලලොකවාසීන් ජාතිකාන්තාරාදීන් තරණයකොට අ
මෘතමහානෛර්‍ව්‍යානක්ෂෙමභූමියට පමුනුවනහෙයින් ශාස්තෘනම්වූ බු
දුරජානන්වහන්සේ; අපරංඑතං, තදෙහද හිතකෙසරිනෘගජිනාප්‍රති
භාග ප්‍රතිලබ්ධ නෛර්‍ය්‍යාණිකනෛර්‍ව්‍යාන ධර්මප්‍රකාසිතවූ ඉතිරිමෙ උ
දානගාථාවය; අවොච, වදුලසේක.

සීලංසමාධිපඤ්ඤාච විමුත්තිච අනුත්තරා
අනුබුද්ධා ඉමෙධම්මා ගොතමෙන යසස්සිනා.
ඉතිබුද්ධො අභිඤ්ඤාය ධම්මමක්ඛාසිභික්ඛුනං
දුක්ඛස්සන්තකරොසත්ථා චක්ඛුමාපරිනිබ්බුතොති:

සමස්තලෝකව්‍යාප්තවූ කීර්ත්තිප්‍රතාපයසස් ඇත්තාවූ; ගොතමෙ
න, ගෞතමගොත්‍රයෙහි සන්ජාතවූ බුදුරජානන්වහන්සේවිසින්; සී
ලං, ලොකොත්තරමාර්ගශීලයද; සමාධිං, ලොකොත්තරසමාධියද; ප
ඤ්ඤාච, චතුර්විධසම්බුද්ධඥාණාධි ලොකොත්තරඥාණයද; විමුත්තිච,
අග්‍රඵලවිමුක්තියද යන; අනුත්තරා, නිරුත්තරවූ; ඉමෙධම්මා, මේ
ලෝකොත්තරගුණධර්මයො; අනුබුද්ධා, අන්‍යොපදෙසවිරහිතව සව
යම්භූඥාණයෙන්ම භාෂාමලකක්‍රමයෙන් අවබොධය කරණලද්

හුය—ඉති, මෙසේ; බුද්ධො, සර්වසංස්කාරවිකාර ලක්ෂණනෛර්වාන
ප්‍රඥප්තිය යන පඤ්චවිධඥෙය්‍ය මණ්ඩලය කරතලාමලකක්‍රමයෙන්
අවබොධයකරමින් නානානයනිපුන අනෙකාර්ත්‍ථස සමුත්පාතාර්ථ
ව්‍යඤ්ජනසම්පන්න විවිධප්‍රාතිහාර්‍ය්‍යයෙන්යුක්ත ශ්‍රීසද්ධර්මදෙසනාඥා
ණවිලාස ඇති බුදුරජානන්වහන්සේ; අභිඤ්ඤාය, සර්වධර්මයන් අවබො
ධයකොට දැනගෙණ; භික්ඛුනං, නෛර්වානයපිණිස පිළිපන්නාවූ ශා
රිපුත්‍රමෞද්ගල්‍යාන නන්දනන්ද අඞ්ගුලිමාලරාහුලාදි අෂ්ටාර්‍ය්‍යපුද්ගල
ජනෙන්ද්‍ර සුත්‍රභාවොපගතවූභික්ෂූන්ට; ධම්මං, අධිසීල අධිචිත්ත අධි
ප්‍රඥාය යන සික්ෂාත්‍රය සංග්‍රහිතවූ ශ්‍රීසද්ධර්මය; අක්ඛාසි, දෙසනාක
ලේය; දුක්ඛස්සන්තංකරෝ, සර්වසංසාරදුක්ඛයන් කෙලවරකලාවූ; ච
ක්ඛුමා, මසසය දිවැසය පැනැසය බුදුඇසය සමතැසය යන පසැස්
ඇත්තාවූ නොහොත් සිහිදුමෑදුමොලොක්වූ දියමෙනෙරියමල්සෙ
ගීන් දම්ණියප්‍රසාධික සුනිලවණ්වූ අක්ෂිරොමයෙන්හා ඊට අනතු
රුව මෑදුසිනිඳුපිරිසිදු කිහිනිරිමල් රංවන්පැහැයෙන් ඊට අනතුරු
ව මෑදුසිනිඳුරතිඳුගොව්වන් පැවැතිරත්පැහැසීන්හා මධ්‍යයෙහි මෑ
දුසිනිඳුපිරිසිඳුරුක්පෙලන ඇටසෙසින් කළුපැහැසීන්හා එවටාසුප
රිසුද්ධදම්ණියප්‍රසාදකවූ දගවත්තරුසේසින් සුදුපැහැසින්හා යන
මෙස්පැහැසීන් බබලන්නාවූ චතුරාංගසමන්විත ඝණාන්ධකාරයෙ
හිදු යොදුන්ප්‍රමානඝණබහලවූ විදුරුපර්වත විනිවිද දිවාරාත්‍රියෙහි
සියුම්ප්‍රකෘති මසසද—මේ සක්වලපටන් දසසහශ්‍රලොකධාතුයෙ
හි හැසිරෙන්නාවූ චුතවන්නාවූ උපදනාවූ හීනප්‍රනීතක්ෂුද්‍රස්ථූලවූ
කුසලාකුසලය යථාස්වරූපකර්මප්‍රත්‍යයෙන් සැපදුක් අනුභවකරන්
නාවූ සියළුසත්වයන් නිරවශේසයෙන් දක්නාදිවැසද—අතීතානා
ගත වර්තමානවිෂයවූ සර්වලෞකිකලොකොත්තරවූ ධර්මයන් සර්වා
කාරයෙන් දක්නාවූ පැනැසද—දසසහශ්‍රලොකධාතුයෙහි සත
රාමරසතුන් අල්පරජස්කමහා රජස්කතික්ඛින්ද්‍රිය මුදින්ද්‍රියාදීන්හෙතු
සම්පත්විභාගකොටදක්නාවූ බුදුඇසද—නුදුටුනොදන්නා නො
දතයුතු ඉතිරිදෙයක්නැතිව සර්වධර්මයන් සර්වාකාරයෙන් අවබොධය
කොට සියලලදක්නාවූ සර්වඥතාඥණසංඛ්‍යාතවූ සමතැසය යන මේ
පසැස් ඇත්තාවූ; සත්ථා, ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ; පරිනිබ්බු
තො, සමස්තලෝකප්‍රශස්තාස්වත්ථශ්‍රීමහබොධිද්‍රුමමූලයෙහි ප්‍රථුවීස

මුඤ්ඥාදෙත්ගත අපරාජිතො තතුඞ්ග වජ්‍රාසනාරූඪව සර්වමාරවිජය ගෘහීතාන්තර ප්‍රතිලබ්ධසර්වඥතාඥානයගා සමගසර්වක්ලේශ නිර්වාප නාපථයෙන් පිරිනිව්යෙය; ඉති, මෙසේ; දෑහිනොපෙනු ඉන්ද්‍රාර්චනු සෙකරාඤ්ජිතිඤ්ජාදී සමස්තලොකෙනු වන්දිතපාදාරවින්දනෙනූපසොභි තවූ භගවත් අතීත් සම්‍යක් සම්බුද්ධසර්වඥරාජෝත්තමයානන්වහන්සේ විසින් පෘථිවිමෙරු යුගන්ධර චක්‍රවාට හිමවත්වෘක්ෂසරසරින් සාගර දිව්‍යබ්‍රහ්මනරනාගාදී ඉන්ද්‍රියානින්ද්‍රිය ප්‍රතිබද්ධසර්වසංස්කාර ප්‍රවෘර්ති ධර්මයන්ගේ අනිත්‍යතාව ප්‍රකාසකොට ජාතිජරාව්‍යාධිමරණාදී සියළු සංසාරදුක්දෙම්න්සකලසත්වයන්වෙහෙසන්නාවූ රාගාදිසකලකෙලසයන්නාසා ආර්‍යප්‍රවරශීලසමාදී ප්‍රඥාවිමුක්තිය යන චතුර්ධර්මයන්ගේ අවබොධය ප්‍රතිවෙධය කරණයෙහි දිව්‍යමනුෂ්‍යයන්ගේ උත්සාහා උපදවමින් තමන්වහන්සේ ඒ මේ ආර්‍යප්‍රවරසීලස්කන්ධාදී චතුර්ධර්මයන් අවබොධප්‍රතිවෙධකිරීමෙන් සියළුම සංසාරදුක්නාසා සර්වඥතාඥානයට පැමිණවදලබව ප්‍රකාසකරවදරමින් සම්පජන තීර්ණමාතවූ මේ සප්තසූර්‍යෝද්ගමන සූත්‍රාන්තධර්මදෙසනාව නිමවා වදාළසේක.

නිමි.

ලොකවිනාසයහාඋත්පත්තියදසංක්ෂෙපයෙන් මෙසේදතයුතු.

කෙසේදත්—සංවර්තය සංවර්තස්ථායිය විවර්තය විවර්තස්ථායී යයි කියා
දක්වනලදමෙහි ආපොසංවර්තය තෙජොසංවර්තය වායොසංවර්තයයි කි
යා ත්‍රිවිධවෙත් එය ආභස්සරය සුභකිණ්ණය වෙහප්ඵලය යන මො
වුහු සීමාකොට ඇතිවෙත් ඒ මෙසේ දතයුතු—යම් කලෙක්හි කප
ගින්නෙන් නස්නේද එකල්හි ආභස්සරනම් බඹලොවින්යට ගින්
නෙන් නස්නේය යම්කලෙක්හි කප ජලයෙන්නස්නේද එකල්හි
සුභකිණ්ණනම් බඹලොවින් යට ජලයෙන්නස්නේය යම්කලෙක්හි
වාතයෙන් නසීද එකල්හි වෙහප්ඵලයෙන් යට වාතයෙන් නස්නේ
ය විස්තරවසයෙන්වනාහි එකබුද්ධක්ෂෙත්‍රයක් නසියයිදක්වනලදී-
එහිබුද්ධක්ෂෙත්‍රයනම් ජාතික්ෂෙත්‍රය විසයක්ෂෙත්‍රය ආනක්ෂෙත්‍ර
යයි කියා ත්‍රිවිධවෙත් එහි ජාතික්ෂෙත්‍රය නම් දසදහසක් සක්වල
කෙලවරකොට ඇතිවේ—තථාගතයන්වහන්සේගේ ප්‍රතිසන්ධිග්‍ර
හණාදීයෙහි එයකම්පාවේ ආනාක්ෂෙත්‍රයනම් කෙලලක්ෂයක් සක්
වලකෙලවරකොට ඇතිවන්නේය.

එහි රතනසූත්‍රය ඛන්ධපරිත්තය ධජග්ගපරිත්තය ආටානාටියපරි
ත්තය මොරපරිත්තය යන මේ පිරිත්ධර්මයන්ගේආනුභාව පවතින්
නේය විෂයක්ෂෙත්‍රයනම් අනන්තාපරිමාණවූ යම්ලොකධාතුවෙ
ක්හි යමක්කැමතිවනලද්දේනම් එයතත්වූපරිද්දෙන්දන්නේය මෙ
සේත්‍රිවිධ ක්ෂෙත්‍රයන් අතුරෙන් එක්ආනක්ෂෙත්‍රයක් විනාසවන්
නේය එය විනාසවනකල්හි ජාතික්ෂෙත්‍රයද විනාසවන්නේමය වි
නාසවනකල්හිද එකටම විනාසවන්නේය හටගැණීමද එකටමහ
ටගන්නේය ඒ ක්ෂෙත්‍රයාගේ විනාසයහා හටගැණීමද මෙසේ ද
තයුතු—හේකෙසේදයත් යම්කලෙක්හි කප ගින්නෙන්නස්නේද
එකල්හි පලමුකොට කල්පවිනාසක මහාමේඝයනැගීමෙන් කෙල
ලක්ෂයක් සක්වලෙහි මහත්වර්ෂාවස්නේය ඒ දැක මනුෂ්‍යයෝ සතුටු
සිත්ඇතිව ධාන්‍යයන් ගෙණවුත්වපුරන්නාහුය ගවයො කාපියත
පමනගොයම්වූකල ගද්‍රභ රාවයරැව්දෙමින් එකබිඳුවකුදු නොවැ
ටේ මේඝය අන්තර්ධානවෙයි ඒ එය සඳහා භාග්‍යවතුන්වහන්සේවි
සින් මෙසේ වදාරණලදී—"හොතිඛො සො භික්ඛවෙ සමයොයංබ
හූනිවස්සානි බහූනිවස්සසතානි බහූනිවස්සසහස්සානි දෙවො න
වස්සතීති"—මෙහිභාවය මහණෙනි බොහෝඅදුරුදුසියදහස්ගණන්
වර්ෂාවනොවස්නේය ඒ මේ කාලය මතු ඇතිවන්නේය එකත්‍ර වර්ෂා
වෙන්ජීවත්වනසත්වයො කලුරියකොට බ්‍රහ්මලොකයෙහි උපදිත්
පුෂ්ප පලුපයන්ගෙන් ජීවත්වන්නාවූ දෙවතාවෝද මිය බඹලොව

උපදිත් මෙසේ දීර්ඝකාලයක් ඉක්මගියකල්හි ඒ ඒ තන්හි ජලය විනාසයට යන්නේය එකල්හි ක්‍රමයෙන් මස්කෑසුප් ආදීහුද කාලක්‍රියාකොට බඹලොව උපදිත් සත්හිරුපහළවූකල්හි අපායගාමීවූ නිරිසත්වයොද විනාසවන්නේය ධ්‍යානයක්නැතිව බඹලොව උපදිනා එකමසත්වයෙකුදු නොවෙති මේසත්වයන් අතුරෙන් වනාහී සමහරු දුර්භික්‍ෂයෙන් පෙලෙන්නාහුය සමහරුධ්‍යානාධිගමයට අභව්‍යවෙති ඔහුකෙසේ බඹලොව උපදිත්ද යත්-දෙවුලොවදී ලබනලද ධ්‍යානවශයෙන් උපදින්නාහුවෙත් කල්පවිනාසයට හවුරුදු ලක්‍ෂයක් ඇවෑමෙන් කල්පොඝාතය වන්නේයයි ලෝකව්‍යූහනම් කාමාවචරදෙවතාවෝ හිසකේමුදා විසුරුවනලදුව හැඬුම්මුහුණු ඇතිව දෙයතින්පිසනලදකඳුළු ඇතිව රතුවස්ත්‍රාපැලඳ ඉතාමවිරූපවෙසධාරීව මෙසේදනව්වින් මනුෂ්‍යපථයෙහී හැසිරෙත්-නිදුකාණෙනි මෙයින් හවුරුදු ලක්‍ෂයකගේ ඇවෑමෙන් කල්පවිනාසයවන්නේය මේ ලෝකයද විනාසවන්නේය මහාසමුද්‍රයද වියලෙන්නේය මේ මහාප්‍රථිවියද මහාමේරුපර්වතරාජයාද දා විනාසවන්නාහුය බ්‍රහ්මලෝකයදක්වාම ලෝකවිනාසය වන්නේය එබැවින් පින්වත්නි මෛත්‍රීකාරුණා මුදිතා උපෙක්‍ෂාවඩවූ මෑනියන්ට උපස්ථානකරවූ පියානන්ට උපස්ථානකරවූ කුලදෙටුවන්ට උපස්ථානකරවූ යයි කියන්නාහු වෙ ඔවුන්ගේ ඒ වචනය අසා මනුෂ්‍යයෝද භූමාටුදෙවියෝද බොහෝ සෙයින් සන්වේගඇතිව ඔවුනොවුන් මෘදුසිත්ඇතිව මෛත්‍රී ආදී පින්කොට දෙවුලොව උපදිත් එහිදී දිවබොජුන් අනුභවකොට වායෝකසිණ පරිකර්මයකොට ධ්‍යානලබත් එයින් අන්‍යවූවෝ වනාහී අපරාපර්‍ය වෙදනීය කර්මයෙන් දෙවුලොව උපදිත්-අපරාපර්‍යවෙදනීය කර්මරහිතවූ සත්වයෙක්නම් සසරනැත්තේය ඒ දෙවියෝද එහිදී ධ්‍යානලබන්නාහුය මෙසේ දෙවුලොවදී ලබනලද ධ්‍යානවශයෙන් සියල්ලෝම බ්‍රහ්මලෝකයෙහි උපදින්නාහුවෙත් වස්සූපච්ඡේදයෙහිපටන් දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් දෙවෙනිසූර්යයෙක් පහළවන්නේය ඒ සඳහා භාග්‍යවතුන්වහන්සේවිසින් මෙසේවදාරණලදී.

"හොතිඛො සො භික්ඛවෙ සමයොයං කදාචි කරහචි දීඝස්සඅද්ධුනො අච්චයෙන දුතියොසුරියො පාතුභවති දුතියස්ස භික්ඛවෙ සුරියස්ස පාතුභාවා යාතාකුන්නදියො—පෙ-මෙහිභාවය දෙවෙනිසූර්‍යයා පහළවූකල්හිවනාහි රාත්‍රිපරිච්ඡේදයෙක්ද දිවාපරිච්ඡේදයෙක්ද නොපෙණේ එක්සූර්‍යයෙක් පහළවේ එක්සූර්‍යයෙක්වනාහි හස්තංගතවේ අවිච්ඡින්නසූර්‍යසන්තාපයෙන්ම ලෝකය ඇතිවන්නේය ප්‍රකෘති සූර්‍යතෙමේම සූර්‍ය දිව්‍යපුත්‍රනම් වන්නේය කල්පවිනාසක සූර්‍යයෙක් නැත්තේය පළමුසූර්‍යයාඇතිකල්හි ආකාශයෙහි වලාපටලද ධූමරේඛාද ඇතිවෙත් නැවතපහවූ ධූමවලාහක ඇතිකල්

හි කැඩපතක්මෙන් නිර්මලවූ ආකාශය ඇතිවන්නේය එකල්හි පචමහාගඟාවන්හැර සෙසුකුඩාගඟාදීන් අතුරෙහි ජලය විනාසවන්නේය නැවත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් තුන්වෙනිසූර්ය්‍යයෙක් පහළවන්නේය යම් ඒ සූර්ය්‍යදිව්‍යරාජයාගේ පහළවීම හෙතුකොටගෙණ ගඟාචිරවතී සරභූ මහී යන පචමහාගඟාවෝද විනාසවන්නාහුය නැවත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් සතරවෙනි සූර්ය්‍යදිව්‍යරාජයෙක් පහළවන්නේය යම් ඒ සූර්ය්‍යදිව්‍යරාජයාගේ පහළවීම හෙතුකොටගෙණ හිමාලවනයෙහි මහාගඟාවන් හටගන්නාවූ සීහප්‍රපාතය හංසප්‍රපාතය කණ්ණමුඬ රථකාර අනොතත්ත ඡද්දන්ත කුණාල යනමේ සප්තමහාවිල් සිඳී විනාසවන්නාහුය නැවත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් පස්වෙනිසූර්ය්‍යයෙක් පහළවන්නේය යම් ඒ සූර්ය්‍යදිව්‍යරාජයාගේ පහළවීමහෙතුකොටගෙණ ක්‍රමයෙන් මහාසමුද්‍රයෙහි ජලය සිඳී ඇඟිලිපුරුකක් තෙමනපමනකුදු ජලය නොතිබෙයි නැවතද දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් සවෙනි සූර්ය්‍යදිව්‍යරාජයෙක් පහළවන්නේය යම් ඒ සූර්ය්‍යදිව්‍යරාජයාගේ පහළවීමහෙතුකොටගෙණ සියළුසක්වල එකට ධූමාකුලවන්නේය මෙසේ කෙලලක්‍ෂයක්සක්වලවල්ද එපරිද්දෙන් අවිච්ඡින්නවූ සූර්ය්‍යසන්තාපයෙන් ධූමාකුලවන්නේය නැවත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් සත්වෙනි සූර්ය්‍යයෙක් පහළවන්නේය යම් ඒසත්වෙනි සූර්ය්‍යයාගේ පහලවීමහෙතුකොටගෙණ කෙලලක්‍ෂයක්සක්වලවල් සහිතකොට සියළුසක්වල එකමවග්නිජ්වාලාවක් ඇතිවන්නේය එකල්හි යොදුන්සියගණන් ගල්කුලු මහාමේරුපර්වතයෙන් ඉපිළවැටී ආකාසයෙහිම අන්තර්ධානවන්නාහුවෙත් තවද ඒ වග්නිජ්වාලාව නැගී චාතුර්මහාරාජිකදෙව්ලොවද ගිණිගන්නේය එහි රත්නවිමානාදී අනේකවිමානයන්දවා තව්තිසාභවනයද ගිණිගණ්නේය මේක්‍රමයෙන් ප්‍රථමධ්‍යාන භූමිය දක්වා ගිණිගන්නේය එහි ත්‍රිවිධබ්‍රහ්මලෝකයන්දවා ආභස්සරබ්‍රහ්මලෝකයදක්වා ගිණිජ්වාලාවපැතිරසිටියී එකල්හි යම්තාක් සංස්කාරගතවූ යම්කිසිවක් ඇතිවන්නේද ඒ තාක් ගිණිජ්වාලාව නොනිමෙන්නේය සියලුසංස්කාරයන්ගේ ක්‍ෂයවීමවතාහි ගිතෙල් දැගියගිණිසුලක්මෙන් අලුඅඟුරුපමනවත් නැතිව නිවීයන්නේය ආකාසයෙන්යට සහ මත්තෙහිද එකමමහාන්ධකාරයක් ඇතිව නැවත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් මහාමේඝයනැගී පළමුකොටම සියුම්සියුම් වර්ෂාවවැසක්‍රමයෙන් වැඩී ඇඹුලදඬු හීදඬු පුවක්තුරු තල්ගස් ප්‍රමානධාරාවන්ගෙන්යුත් වර්ෂාව වසිමින් කෙලලක්‍ෂයක් සක්වලවල්හී දැගිය සියළුතැන්පිරී මේඝය අන්තර්ධානවන්නේය ඒජලයෙහි උඩද සරසද වාතයනැගී ඝණකොට වියලී මෙසේ අනන්ත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් ජලය වියලී ක්‍ෂයවේ

මින් ක්‍රමයෙන් පාත්බැස පළමු ශක්‍රභවනය පිහිටිතැනට ලන්වේ
එකල පළමු බඹලොවපිහිටිතැන් බඹලොවපහලවේ දෙව්ලොවපි
හිටිතැන් දෙව්ලොවපහළවේ එකල ආභස්සරාදී මතුමතු බඹතල
වලවසන බ්‍රහ්මරාජයන්අතුරෙන් ඇතම්කෙනෙක් ආයුක්‍ෂයවීමෙ
න්හෝ පුණ්‍යක්‍ෂයවීමෙන්හෝ එයින්චුතව මහාබ්‍රහ්මය බ්‍රහ්මපුරෝ
හිතය බ්‍රහ්මපාරිසද්‍යය යන ප්‍රථමධ්‍යානතුන්තලයෙහි උපදිත් ඇ
තම්කෙණෙක් පරනෛර්මිතවසවර්ති‍ය තුසිතය යාමය යන සතර
දෙව්ලොව උපදිත් ජලයක්‍රමයෙන් අඩුවෙමින් පළමු පෘථුවිස්ථාණ
යට බටකල්හි මහාවාත්‍ය අතිසයින් බලවත්වෙමින් ඝබරාවක
තුබූ ජලයසෙයින් නැගී දියවටකෙරෙමින් තරඳමින් මිරිකයි එකල
ක්‍ෂයවූ මධුරොධකය දියපිටදැමූ නෙළුම්පොතක්සෙයින් අමාරස
වෙයි එහි මහාබොධිපර්‍ය්‍යඞ්කය පිහිටන ජයභූමිස්ථානය හැමටම ප්‍ර
ථමයෙන්පිහිටයි ලෝකය නස්නාකල හැමටම පසුව නැසෙයි එහි
පූර්වනිමිත්තදක්වන්නාක්මෙන් නෙළුම්පැලයක්හටගණී ඉදින් බුදු
කෙණෙකුන්වහන්සේ ඒ කපඋපදිනාසේක් වීනම් එහි මලෙක්පි
පෙයින් නැතහොත් නොපිපෙයි මේකප එකනටුවේ මල්පසෙක
කිණිකා දිදිපිපිණ එහි පිරිකරපසක්වේ එකල දෙලොස්වන අවි
හනම් බඹලොව් ඇතුළුවූ පචසුඩාවාසබඹලොව අනාගාමි අරහ
න්ත බ්‍රහ්මරාජයෝ තමන්බුඩොත්පාදලකුණුදන්නාසෙයින් නිදු
කානෙති අපිපූර්වනිමිත්තදක්නට යම්හයි-සම්මතකොට ක්‍ෂණයකින්
මුහුලෝ අඳුරුබිඳ බෝමැඩකරාපැමින රන්මල්නෙළුම්මල්හා එහි
පිරිකරපසක් දැක් පසැස්බුදුකෙණෙකුන්වහන්සේ උපදනාසේකැ
යිඋපන්ප්‍රීතිසොම්නසින් දෙයතින්සිවුරුගෙණ පස්දෙනාවහන්සේ
ගේම ගර්භාවක්‍රාන්තිසමය අභිනිෂ්ක්‍රමණය සර්‍වඥතාඥණය ප්‍රති
වෙධ ධර්මචක්‍රය පැවැත්මය යමකප්‍රාතිහාර්‍ය්‍යය දෙවෝරොහණයආ
යුසංඛාරොස්සජ්ජනය පරිනිර්වාණමඞ්ගල්‍යය යන අටතන්හිඳ සහ
ශ්‍රීලෝකධාතුව කම්පනාදි බුඩපේරහරදකුම්හයි ප්‍රීතිවාක්‍යපවත
මින් තමතමන්ගේ පචසුඩාවාසබඹලොවට ගියාහුය-මෙසේ භූමිය
පර්‍යන්. ත්‍රිකොටි සත්විසිලක්‍ෂ තිස්සාරදහසක්යොදුන් මත්තෙහි පිහි
ටි අකනිෂ්ඨකනම් බඹලොවවාසී අරහන්තනම් බ්‍රහ්මරාජ සහස්‍ර
ශ්‍රීලෝකධාතුව හැරිසරාප්‍රභාවයෙන් ඒකාලෝකකෙරෙමින් සිවුරු
ගෙණගොස් බඹලොව්තැබූහ.

එකල සත්තෝත්පත්තියපිණිස ආභස්සරනම් බඹලොවින් බ්‍රහ්ම
රාජයෝ ආයුක්‍ෂයවීමෙන්හෝ පුණ්‍යක්‍ෂයවීමෙන්හෝ චුතව අවුත්
මේමිනිස්ලොව් ඔපපාතිකව උපදිති—එවූහුසවතීයවූ ශරීප්‍රභාවයෙ
න් අඳුරුබිඳ දිලියෙන්නාහා අහසින් යනගමන් ඇත්තාහා ප්‍රීතිසැ

පම ආහාරකොට ඇත්තාහ ස්ත්‍රීපුරුෂයයි ව්‍යවහාරයෙක් නැතිව අසංඛ්‍යායුෂ්කව අනන්තාදීර්ඝකාලයක් වසන්නාහු මධුරතර සුරභි සුගන්ධසමාකීර්ණවූ ප්‍රථිවියෙන් මදක් ඇඟිල්ලෙන්ගෙණ දිවගාලේහ කොට ඉතාමධුරයයි ප්‍රථිවිරසය අනුභවකරන්නාහු සිතලෝභවඩුත් වඩුත් ප්‍රථිවිරසය අන්තර්ධානවිය ඉහසතුකැකුල්වැනි අමාරසවැනි සතුවගීයෙක්පහළවිය හෙදලෝභවඩත්වඩත් අන්තර්ධානව මධුර් රසඇති භද්‍රලතාලියපහළවිය ඒ ද අන්තර්ධානවඔවුන්ගේ කුසල් බලයෙන් කුඩුනැති දැහිනැති මුතුසේ පිරිසිදු මිහිරිසුවඳැති සවයන් ජතහැල් පහළවිය ඒ සවයන්ජතකහැල්ගෙණ පහළවූ මැනික්බ දුන්හිලා මැණික් උදුන්නාගා පිළියෙලවූ දිවබොජුන්වැනි සුවඳ බත් අනුභවකෙරෙමින් අනන්තදීර්ඝකාලයක් වෙසෙති මෙසේ බත් අනුභවකරණකල්හි ජලමලඋපන ඒ ජලමලනික්මීමට කලවහට ගන්නා පළමුකුලුසෙයින් ජල්මලමාගීයබිඳි ඒඒ ස්ත්‍රීපුරුෂලක්‍ෂන වයහටගත්තේය එතැන්පටන් ස්ත්‍රීපුරුෂයයි ව්‍යවහාරවිය අහසින් යන ඉසීයනැතිවිය සඳමෙන් බැබළු ශරීරප්‍රභානැතිවිය මුලුලොව සණාන්ධකාරවිය එකලසණාන්ධකාරයට පැමිණි ප්‍රථමකල්පික මනුෂ බ්‍රහ්මයෝ අහෝ අපි අනුතත අසංඛ්‍ය ආයුෂයවලඳමින් ශරීරප්‍රභාව යෙන් මුලුලොව අඳුරුබිඳ අහසසැරිසරාඑම්හ දැන් අපිකල කල කම්බලවත්නිසායයි කියකියාහඬන්නාහා එකලඔවුන්ගේ පුණ්‍යා නුභාවයෙන් සණාන්ධකාරය විධමනායකරමින් දෙසාලිස්දහසක්යො දුන්මත්තෙහි පනස්යොදුන් හිරුවිමනෙක් පහළවිය ඒ දැක මහත් වූ සුරභාවයදක්වමින් සණාන්ධකාරයදුරුකලේය එයින්මොහු සූර්‍ය හයිනම්තුබූහ-ඒ හිරුවිමන ඉතා දුරුවගියකල්හි පෙරසෙයින් අඳු රටපැමින හිරුසෙයින් තවත් ආලෝකයෙක්පහළවීනම් යහපතැයි සිතූහ-ඔවුන්ගේ සිතහාසමග සඳවිමනපහළවිය ඒ දැක අපගේජන්‍ද සලෙසට පහළවූයේ සඳහුයයිනම්තුබූහ-මෙසේ හිරසඳපහළවූ දවස් හිම ඉදිරිපසුනොවී එකාවිටම මහමේරු චක්‍රවාට හිමවත් පර්වතදිව යින් නොදෙව් සමුද්‍රදෙදෙව්ලොව යන සියලලම මැදින්දිනදෙපෝ දවස්හිම එකවිටපහළවිය කෙසේපහළවීදයත් යම්සේතනබත් ඉ දෙනකල්හි එකවරමබුබුල්නැගීමෙන් එකපියසෙක් හිඨුපඨුපවෙයි එක්පියසෙක්හි මිටිමිටිවේ එක්පියසෙක්හි සමසමවෙයි එපරිදෙන් ඨූපඨූපස්ථානයෙහි නොයෙක් පර්වතකඳුවේ නිනානිනාස්ථාන නොයෙක් සරසින්සමුද්‍රවෙයි සමසමස්ථාන දිවයින්දඹදිව දෙදහ සක්කොදෙව්වෙයි—තවද යථොක්තවූ ඒ ලෝකෝත්පත්තීන්ගේ දනාගැනීමටකරුණුවූ සත්වත්තීාදීන් අතුරෙන්කල්පවිනාසකමහා මෙඝයපටන් ජලුපත්ජෙදයදක්වා මේ එක් අසංඛය සත්වත්තයනම් වේ කල්පවිනාසක ජලොපවෙජ්දයපටන් කෙලලක්‍ෂයක්සක්වල

වල්පිරෙන්නාවූ මහාමෙඝයදක්වා මේ එක්අසංඛ්‍ය සන්වත්තස්ථායී
නම් වේ සම්පත්කර මහාමේඝයපටන් විසිඅනන්තකල්පයක්හුගේ ආ
යු අඩුනොකොට ක්‍රමයෙන් ලොවනැගෙමින් ප්‍රථමකල්පික මානු
සික මහාබ්‍රහ්මයෝ අන්ධකාරයටපැමින හඬමින් හිරසඳමහමෙර
සක්වලගල්පහලවනතැන්දක්වා විවත්තිඅසංඛ්‍යකල්පයනම් වේ-එතැ
න්පටන් හිරසඳ මහමෙර ඇතිව දෙව්ලොව ඇතිව දිවයින් ඇතිව
සක්වලගල්ඇතිව තුන්දහසක්යොදුන් දඹදිවසවාසූදහසක් රාජධා
නි ඇතිව දෙදහසක්ප්‍රදෙශ රාජධානි ඇතිව නොයෙක්සත්ව සමා
කීර්ණව අසංඛ්‍යායුෂ්කවසිටිමිණිසුන්ගේ ආයුක්‍රමයෙන් පිරිහී දසවරු
ෂගතවරෝගදුර්භික්ෂ ශස්ත්‍රාන්තඃ කල්පය යන එකතින් අතුරුකා
පසතුන්නැයි ඉතිරිමිනිසුන් ආයුවැඩී අසංඛ්‍යයටගොස් නැවත ආයු
පිරිහී දසවරුෂගතවෙමින් මෙසේ විසිඅතුරුකපක්ගෙවා මහාකල්
පයනස්නට හවුරුදුලක්ෂයක්තිබියදී විස්තාවිපත්තිකර මහාමේඝය
දක්වා මේ විවත්තස්ථායී අසංඛ්‍යකල්පයනම් වේ යයි දතයුතු-එසින්
වදාලහ-"චත්තාරෝ මෙ භික්ඛවෙ මහාකප්පා කතමේ චත්තාරෝ
සංවට්ටො සංවට්ටට්ඨායී විවට්ටො විවට්ටට්ඨායී ඉමෙඛො භික්ඛවේ
චත්තාරෝමහාකප්පායි".

නිමි.

---

## ඇත්වින්මයි.


ගිහිපැවිදි බොහෝදෙනාට ඉතාප්‍රයෝජනවත් මෙම සන්නාසහි
ත සප්තසූර්යොද්ගමන සූත්‍රය පිටපත් කීපයක් එකතුකිරීමෙන් උ
ගත් කෙනෙකුන්ලවා සුඩකරවාගණ ලෝවැඩසඳහා අපවිසින්
අච්චුගැස්වූනමුත් සර්වඥනුවූ කාටත් නිවැරැදිලෙස යමක්කිරීම අ
මාරුවැඩක්බැවින් මෙහිද ඇතම්තැන වරදතිබෙන්නට පුලුවන්
ඉව් එසේවුවත් මෙහිසූත්‍රය වෙනුමම තිබෙනනිසා සන්නයහා සූත්‍ර
යඑකිනෙකට සමකරබැලීමෙන් යම්දෙසක්තිබුනත් ඒ පහකරගැ
ණීම අමාරුනොවනබැවිනියමු—පූරාණපටන් අතිනතටලිවීමෙන්
බහුලවතිබුනාවූ වරදඑකවිටම පහකිරීමත් අමාරුවැඩකි—එබැ
වින් මෙහි ඇත්තාවූයම්වරදක් ඇතහොත් ඒ ලෝවැසිපණ්ඩිතයන්
විසින් සෝධනයකෙරෙත්වා-ලෝකොත්පත්තිය සඹන්ධවූ ලෝකාවි
නාසයද පහසුවෙන් දැනගැණීම පිණිස භාවසන්නයක්.මෙන් අප
විසින් මෙහි අගටයෙදුවෙමු..

ආර්. ඇස්. සිල්වා-ඩී. සී. සිල්වා-ඇම්. ඇස්.පෙරේරා-යන අපිවිසින්ය.

අලේමුල් අක්ෂරතුන සහ මුද්‍රයනැති පොතක්ලැබුනුවිටක න
ඩුමාගීයට ගෙණයනබව දන්වමි.

තවද-පොත්විකිනීමට ජේ. ඩී. ප්‍රනාදුගේ පොත්සාප්පුවටද ලන්
මිතිපහන්කන්තෝරුවද බාරදුන්බව දන්වමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු